**2020 ඔක්තෝම්බර් මස 06 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව**

**<u>සහභාගිත්වය</u>**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා | ගරු සභාපති |
| කමල් වැල්ලගේ මැතිතුමා | ගරු උප සභාපති |
| ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.ඩබ්. ජගත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ග්‍රේෂන් කෙරම්ණියගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී ලක්ෂ්මි හේමන්තා මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදූර ධර්මදාස මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මහගේ අතුල ප්‍රියන්ත මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ර්.ඉන්ද්‍රා අයිරාංගනි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී.ජී. ආර්. පේෂලා කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එච්. ඉනෝකා ක්‍රිශාන්ති මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| රාහුල ලලිත වික්‍රම මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.එම්. නිලානි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්.එම්.සරත් චන්ද්‍ර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මහගේ චම්පා සුමුදු කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |

- **පන්සිල් සමාදන් විමෙන් අනතුරුව පෙ.ව.9.30 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී**

**( 01 )** **සභා රැස්වීම් වාර්තා සම්මත කිරිම**

**01.01** 2020.09.08 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සම්මත කිරිම

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020.09.08වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සම්මත කිරිම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

2020.09.08 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සම්මත කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පොඩ්ඩක් ඉන්න වාර්තාව සම්මත කිරිම ස්ථිර කරන්න ඉස්සරවෙලා කියන්න. ඔබතුමා ඉදිරිපත් කළ මුකුත් කරුණක් නැහැ. හැබැයි අපිට සිඩී එකක් එවා තිබෙනවා. මෙහි අදාළ වාර්තාවට ගැබ් විය යුතු කරුණු වාර්තාවට ගැබ් වී නැහැ. මේ සිඩී ලබා දෙන්න එපා . අපි සියළුම දෙනා ඉල්ලා සිටිනවා. මොකද මෙහි වැදගත් ලිපිලේඛණ සටහන් වෙලා තිබිය යුතුයි. පෙර පරිදිම එම වාර්තා සකස් කරන්න. මන්ත්‍රීවරු කතා කරන විට දෙවැනි වරට කතා කරන්න එපා එහෙම ක්‍රමවේදයකට යන්න. මා ඉල්ලා සිටිනවා පෙර පරිදිම වාර්තාව සකස් කරන්න කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව අපි පසුගිය සභාවේ සාකච්ඡා කළා. මන්ත්‍රීවරුන්ගේ එකඟත්වය පරිදි තමයි ඔය විදියට කර තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, වැඩ රාජකාරි බහුලයි. කාල වේලාවක් යනවා. නවක මන්ත්‍රීවරු විදියට අපිට දැන ගත යුතු දේවල් බොහෝමයි. සිඩී එකක් අරගෙන ගිහින් අහන්න අපිට ඒ පහසුකම් නැහැ. එමනිසා මේ සභා වාර්තාව සංශිප්ත කරලා මේ සභාවේ දෙපාරක් කතා කරන්න නොදි මේ සිඩී එක නොදි කලින් තිබු සභා වාර්තාවම ලබා දෙන්න කියන ඉල්ලිම කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා පෙර පරිදිම මේ සභා වාර්තාව ලබා දෙන්න කියා. අපි කැමති වුණා තමයි. නමුත් අපිට මෙහි කතාව තෙරුණේ ටිකක් පරක්කු වෙලා. එමනිසා අපිට පෙර පරිදිම සභා වාර්තාව ලබා දෙන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඇත්තටම මේ සිඩී එක ප්‍රතික්ෂේප කරන්න වෙලා තිබෙනවා. මොකද එය අහන්න වුණේ නැහැ. මේ සභා වාර්තා පොත ගෙනගියහොත් මා නම් එය කියවනවා. සිඩී එක අහන්න ගෙදර නැහැ. මා මේ පොත නම් බලනවා. මා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා සිඩී එක ලබා දෙන්න එපා. පොත ලබා දෙන්න. එය ඉතා වටිනවා. යම්කිසි දෙයකට අපි විරෝධතාවයක් දැක්වුවහොත් අපිට ගමකට ගිහින් පෙන්වන්න තිබෙන්නේ සභා වාර්තාව. සිඩී එක බලන්න කියන්න බැහැ. මේ පොතේ වාර්තාව පෙන්විය හැකියි. අපි මෙයට විරුද්ධ වෙලා තිබෙනවා කියා. මොකද අපි නවක මන්ත්‍රීවරු. කවුරු හරි කිවුවොත් ඕක අයිරාංගනී තමයි කිවුවේ කියා. එය අයිරාංගනි නොකළ බවට කියන්න සිඩී එක පෙන්වන්න බැහැ. සිඩී බලන්නේ නැහැ කවුරුවත් ගමේ. වාර්තාව ලබා දෙන ලෙස කාරුණාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

වාර්තාව සංශිප්ත කිරිම සඳහා මෙහිදි අපිට වාර්තාවේදි වැදගත් වෙන්නේ යෝජනාව සහ යෝජනාවේ ස්ථිරතාවය පිළිබඳ තින්දුව පමණයි. කතා කිරිමේ අන්තර්ගතය තේරුමක් නැහැ කියා මිට කලින් තිබුණ වාර්තා 1933 සිට තිබුණ සභා වාර්තා පදනම් කරගෙන එය මේ මන්ත්‍රීවරුන්ට පෙන්වා ඒ වාර්තා සියල්ලම බලා තමයි ඔබතුමලා එකඟතාවයට ආවේ. සිඩී එකෙන් සම්පූර්ණ වාර්තාව ලබා දෙන්නත් ඒ වගේම සංශිප්ත වාර්තාව ලිඛිත වශයෙන් වාර්තා කරන්නත්. ඒක තමයි අපි කළේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමා යම් දෙයක තේරුමක් මන්ත්‍රීවරුන්ට පැමිණි පසු අපි එය සාධාරණීකරණය කර මොනවා හරි ක්‍රමවේදයකට යන්න වෙනවා. එමනිසා තමයි ඉදිරිපත් කළේ. ඒ සිඩී එක කල් පවතින්නෙත් නැහැ. එතකොට සභා වාර්තාවක් මේවා කළාම එක තිබෙනවා. ඔබතුමාට වරදක් කියනවා නෙමෙ. අපි කියන්නේ මෙය සංශෝධනය කරලා අර විදියට යන්න කියලා. එකයි අපි ඉල්ලා සිටින්නේ. ඔබතුමා යෝජනාවක් ගෙනවා. අධ්‍යයනය කරන් වේලාවකුත් නැහැ. අද තමයි අධ්‍යනය කළේ. එහෙම යනකොට තමයි මේ මන්ත්‍රීවරුන්ට තෙරුණේ. නවක මන්ත්‍රීවරු ගොඩක් ඉන්නේ. මේ ගොල්ලන්ට ඒ වාර්තාවේ වැදගත්කම තේරිලා තිබෙන්නේ. එතකොට අපි ඉල්ලා සිටිනවා ඔබතුමාගෙන් මෙය සංශෝධනය කරලා පෙර පරිදි යන්න කියලා. එකයි අපි කියන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මන්ත්‍රීවරුන්ගේ අදහස කුමක්ද ?

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ සිඩී පටිය ලබා දිමට වඩා මා හිතනවා සභා වාර්තා ලබා දීමේදි යම්කිසි වරදක් තිබෙනවා නම් එය බලා නිවැරදි කිරිමේ අවස්ථාව තිබෙනවා. ඊළඟ සභාවේදි . සභා වාර්තා බලා එය නිවැරදි කිරිමේ අවස්ථාව තිබෙනවා ඊළග සභාවේදි. මේ සිඩී පටිය අපි නිතරම අහන්න ඕන. මෙය වාර්තාව වගේ නෙමේ ගරු සභාපතිතුමනි, මේ වාර්තාව මොකක් හරි වැරද්දක් තිබෙනවානම් අපිට දෙපාරක් හරි තුන්පාරක් හරි බලන්න පුළුවන් . මෙය නැවත නැවත ඇසිමට මන්ත්‍රිවරුන්ට බැහැ. මටනම් බැහැ. මා ඉතාමත් කාර්ය බහුලයි. මෙය අපිට රට හරි බලන්න පුළුවන්. මේ වාර්තාව අරගෙන ගිහින්. මන්ත්‍රිවරුන්ට කතා කිරිමේ යම්කිසි වේලාවක් ලබා දුන්නා නම් මා හිතනවා මිට වඩා හොඳයි කියා. මන්ත්‍රිවරු කතා කරන කොට යම්කිසි වේලාවක් ලබා දෙන්න. ඒ යම්කිසි කාලයක් ලබා දෙන්න. නමුත් මේ සිඩී තැටිය මා හිතන්නේ නැහැ සාර්ථක වෙයි කියා. මන්ත්‍රිවරුන්ට මෙය නිතරම අසා ලබා දීමේ ගැටළුවක් එයි.  අපි මන්ත්‍රිවරු මේ සභාව නියෝජනය කරනවා වගේම කාල වේලාවක් වෙන්කර ගන්න වෙනවාමයි මෙය අහන්න. සාමාන්‍යයෙන් සභා වාර්තාව දවස් දෙකකදි හරි තුනකදි හරි කියවා බලන්න පුළුවන්. එමනිසා මා ඉල්ලිමක් කරනවා ගරු සභාපතිතුමාගෙන් මේ සිඩී තැටිය ලබා දිමෙන් මන්ත්‍රිවරුන්ට හරියට සවන් දීමට හැකියාවක් නැති වෙයි. මා නැවත වරක් ඉල්ලා සිටිනවා සභා වාර්තාව ලබා දීමට කටයුතු කරන්න කියා. එය මන්ත්‍රිවරුන්ට ලැබෙන අයිතියක්. එය ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මේ සම්බන්ධයෙන් කියන්න ඕනේ. මෙය ඇත්තටම අපි දියුණුම තාක්ෂණ ක්‍රමවේදය භාවිතා කරලා මන්ත්‍රිවරුන්ට සම්පූර්ණ මේ රැස්වීම් ශාලාවේ සිදුවන කටහඩ පටිගත වු සම්පූර්ණ සිඩී තැටියකුත් ඒ වගේම ලිඛිත කර තිබෙනවා යෝජනාවත් , එය ස්ථිර කිරිමත් , ඒ ඡන්දය මන්ත්‍රිවරුන් ප්‍රකාශ කළේ කොයි ආකාරයෙන්ද කියන ඒ කොටස තමයි ඇත්තටම වැදගත් වෙන්නේ පරිපාලනයට. සංශෝධනය කරන්න අවශ්‍ය නැහැ. තමන් කියූ දෙය තමයි ටේප් එකේ හම්බ වෙන්නේ. මා එදා මෙය කිවුවේ නැහැ කියන්න හම්බ වෙන්නේ නැහැ. ටෙප් එකම හම්බ වෙනවා. නමුත් සමස්ත මන්ත්‍රි මණ්ඩලයේම ඉල්ලිම පරිදි වාර්තාව ලබා දිම සඳහා සති දෙකකට මේ සභාව කල් තියනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ඒ දුන්න තීරණය හරි වැරදියි. මන්ත්‍රිවරුන්ගේ අයිතියට මන්ත්‍රිවරු කතා කරනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මන්ත්‍රිතුමා මන්ත්‍රිතුමා මෙච්චර වෙලා ඉල්ලුවේ වාර්තාවනේ. වාර්තාව දෙන්න තින්දු කළා. වාර්තාව මා සති දෙකකින් දෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

කියන දේ පොඩ්ඩක් තේරුම් ගන්න. නැහැ සභාපතිතුමා පොඩ්ඩක් අහන්න මේ කියනදේ. අපිට තිබෙන ගැටළුවක් නිසා අපි ඉදිරිපත් කළා. මේ සභාව කල් දැමිම ගැන නෙමේ අපි කතා කරන්නේ.  ඒ සම්බන්ධව ඉදිරියේදි තීරණයක් ගෙන ඒ අනුව කටයුතු කිරිම ඔබතුමාගේ

යුතුකමක්. නැතිනම් අපිට ඉල්ලන්න තිබුණා ඡන්දයක්. ඡන්දෙන් එහෙම වෙන්නේ නැහැ. අපි ඔබතුමාට අපහසුතාවයකට පත් කරන්නේ නැහැ. අපහසුතාවයක් තිබෙන නිසා තමයි මේක කියන්නේ. ඔබතුමා ඒ අධිමානසිකත්වය මත කටයුතු කරන්න එපා . මොකද ඔබතුමාට අපි ගොඩක් සහායෝගය දෙනවා මේ හැම දෙයකටම ඇවිත්. විපක්ෂයේ මන්ත්‍රීවරුන් කණ්ඩායම. නමුත් අපි සියළු දෙයට සහායෝගය දෙනවා. ඔහොම යන්න එපා. සාධාරණ හේතු බලා ලබන සභා වාර්තාවේ සිට එහෙම කරන්න. එකයි අපි කියන්නේ. අපි නැතුව ඔබතුමාට ඇඟිල්ල දික් කරනවා නෙමේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, කෙන්ති ගන්න එපා. අපි කිවුවේ සාධාරණයක්. වැඩ කරගෙන යාමේ අපහසුතාවයක් තිබෙනවා සිඩී එක නිසා. ඔබකුමා මේ සභා වාරේ මෙහෙම යන්. ඊළඟ සභා වාරේ සිට මෙහෙම කරගෙන යන්න. මොකද හැමෝම නිවාඩු දමාගෙන මේ සභාවට එන්නේ. කාර්ය බහුලත්වයක් තිබෙන්නේ. ඔබතුමා නැවත මේ සභාව කැඳවනා කිවුවාම නැවත එන්න ඕනේ. ඔබතුමා කේන්ති ගන්න එපා. ඔබතුමාට හරියට කේන්ති එනවා. කේන්ති අරගෙන වැඩ කරන්න බැහැ. මන්ත්‍රීවරුන්ට ඇහුම් කන් දෙන්න ඕන. අපි හැම වේලාවේම සහායෝගය දෙනවා. එමනිසා සභාව කරගෙන යන්න. ලබන සභාවේ සිට එම සභා වාර්තා හදන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

හරි දැන් කතා කරන්න දෙයක් නැහැ. මා කිසිම කේන්ති යාමක් නෙමේ. මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම තිබුනේ මෙය වාර්තාවක් වශයෙන් දෙන්න කියා. අපි නවීන තාක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරමින් පසුගිය සභාවේ සියළුම මන්ත්‍රීවරුන්ගේ එකඟත්වය පරිදි සමස්ත සභාවේ කතාවම සිඩී තැටියකට යොදලා ඒ වගේම යෝජනාවත් ස්ථිර කිරිමත් , මන්ත්‍රීවරුන්ගේ ඡන්දය ප්‍රකාශ කිරිම යන කාරණා ටික ඇතුළත් කරලා සංශිප්ත වාර්තාවක් ඇතුළත් කළා. එම ලිඛිත කිරිම මඟින් මෙවර වාර්තාව පිටු 33යි. පසුගිය මාසයට ඉස්සෙල්ලා මාසයේ වාර්තාව පිටු 140 යි. ඇත්ත වශයෙන්ම එක පැත්තකින් නගර සභාව පැත්තෙන් ආර්ථික ලාභයක් ඇති වෙනවා. 21කුට තව පිටු 100 ගණනේ. පිටු 100 ගණනේ ඡායා පිටපත් විසි එක්දෙනෙකුට 2100ක් ඕනේ. ඊට අමතරව අපි යැවිය යුතුයි පළාත් පලාන සහකාර කොමසාරිස් කාර්යාලයට, පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට , පළාත් පාලන දෙපාර්තමේන්තුවට යවන්න ඕනේ. එවත් එක්කම බලන විට ඡායා පිටපත් පෙට්ටි තුන බැගින් හැම සභාවකම වගේ අපි වියදම් කර තිබෙනවා. මේ පාර කරපු ක්‍රමය අනුව අපිට වාර්තාවට ගිහින් තිබෙන්නේ ඡායා පිටපත් පැකට් එකක ප්‍රමාණයක් පමණයි. සිඩී එකකට අපිට ගියේ රු.20ක් පමණයි. දැන් ඔයාගේ කතාව ඇහුවානේ. දැන් මාගේ කතාව අහගෙන ඉන්න. පස්සේ ඔනදෙයක් . රු. 20 යි . රු.20 බැලුවොත් එහෙම බොහොම අඩු වියදමක් යන්නේ. ඉතිං බොරුවට මෙහි කොළ පුරවනවා විතරයි වෙන්නේ. මෙතැන බොරුවට කතා කරනවා . සමහර වේලාවට 21ම කතා කරනවා. මේ සම්බන්ධව මා දැක්කා මෙහි දුර්වලතාවය. මීට ඉහත සභා වාර්තා ගත්තාම . දැනට අපිට පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබෙන උපදෙස් අනුව. සභා වාර්තා ඉතාමත් සංශිප්ත කරන්න කියා. සභා වාර්තාව කොළ 20ට වැඩියෙන් තිබෙන සභා වාර්තාවක් කියන්නේ ඉතා අසමත් වූ සභා වාර්තාවක් කියා තමයි දෙපාර්තමේන්තුව දකින්නේ. එමනිසා මෙය නියම අනුව කර ගැනීම සඳහා

තමයි මේ යෝජනාව ඉදිරිපත් කළේ. සමස්ත සභාවේම සිඩී පටියක් ලබා දෙනවා. ඒ වගේම සංශිප්තය පමණක් ඇතුළත් කරනවා. ඉතිං තමුන්නාසේලා ඉල්ලපු දේ මා දෙන්න නම් දැන් මේ මොහොතේ ඉක්මනට දෙන්න බැහැ. ඒක තමයි සති දෙකකට කල් තිබ්බේ. වාර්තාව දීලා සභාව පටන් ගන්නම්. ඒකේ ප්‍රශ්නයක් නැහැ මට. එක කිසිම ගැටළුවක් නැහැ මට. ඉල්ලීමට එකඟ වුනා මිස කාගේවත් අධි මානසිකත්වය සමහර අයට හිතන විදියටවත් නෙමේ. මොඩයාට සමහර වේලාවට හිතෙනවා. ඉතිං එමනිසා තමයි කියන්නේ. තව සති දෙකකින් මෙය ඉෂ්ඨ කරලා වැඩය පටන් ගන්න කියන්නේ . එහෙම කළාම තමයි තමුන්නාසේලා මේ කතාව කියන්නේ. එම ඉල්ලීමට මා එකඟවෙලා. එකඟවෙලා මා එය දෙන්නම්. කිසි ප්‍රශ්නයක් නැහැ. එහෙමනම් සභා වාර්තාව මුලින්ම ස්ථිර කරන්න. දැන් යෝජනා කළා ධර්මදාස මන්ත්‍රීතුමා. යෝජනාව ස්ථිර කරන්න. කතා කරන්න එපා දැන්. යෝජනාව ස්ථිර කරන්න. වාර්තාව කලින් ලබා දීපු විදියටම ලබා දෙන්න අපි තින්දු කරනවා. මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා මේ වාර්තාව මෙච්චර ලොකු කරන්නේ නැතුව අවශ්‍ය දෙයකට පමණක් කතා කරන්න. කලින් මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා එක ප්‍රශ්නයකට එක පක්ෂයක එක මන්ත්‍රීවරයෙක් කතා කළානම් හරි. හැම ප්‍රශ්නයකටම මෙතැන හැම මන්ත්‍රීතුමා නැගිටලා මෙතැන කතා කරන්න ගියාම පිටු 150ක් 200 ක් හදනවා කියන්නේ කිසිම තේරුමක් නැති වැඩක්. නමුත් මේ පිටු 150ක් තිබෙන දේ පිටු 33කින් අඩු කර තිබෙනවා. සංශිප්ත කර තිබෙනවා. නගර සභාවට වැදගත් වෙන්නේ යෝජනාව තිබෙනවා. යෝජනාව ස්ථිර වෙලා තිබෙනවාද , යෝජනාව දිනලා තිබෙනවාද ? පරාද වෙලා තිබෙනවාද කියන කාරණාව පමණයි. නිලධාරීන්ට ඉතුරු වැඩ ටික කරගෙන යන්න පුළුවන්. අපි කතා කරන්නේ මොනවාද කියන එක ඇතුළත් කිරීම ඇත්තටම ඵලක් නැහැ. අපි කතා කරන දේවල් මාධ්‍ය මඟින් පළ වෙනවා. ඒ වගේම සිඩී එක තිබෙනවා. තමුන්නාසේලාට ඕන වේලාවක දමන්න පුළුවන්. මෙය ඕනනම් කතාව විතරක් නෙමේ. වීඩියෝ එක වීඩියෝ වෙනවා. එකත් එක්කම දෙන්න පුළුවන්. මුළු සභාවම දෙන්න පුළුවන් මිනිසුන්ට ගෙදර දාලා බල බල ඉන්න කියා. ඒ වගේම සිඩී අහන්න නැහැ කියනවා නම් අපි ඒවා අහන්න ඒ ටිකක් අරගෙන දෙන්න ලේකම්තුමිය සමඟ කතා කළා. සිඩී අහන්න ඒවා අරගෙන දී අපේ ඉන්වෙන්ට්‍රි වලට දමා මන්ත්‍රික අවසන් වෘ යනවිට ඒවා නැවත අපේ ගබඩාවට භාරදී යන ක්‍රමවේදයක් ඇති කරන්න පුළුවන්. එහෙම කළත් ලාභයි කියා පෙනෙනවා. මොකද සිඩී එකට යන මුදලත් හැමදාම කොළ පැකට් වලට යන මුදලත් බැලුවාම. කොළ පැකට් 1000 ඒවා 4ක් යනවා. 500 වගේ එන 1000 වගේ ඒවා 4ක් යනවා. මේ තේරුම් ගන්න. එකක් අපේ නිලධාරීන් ඔක්කොම ලියන්න ඕන. ඊළඟට නිලධාරීන් සියල්ලම මුද්‍රණය කරන්න ඕන. ඒවා බඳින්න ඕන. මේ සියල්ලම අපේ නිලධාරීන්ට වැඩක් කරන්න තියෙන වේලාව තමයි නැති වෙන්නේ. ඉතිං එය කාර්යක්ෂම කිරීම සඳහා තමයි මේ ක්‍රමය අපි යෝජනා කළේ. ඒ යෝජනා කිරීමට මන්ත්‍රීවරුන්ගේ එදා එකඟත්වය තිබුණා. අද එකඟත්වය නැතිනම් ඉදිරියට එහෙම කරන්න. මෙකේ සංශෝධන තිබෙනවාද ?

<u>ගරු නගර සභා මන්ත්‍රී එච් ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, 17 පිටුවේ 05.04 ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවියගේ යෝජනාව මා ස්ථිර කරනු ලැබුවේ. එම යෝජනාව ස්ථිර කරනු ලැබුවේ මා. එහි තීරණයේත් මා කතා කරනු ලැබුවේ. එහි තීරණයේත් නම වැටී තිබෙන්නේ රුචිනි පේෂලා මන්ත්‍රීතුමියගේ නම.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එක වෙනස් කරන්න. තවත් සංශෝධන තිබෙනවාද? එසේ නම් එම සංශෝධන වලට යටත්ව අනුමත වුණා සේ සලකනවා.

**තීරණය**

2020.09.08 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඉහත සඳහන් සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

**( 02)** සභාපතිවරයා විසින් නිකුත් කරන විශේෂ නිවේදන **ඇත.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගරයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සිදු කරනු ලබන සියළුම සංවර්ධන ක්‍රියා පිළිබඳ රැස්වීමක් සිකුරාදා ( 09 ) සවස 2.00 ට රැස්වීමක් තිබෙනවා. මහජන නියෝජිතයන් තමන්ගේ කොට්ඨාශය තුළ තමන්ගේ කාරණා සහ මොනවා හරි දෙන්න තිබෙනවා නම් ඒ අදාළ ලැයිස්තු සහ ඉදිරිපත් කරනවා. යම් සංශෝධනයක් තිබෙනවා නම් ඉදිරිපත් කරන්න අවස්ථාව තිබෙනවා. ඒ කතා කරන්න තිබෙනවා අවශ්‍යා කටයුතු සිදු කරන්න කියා ඉල්ලා සිටිනවා. සිකුරාදා 2.00ට රැස්වීම තිබෙනවා එය නිවේදනයක් වශයෙන් යොමු කරනවා. මා හිතන්නේ ප්‍රාදේශිය ලේකම් ලිඛිතව ලිපියක් එවයි.

**තීරණය -**

අම්බලන්ගොඩ නගරයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සිදු කරනු ලබන සියළුම සංවර්ධන ක්‍රියා පිළිබඳ රැස්වීම 2020.10.09 දින ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ පැවැත්වෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**( 03)** ලැබී ඇති පැමිණිලි , පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරිම

**03.01 2020.09.12 දින බලපිටිය මූලික රෝහලේ පැවති ශ්‍රමදාන වැඩසටහන සඳහා දායකත්වය ලබාදීම වෙනුවෙන් ස්තූතිය පුදකර එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

බලපිටිය මූලික රෝහලේ භූමිය තුළ හඳුනාගත් ස්ථානයන්හි ශ්‍රමදාන වැඩ සටහනක් සිදු කිරීමට අප ආයතනය මඟින් තීරණය කල අතර , එහිදී පහත අරමුණු සාක්ෂාත්කර ගැනීම උදෙසා 2020 සැප්තැම්බර් 12 වන දින ශ්‍රමදාන වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මකවන්නට විය.

- ඩෙංගු මදුරුවන් බෝවීමේ අවධානම ඇති ස්ථානයන්හි ( කාණු පද්ධතිය ) පවතින අඩුපාඩුවක් සකස් කිරීම
- රෝහල තුළ අපහරණය කර තැනින් තැන ගොඩගසා ඇති කොටස් ‘’ 5S’’ ක්‍රමයට ඉවත්කර ගැනීම.
- උද්‍යාන අලංකරණය ( Landscaping )

මේ මඟින් රෝහල තුළ වසංගතරෝග අවමකර වඩාත් ඵලදායි රෝගී සත්කාර සේවාවක් සිදු කිරීම අපගේ ප්‍රධාන ඉලක්කය විය. එබැවින් උක්ත අරමුණු ඵලදායිකර ගැනීමට 2020 සැප්තැම්බර් 12 වන දින මෙම මැඩසටහන සාර්ථකකර ගැනීමට සේවකයන් හා අවශ්‍ය උපකරණ ලබා දී අප හා එක්වූ අම්බලන්ගොඩ නගර සභාවේ නගරාධිපතිතුමා ඇතුළු සමස්ථ කාර්යය මණ්ඩලය වෙනුවෙන් කෘතඥ පූර්ව ස්තූතිය ප්‍රකාශ කරනවා.

**තීරණය-**

2020.09.12 දින බලපිටිය මූලික රෝහලේ පැවති ශ්‍රමදාන වැඩසටහන සඳහා දායකත්වය ලබාදීම වෙනුවෙන් වෛද්‍ය අධිකාරී විසින් ස්තූතිය පුදකර එවා ඇති ලිපිය ගරු සභාවේ දැනගැනීම පිණිස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ඉදිරිපත් කරන ලදී.දැන ගැනිම සඳහා ඉදිරිපත් කරනවා

**03.02 අම්බලන්ගොඩ ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සිසු නිපුණතා ත්‍යාග ප්‍රදානෝත්සවයට සහයෝගය සහ අනුග්‍රහය දැක්වීම වෙනුවෙන් ස්තූතිය පුදකර එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2019 සිසු නිපුණතා ත්‍යාග ප්‍රදානෝත්සවය සම්බන්ධව ස්තුති කිරිම. 2020.09.13 දින පැවති අම්බලන්ගොඩ ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සිසු නිපුණතා ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී ජයග්‍රහණ 1,2,3,4,5 ස්ථාන සඳහා ත්‍යාග ලබාදීමත් , 1,2,3 ස්ථාන සඳහා පදක්කම් ලබාදීමත් වෙනුවෙන් ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරමින් රුපියල් ලක්ෂයකට වැඩි විශාල මුදලක් පරිත්‍යාග කරමින් දැක්වූ අනුග්‍රහයට විශේෂ ගෞරවණිය පුණ්‍යානුමෝදනා පූර්වක ස්තූතිය පුද කර සිටි. තවද එම උත්සවය සඳහා නගර සභාවේ පුටු සැපයීමෙන් දැක්වූ අනුග්‍රහයට ස්තූතිය පුද කර සිටි. උත්සවයට සහභාගී වූ නාගරික මන්ත්‍රීතුමන්ලාට ද විශේෂ කැප කිරීමක් කළ ප්‍රජා සංවර්ධන

නිලධාරිතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට ද නගර සභාවේ කාර්ය මණ්ඩලයට ද විශේෂ ස්තුතිය පුද කර සිටි.

**තීරණය-**

අම්බලන්ගොඩ ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සිසු නිපුණතා ත්‍යාග ප්‍රදානෝත්සවයට සහයෝගය සහ අනුග්‍රහය දැක්වීම වෙනුවෙන් ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරී ශාස්ත්‍රවේදී නින්දානේ චන්දික හිමි විසින් ස්තූතිය පුදකර එවා ඇති ලිපිය ගරු සභාවේ දැනගැනිම පිණිස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

**03.03 සඳුදා දින "මහජන දිනය" ලෙස ප්‍රකාශයට පත්කිරීම යන මැයෙන් ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

සඳුදා දින "මහජන දිනය" ලෙස ප්‍රකාශයට පත් කිරිම. උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති ජනාධිපති ලේකම්ගේ අංක PS/GPA/Circular /29/2020 හා 2020.09.15 දිනැති ලිපිය හා බැඳේ. ශීර්ෂගත ලිපිය මඟින් සෑම සතියකම සඳුදා දිනය සියළුම රාජ්‍ය ආයතන වල මහජන දිනය ලෙස ඔබ ආයතනය තුළ ක්‍රියාවට නැංවීමට හා ඔබ යටතේ පවතින සනියළුම ආයතන තුළ ක්‍රියාත්මක කිරීමට දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි. ඒ අනුව රජයේ ආයතන වෙත පැමිණෙන පොදු මහජනතාවට, අදාළ නිලධාරීන් මුණ ගැසීමට සහ ස්වකීය අවශ්‍යතා ඉටුකර ගැනිමට හැකිවනු පිණිස, සියළුම ආයතනවල සේවය කරනු ලබන නිලධාරීන් මහජන දිනය වන සඳුදා දිනය තුළ තම කාර්යාලයේ රැඳී සිටින බවට සියළුම ආයතන ප්‍රධානීන් විසින් වගබලා ගත යුතු බවද දැනුම් දෙමි. එමෙන්ම , මහජන දිනයේ දී අත්‍යවශ්‍ය කටයුත්තක දී හැර සියළුම නිලධාරීන් නිවාඩු ගැනීමෙන් මෙන්ම කාර්යාලයෙන් පිටත වෙනත් කටයුතු යොදා ගැනීමෙන් වැළකී සිටින ලෙස ද වැඩි දුරටත් දන්වා ඇත. මේ පිළිබඳ දැනුවත් කරන ලෙස දන්වා සිටිනවා.

**තීරණය-**

සඳුදා දින "මහජන දිනය" ලෙස ප්‍රකාශයට පත්කිරීම යන මැයෙන් ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් එවා ඇති ලිපිය ගරු සභාවේ දැනගැනිම පිණිස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

**03.04 අහුන්ගල්ල ගා/රාජපක්ෂ මහා විද්‍යාලයට තණකොළ කපන යන්ත්‍රයක් ඉල්ලා විදුහල්පතිතුමා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

තණකොල කපන යන්ත්‍රයක් ලබා ගැනීම සම්බන්ධවයි. අප විද්‍යාලයේ 13,15,17,19 යන කණ්ඩායම් පුහුණුවීම් කටයුතු සහ ක්‍රිකට් ක්‍රීඩා තරඟ පැවැත්වීම සඳහා ප්‍රමුඛව භාවිතා වන ක්‍රීඩා පිට්ටනියක් ඇත. ඒ වගේම පාපන්දු ක්‍රීඩාවේ යෙදෙන ළමුන්ද පුහුණුවීම් කටයුතු කරන මෙම පිට්ටනිය නඩත්තු කිරීමේ අපහසු තත්ත්වයක පවතී. පසුගිය කාලයේ කෝවිඩ් - 19 වසංගතය

හේතුවෙන් පාසලට ලැබිය යුතු අරමුදල් නොලැබීම හේතුවෙන් ඒ සඳහා මුදලක් වෙන්කිරීමට විද්‍යාලයට අපහසු වේ. එය හේතුකොටගෙන මෙම කාර්යය කඩිනමින් කරගැනීමට අවශ්‍ය අනුග්‍රහය ලබාදෙන ලෙසත් තණකොල කපන යන්ත්‍රය ඉල්ලා සිටිනවා .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , ඒ දිම සම්බන්ධයෙන් යම්කිසි ප්‍රශ්නයක් නැති වුණත් අපට මෙහි නිත්‍යානුකූල තත්ත්වය පිළිබඳව ඔබතුමා දන්නවා ඇති. එමනිසා නිත්‍යානුකූලව එය සභාවෙන් ලබා දීමේදි සේවක මහත්මයෙක් එයට යොදවනවාද? නිත්‍යානුකූලව එය ලබා දිමේ ප්‍රශ්නයක් නැතිනම් ඒ පිළිබඳව අපට දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනවා. එය ලබාදිම පිළිබඳ විරුද්ධ වෙන්නේ නැහැ. නමුත් අහුංගල්ලේ. එය අපිට අයිතිද කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

බලපිටිය ප්‍රාදේශිය සභාවේ. බලපිටියේ මෙහෙම දෙයක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

එය ලබාදිම පිළිබඳව නිත්‍යානුකූල ප්‍රශ්නයක් නැතිනම් අපි ඒ පිළිබඳව දැනුවත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ කතා කරමින්</u>**

අහුංගල්ල රාජපක්ෂ විද්‍යාලයෙන් ලිපියක් එවා තිබෙනවා. නමුත් අපි විරුද්ධ නැහැ. ඒ වුණාට මෙය බලපිටිය කොට්ඨාශයට අයිති පාසලක්. මෙය බලපිටිය කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයට අයිති. එම විදුහල්පතිතුමා කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයෙන් ඉල්ලන්න ඕන. එහෙම නැතිනම් අම්බලන්ගොඩ කලාප කාර්යාලයෙන් ඉල්ලන්න ඕන. කලාප කාර්යාලයෙන් ඉල්ලා ඒ බඩු අරගෙන ඕවා කරන්න ඕන. අම්බලන්ගොඩ කොට්ඨාශයේ තිබෙන පාසල් වලට නම් ඒවා දෙන්න ඕන. බලපිටියට අපි දිම අවශ්‍ය නැහැ. බලපිටිය ප්‍රාදේශිය සභාව නැතිනම් කොට්ඨාශ කාර්යාලයෙන් සපයන්න ඕන. එතැනින් සපයන්නේ නැතිනම් අම්බලන්ගොඩ කලාප කාර්යාලයෙන් සපයන්න ඕන. කලාප කාර්යාලයෙන් අරගෙන ඒ වැඩ කරන්න ඕන. බලපිටියට ඉල්ලනවා. රත්ගමට ඉල්ලන්නවා . බලපිටියට ඉල්ලනවා . එහෙම නැතුව ඉල්ලන ඒවාට දෙන්න ඕන නැහැ. එහෙම නැතුව අපේ නගර සභාවේ කොට්ඨාශ තිබෙනවා. අපේ කොට්ඨාශයේ පාසැල් 6ක් විතර තිබෙනවා. ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා හොඳ වැඩපිළිවලක් ගෙනාවා. කාණු සුද්ද කරන වගේ ඒවා. ඒ මන්ත්‍රිවරු කිවු ඒවාවත් කරන්නේ නැහැ. ඒ මන්ත්‍රිතුමාලා කියන ඒවා කරන්නේ නැහැ . ශ්‍රේෂන් මන්ත්‍රිතුමා යෝජනාවක් ගෙනාවා. කොච්චර එවා තිබෙනවාද අපේ නගරයට කරන්න. එමනිසා මා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලනවා. මෙය දෙනවාට විරුද්ධ වෙනවා නෙමේ. අපි මෙය කියන්න ඕන හැමදාම ඒ අයට. කොට්ඨාශ කාර්යාලය තිබෙනවා. අධ්‍යාපන කාර්යාලය තිබෙනවා. ඒවාගෙන් ඒවා සපයන්න ඕන. ප්‍රාදේශිය සභාවෙන් ඉල්ලුවොත් අපි එකත් සපයන්න ඕන. එමනිසා මා සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා මින් ඉදිරියට මේ පාසැල් ඉල්ලුවාට දෙන්න එපා. සිද්ධාර්ථ විද්‍යාලයෙන් ඉල්ලනවා . ශ්‍රිපතිය ඉල්ලනවා. ඒවා ඒ කලාප , කොට්ඨාශ කාර්යාලයෙන් කරන්න කියන්න. කොට්ඨාශ තුනක් තිබෙනවා අම්බලන්ගොඩට අයිති.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා නම් කියන්නේ බලපිටිය ප්‍රාදේශිය සභාවට අයිති වුණත් එය අපේ සම්පතම ප්‍රාදේශිය සභාවක්. දැන් අපිට මොනවාහරි ඕන වුණොත් අපි ළඟම තිබෙන ප්‍රාදේශිය සභාවෙන් තමයි ඉල්ලන්නේ. මේ අධ්‍යාපන කටයුක්තකට ඉල්ලා තිබෙන්නේ. මෙහි සිටින අපි ඔක්කොම දෙමාපියන්. අනිවාර්යෙන් ළමයින්ගේ අනාගතයකට මොකක් හරි ගැටළුවක් නොවෙනවා නම් ලබා දුන්නාට ගැටළුවක් වෙන්නේ නැහැ. එහේ සභාවේ නැති නිසානේ ඉල්ලීම කරන්නේ. ඉතිං අපි නැති කෙනෙකුට උදවු කරන්න ඕන. මා නම් කියන්නේ මෙය ලබා දෙනවා නම් හොඳයි කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ යන්ත්‍රය සභාවෙන් මිලදී ගත් එකක්ද ? නැතිනම් ක්‍රිකට් ආයතනයෙන් ලබා ගත් එකක්ද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නගර සභාව සතු එකක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මෙහි වටිනාකම කියද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගන්න කාලේ ලක්ෂ 2ක් 2 ½ වටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ලක්ෂ 2ක් 2 ½ වටිනා යන්ත්‍රයක් මිලදිගෙන එහි වගකීම ගන්නේ කවුද? දෙන්න ඕන තමයි . අපි දැන් මේ ක්‍රිඩාංගණය හදා ගෙන යම්කිසි වැඩ කොටසක් කරන්න හදනවා. හදිස්සියේ වත් මේ වගේ එකක් කැඩුණොත් ලක්ෂ 5ක් 6ක් යනවා. මා කියන්නේ එම නිසා මේ වේලාවේ එය දීම පිළිබඳව. මේ අය ඉල්ලන්නේ දිගටම එය නඩත්තු කර දෙන ලෙස. මෙය ගැටළුවක් වෙනවා. හදිස්සි අවශ්‍යතාවයකදී එක දිලා ගත්තාට කමක් නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි අපි එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරනවා.

**තීරණය-**

අහුන්ගල්ල ගා/රාජපක්ෂ මහා විද්‍යාලයට තණකොළ කපන යන්ත්‍රයක් ලබාදෙන ලෙස ඉල්ලා විදුහල්පතිතුමා විසින් එවා ඇති ලිපිය අනුව එම ඉල්ලීම ඉටුකළ නොහැකි බව ගරු සභාව විසින් තීරණය කරන ලදී.

**03.05 කෘෂි ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ඌරුවත්ත පාලම අසල අම්බලන්ගොඩ පිවිසුම් දොරටුවේ නගර සීමාවේ දුම්රිය මාර්ගය හා මහා මාර්ගය අතර අඩි 15 ක් පමණ බිම් තීරුව ලබාදෙන ලෙස දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

කෘෂි ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ස්ථානයක් (භූමියක් ) ලබා ගැනිම. අම්බලන්ගොඩ ප්‍රා දේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක උද්‍යාන විද්‍යා සංගම් ඇතුළු කෘෂි ව්‍ය12වසායකයන්ගේ කෘෂි නිශ්පාදන අලෙවි කර ගැනීමට පහසුකම් සැලසීම අරමුණු කරගෙන ඔබ නගර සභාවට අයත් ඌරවත්ත පාලම අසල අම්බලන්ගොඩ පිවිසුම් දොරටුවේ නගර සිමාවේ දුම්රිය මාර්ගය හා මහ මාර්ගය අතර අඩි 15 පමණ පළල බිම් තීරුව අප පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ඉහත කෘෂි ව්‍යයසායක සංගමය වෙත ලබා දීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටි. කෘෂි ව්‍යවසායකයන්ගේ ආදායම් ඉහල නංවා ජනජිවිතය නඟා සිටුවීමට මෙම ප්‍රයන්තය ඉවහල්වන බැවින් ඔබගේ කාරුණික අවධානය යොමුකරනු මැනවි. පළාත් කෘෂි අධ්‍යක්ෂක ලිපියක් එවා තිබෙනවා.

__ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි , මෙය අපිට අයිති එකක්ද ? මාර්ග සංවර්ධන අධිකාරියට නේද අයිති . ඔය ටික විතරයි ගරු සභාපතිතුමා අපිට වාහනයක් හරි නතර කර ගන්න තිබෙන්නේ. ඕක නැති වෙයි. අපිට කොහොමත් අයිතියක් නැහැ නේද දෙන්න.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

අපිට කොහොමත් අයිතියක් නැහැ දෙන්න. එකඟතාවය දෙන්න පුළුවන්.

__ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්__

එකඟතාවය දුන්නොත් ඔබතුමා දන්නවා මේ නගරයේ තත්ත්වය. ඔය ටිකේ තමයි පිටින් එන අය වාහනයක් හරි නතර කරගෙන බඩුවක් මුට්ටුවක් ගන්නේ. ඔය දීම සුදුසු නැති බව තමයි මගේ අදහස.

__ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්__

සංවේදිති අයුරින් ගෙවතු වගාව , මල්පැල අලෙවිය සඳහා යොදා ගැනිමයි එම අධ්‍යක්ෂකවරයාගේ අදහස වි තිබෙන්නේ. අපිට අයිතියක් තිබෙනවා පාර අවහිරයක් නොවේ නම් යම් නිර්යාක පිළිබඳ එකඟතාවය ලබා දුන්නොත් අපේ වචන වැඩසටහනටත් රුකුලක් වෙයි. මොකද අපේ රජයේ ආයතනයක්. මොකක්ද ඒ කෘෂි නිලධාරියා ඉල්ලන ලද.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පළාත් කෘෂි කර්ම අධ්‍යක්ෂක

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

එම අධ්‍යක්ෂකතුමා අවාට ගියාට වැඩ කරන කෙනෙක් නෙමේ. ඒ ක්‍රමවේදයත් දැනගෙන අපේ එකඟතාවයත් දී යම් සේවයක් ලබා ගැනීමට උත්සාහයක් දැරිය යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මා බැලුවේ අපේ කාන්තා වැඩසටහනට යොදා ගන්න. කාන්තා කමිටු බලාගෙන ඉන්නවා. අපිට අම්බලන්ගොඩ නගරයේ ඉඩ නැහැ කියනවා. අපේ වැඩවලට යොදා ගන්න. අපි අනුන්ගේ වැඩ වලට යොදා ගැනිම නෙමේ. අතිගරු ජනාධිපතිතුමගේ අශිර්වාදය මත තමයි එක හරි. අතිගරු ජනාධිපතිතුමා අපේ ඒවාටත් ආශිර්වාද කරයිනේ. කාන්තා කමිටුවලින් අපි ඉදිරියේදි වැඩ කරන්න බලාපොරෝත්තු වෙනවා. ඒ අයගේ මොනවා හරි හඳුන්වා දිමේදි අපිට ඉඩ පහසුකම් නැහැ. අපි එතැන යොදා ගන්න ඒවාට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා හිතන විදියට අම්බලන්ගොඩ නගරය තුළ කෘෂි කර්මයේ යෙදුන කාන්තාවෝ පිරිසක් සිටිනවා. මා හිතන විදියට අපි කෘෂිකර්ම අධ්‍යක්ෂකතුමාගෙන් ඉල්ලිමක් කරන්න .අම්බලන්ගොඩ නගරයේ මේ කෘෂිකර්මයේ නියැලෙන අයට පමණක් දෙන්න කියා. අම්බලන්ගොඩ නගරයේ මල් සංගම් දෙකක් තුනක් තිබෙනවා. කෘෂිකර්ම සේවයෙන් විශාල සේවයක් වෙනවා. මා හිතන විදියට පළාත් වාරිමාර්ගයට අයිති වෙන්නේ. ඔබතුමා ඉල්ලිමක් කරන්න. අම්බලන්ගොඩ කෘෂි කර්මයේ යෙදෙන මල් සංගම් වලට පමණක් කුටි ටික ගසා එහෙම දෙන්න පුළුවන්නම් ලොකු සේවාවක් කර දෙන්න පුළුවන් කියා. අපි නගර සභාවේ සියළුම මන්ත්‍රිවරුන්ගේ එකඟතාවය ලබා දෙයි කියා හිතනවා. ඉල්ලිමක් කරන්න පළාත් කෘෂි කර්ම අධ්‍යක්ෂකතුමාගෙන්. ඒ සඳහා සහායෝගය ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එකඟතාවය නේද ඉල්ලා තිබෙන්නේ. සභාවට අයිතිත් නැහැ නේද ? අපේ රටේ බව බෝග අලෙවි කිරිම සඳහා ව්‍යවසායකයන් දියුණු කිරිම අපේ පාරිභෝගිකයන්ට හොඳ ආහාර වේලක් ලබා දිම සඳහාත් මෙම වැඩ සටහන හොඳයි. අපේ උප සභාපතිතුමා කිවු පරිදි වාහනයක්වත් නතර කර ගැනීමට තැනක් නැති වෙනවා. තව එකක් තමයි අපේ අනන්‍යතාවය වෙනුවෙන් අපි යම් දෙයක් කරන වා නම් සහායෝගය ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව අපි කෘෂිකර්ම අධ්‍යක්ෂකතුමා සමඟ කතා කරලා වාර්තාවක් ඉදිරිපත් කරන්නම් සභාවට.

**තීරණය-**

කෘෂි ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ඌරුවත්ත පාලම අසල අම්බලන්ගොඩ පිවිසුම් දොරටුවේ නගර සීමාවේ දුම්රිය මාර්ගය හා මහා මාර්ගය අතර අඩි 15 ක් පමණ බිම් තීරුව ලබාදෙන ලෙස ඉල්ලා දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා විසින් කර ඇති ඉල්ලීම සම්බන්ධව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා සමග සාකච්ඡා කර වාර්තාවක් ගරු සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් තීරණය කරන ලදී.

**03.06 නගර සභා ක්‍රිකට් පුහුණු පාසලට අවශ්‍ය උපාංග ලබාදෙන ලෙස ක්‍රිකට් පුහුණුකරු ජී.එච්.සහන් සංකල්ප මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සහන් සංකල්ප. නගර සභා ක්‍රිකට් පුහුණු පාසලට අවශ්‍ය උපාංග ලබා ගැනීම සම්බන්ධව. ගරු සභාපතිතුමාගේ උපදෙස් හා අදික්ෂණ මත පවත්වගෙන යනු ලබන නගර සභා ක්‍රිකට් පුහුණු පාසල මඟින් ප්‍රදේශයෙහි ක්‍රිකට් ක්‍රිඩාවට ඇළුම් කරන හා දක්ෂතා දක්වන ක්‍රිඩකයන් හට මහඟු තොතැන්නක් වී ඇත. අදවන විට ක්‍රිඩා පුහුණු පාසල මගින් ජාතික තලයට වෙන්ව ජාත්‍යාන්තර තලයේ දක්ෂතා දක්වන ක්‍රිඩකයන් අප පුහුණු පාසල මඟින් බිහිකර ඇත. එවැනි දක්ෂතා ඇති ක්‍රිඩකයන් පුහුණු පාසල තුල සිටින අතර ඔහුන්ව ඔප් නංවාගෙන ඉදිරියට යැම අප පුහුණු පාසල මඟින් ඉටු කරනු ලබයි. එවැනි ක්‍රිඩකයන් ඉදිරියට රැගෙන යාම සඳහා අප පුහුණු පාසලට අඩු ලුහුඩු කම් කිහිපයක් පවති. එනම්,

- පැති පුහුණුවීම් කටයුතු සඳහා හොකි හොකි බෝල 50ක්
- පැති පුහුණුවීම් කටයුතු සඳහා ටෙනිස් බෝල 50ක්
- පන්දු රැකිමේ කටයුතු සඳහා ස්ලිප් බෝඩ් 01ක්
- පන්දු රැකිමේ දැන් ආවර්ණයක්
- පැති පුහුණුවීම් සඳහා පන්දු විසිකරණයක් ( සයිඩ් ඇම්එකක්)
- පැති පුහුණුවීම් සඳහා ටෙනිස් රැකට් 01ක් ද්‍රව්‍යයන් අවශ්‍යව ඇත. මෙම අයිතමයන් මඟින්

දැනට පවතින අයිතමයන් මඟින් දක්ෂතා ඉහළ නැංවිමට ඔවුන්ගේ අති විශිෂ්ඨ ක්‍රිඩකයන් ලක් දෙරණට දයාද කල හැකි ක්‍රිඩකයන් බවට පත්කල හැකි බවට විශ්වාසයි. මෙහි සඳහන් ද්‍රව්‍යමය අයිතමයන් ලබා දෙන ලෙස ඉල්ලා සිටි.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙම ඉල්ලිම සාධාරණ ඉල්ලිමක්. සහන් මහතා උනාන්දුවෙන් කරන නිසා අපි සහායෝගය ලබා දිය යුතුයි. එය සාධාරණයි ලබා දෙන එක. මා ළඟත් තිබෙනවා වයස අවුරුදු 15න් පහළ වගේ තිබෙන හිස් ආවරණ , පිති, පැඩ් වගේ ඒවා තිබෙනවා. අපි ඒක කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ ක්‍රිඩා භූමිකරු කරන ලද ඉල්ලීමට අනුව එය ලබා දෙන්න. මාත් එකඟයි. එය ලබා දෙන්න. පාපන්දු පුහුණු ආයතනයක් තිබෙනවා. අපි ලක්ෂ 6ක් විතර අපි වියදම් කරනවා. එමනිසා ක්‍රිකට් ක්‍රිඩාව නඟා සිටුවීම කළ යුතුයි. අම්බලන්ගොඩ කියන්නේ ක්‍රිකට් ක්‍රිඩකයන් දයාද කරන ලද නගරයක්. එමනිසා මෙය දියුණු කරගන්න එතුමා ලොකු කැප වීමකින් වැඩ කරන නිසා පාපන්දු පුහුණු ආයතනයට ලක්ෂ 6ක් ලබා දෙනවා වගේ මේවා ලබා දීලා මේ වැඩ කටයුතු කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා හිතන්නේ ඉතාමත් හොඳ වැඩ සටහනක්. මෙය කලින් ඉදගෙන ක්‍රියාත්මක වුණා. එය සාර්ථකව යනවා. හැබැයි පොඩි ගැටළුවක් තිබෙන්නේ මෙහේ දක්ෂ ක්‍රිඩකයන් පුහුණු කරන කොට පාසල් වල ක්‍රිඩා කිරීමේ ක්‍රමවේදයට ඇතුළත් වෙලා නැහැ. ඒ පාර යන්න ඕන කුලරත්න විද්‍යාලයට යන්න ඕන දරුවෙකුට එතැනින් දමනවා කවුරුහරි පුහුණුකරුවෙකු ළඟට. කුලරත්නෙන් දමන්නේ අපේ රියෝ ක්‍රිඩා සමාජයේ ජයන්ත මහතා ළඟට. ඒ පාර දැම්මාම අපි ඉල්ලීමක් කරන්නේ මේ හැකියාවන් තිබෙන ළමුන් මේ ළමයින් ඒ කණ්ඩායම් වලට යොමු කර ගන්න කියා. මොකද විශාල මුදලක් වැය කරන්න වෙනවා. ඒ පාර රියෝ ක්‍රිඩා සමාජයට බැඳෙන්න ඕන එකක්. ඒ පාර එතැනට වියදමක් යනවා. අපි නොමිලේ ගොඩක් ලබා දෙනකොට ප්‍රතිඵලය ගන්න පාසැල් වලින්. පාසැල් ක්‍රිකට් වලට පොඩි කාලේ සිට සෙල්ලම් කරන කට්ටිය තමයි මෙයට යොමු වෙන්නේ. එය සාර්ථකව අපි නගර සභාවෙන් කරන කොට ඔනෑම දෙයක් දුන්නාට ගැටළුවක් නැහැ. එක හොඳයි. ඔබතුමා තමයි මෙය ආරම්භ කළේ මුලින්. ඒ ආරම්භය යනවා වගේම පාසලට ගියාට පසු ඒ ළමයින් ක්‍රිකට් ක්‍රීඩාවට යොමු කර ගන්න. එක්කෝ ක්‍රිකට් කණ්ඩායමට ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදයක් බලා එය සභාවෙන් හරි ලිපියක් යවා කරන්න කියා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

මා හිතන්නේ සභාපතිතුමාගේත් අදහස වුණේ එකයි. පිට පළාත් වල ළමුන් අරගෙන අපේ පාසැල් වලට යොමු කරන්න. අපේ පාසැල් වලින් ඒ ළමයින් ගන්න එක ප්‍රතික්ෂේප කළා. අන්න එහෙම ප්‍රශ්නයක් වුණා. එහි නිසි ප්‍රයෝජනය අපේ පාසැල් වලින් ගත්තේ නැහැ. අපි එය ඉදිරියේදි පාසැල් වලට ගන්න කියා මොකක් හරි ක්‍රමවේදයක් ඇති කරන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

සභාව මඟින් අපේ නගර සභාවේ යෝජනාවක් මඟින් ආරම්භ කළේ. ආරම්භ කළේ අපි දුටුවා වයස අවුරුදු 10 හේ 12 ,13,14,15 වගේ වෙනකම් හුඟාක් ළමයින් පුහුණුවීම් සඳහා ක්‍රිකට් පාසැල් වලට ගිහින් තමයි පාසැල් වල ගහන්න ඒ අවස්ථාවේ යන්නේ. ඒ යන අවස්ථාවේදි ක්‍රිකට් පාසැල් වලින් විශාල මුදලක් අයකිරිමට සිදු වීම නිසා සමහර ළමයින් ක්‍රිඩාවෙන් ඈත් වුණා. දැන් සම්පූර්ණයෙන්ම ඉවත් වෙලා දෙමාපියන්ට මුදල් නැති නිසා ඉවත් වුණා සමහරු. එමනිසා මේක දැකපු ක්‍රිඩා උපදේශක අශෝක කුමාර මහතා කතා කරලා කිවුවා අපි මේ වගේ වැඩක් කරන්න. මා පුහුණු කරන්නම්. පුහුණු සංචිතයක් අපි අවුරුදු 10න් පහළ පටන් ගන්න කියා. අපි කියන්නම් ළමයින්ට කිසිම සතයක්වත් අරගන්නේ නැතුව අපි පටන් ගත්තා. මේ වනකම් අපිට අද වෙනකම්

ක්‍රිකට් පුහුණු පාසැලෙන් කරදරයක් වුණේ නැහැ. කවදාවත් බඩු ඉල්ලුවේ නැහැ. මේ පළමු වතාවට බඩු ඉල්ලපු. අපි එක කියන්නත් ඕන. සහන් මහතාට අපි මේ ලියුම ආපු අවස්ථාවේ කිව්වා . මීට  කලින්නම් සභාවෙන් මේ වගේ දේවල් ඉල්ලා නැහැ. දෙමාපියන් එක්ක එකතු වෙලා මේක කර ගත්තා. නමුත් මේ ඉල්ලීම සිදුවිය යුතු දෙයක් . සමහර වෙලාවට අපේ දෙමාපියන් මුදල් නැති අය වගේම මුදල් තිබෙන අයත් මේ සංචිතයේ සිටිනවා. ඉතිං ඒ සංචිතයේ පුහුණු වන ළමයින් හුහාක් ධර්මාශෝක දේවානන්ද විද්‍යාලයේ කොළඹ ආනන්ද , රාජකිය විද්‍යාල, තොමස් විද්‍යාල වලත් ශ්‍රී ලංකා පාසැල් කණ්ඩායමේත් පුහුණු වූ ළමයින් සිටිනවා. ඒ වගේම දෘශ්‍යාබාධිත ශ්‍රී ලංකා කණ්ඩායමේ නායකයාත් මෙම අපේ පුහුණු ආයතනයේ පුහුණු වූ අයෙක්. එමනිසා අපි සතුටු වෙනවා . අපි යම්කිසි ක්‍රීඩක පිරිසක් හදලා ඉන්නේ. එමනිසා මේ දේවල් ලබා දෙන්න සභාවේ අනුමැතිය ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

**තීරණය-**

නගර සභා ක්‍රිකට් පුහුණු පාසලට අවශ්‍ය උපාංග ලබාදීම  සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

01. පැති පුහුණුවීම් කටයුතු සඳහා හොකී බෝල 50 ක්
02. පැති පුහුණුවීම් කටයුතු සඳහා ටෙනිස් බෝල 50  ක්
03. පන්දු රැකීමේ කටයුතු සඳහා ස්ලීප් බෝඩ් 01 ක්
04. පන්දු රැකීමේ දැල් ආවරණයක්
05. පැති පුහුණුවීම් සඳහා පන්දු විසිකරණයක්
06. පැති පුහුණුවීම් සඳහා ටෙනිස් රැකට් 01 ක්

- පෙ.ව. 10.10 ට ටෙන්ඩර් විවෘත කරන ලදී.

**03.07 අම්බලන්ගොඩ නගර සභා පෙර පාසල් දරුවන්ගේ 2020 වාර්ෂික චාරිකාව යාම සඳහා බස් රථ 06 ක් ලබාගැනීමට රු.132000/- ක මුදලක් වියදම් දැරීමට අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පෙර පාසල්  වාර්ෂික චාරිකාව යාම සඳහා බස් රථ ලබාගැනීම.  රු.132000/- ක මුදලක් වියදම් දැරීමට අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී. අම්බලන්ගොඩ නගර සභා පෙර පාසල් දරුවන් 2020 වර්ෂයේ වාර්ෂික චාරිකාවට සහභාගී විමට ප්‍රවාහන පහසුකම් නගර සභාවෙන් ඉල්ලා ඇත. ඒ අනුව පෙර පාසැල් දරුවන් සඳහා පහත පරිදි ප්‍රවාහන පහසුකම් ලබාදෙන පරිදි ඉල්ලා ඇත. පෙර පාසැල් සිය දෙමාපියන් සමඟ සිය වාර්ෂික චාරිකාවට සහභාගි වීමට නියමිතය. ඕකන්ද පෙර පාසලේ ළමුන් 22යි , බස්රථ 20යි . තල්ගස්ගොඩ පෙර පාසැලේ ළමුන් 22යි . බස්රථ 01ක් අවශ්‍යයි. කෙරමිණිය පෙර පාසැලේ ළමුන් 30යි . බස්රථ 01ක් අවශ්‍ය

වෙනවා. හිරේවත්ත පෙර පාසලත් පොල්වත්ත නෙලුම් පන්තියත් එහි 10ක් සහ 15ක් බැගින් ඉන්නවා. එක බස්රථයක් ඉල්ලා සිටිනවා. පොල්වත් ඕලු පන්තියත් 14 හේප්පුමුල්ල 6පෙර පාසලත් එක බස්රථයක් ඉල්ලා සිටිනවා. පොල්වත්ත මානෙල් පන්තිය 5 කැටන්තොට පෙර 17 ඒ අනුව එකක් ලබා දෙන්න. ඒ අනුව ඔවුන් ඉල්ලිම කරන්නේ බස්රථයක් සඳහා දිනකට රු.22000/= බැගින් බස්රථ සඳහා රු.132000/= ක මුදලක් වියදම් දැරිමට අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , එය ලබා දෙන්න. බස්රථ දෙනකොට එහි අසන අනුව ගණන් වෙනස් වෙනවානේ. එය බලා ඒ අදාල වෙන විදියට දෙකක් හරි එකතු කරලා ලොකු බස්රථ ලබා දෙන්න. බස්රථ 6ක් කිවුවාම මා මේ බැලුවේ. දැන් 22 කට නම් 1ක් නේ ඉල්ලන්නේ. සාමාන්‍ය යෙන් 50 යන ඒවා ගත්තාම හරිනේ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

පෙර පාසැල් පංති තිබෙනවා 9ක්. නමයට බස්රථ 6ක් පමණයි ඉල්ලන්නේ. පොඩි දරුවන් යන නිසා පොඩි දරුවන් ගුරුවරයාට විතරක් පාලනය කරන්න බැහැ. අම්මා හරි තාත්තා හරි යන්න ඕනේ. එය ලබා දිමට තින්දු කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා පෙර පාසල් දරුවන්ගේ 2020 වාර්ෂික චාරිකාව යාමට බස් රථ 06 ක් ලබාගැනීම සඳහා රු.132000/- ක මුදලක් වියදම් දැරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.08 සභාපති-අම්බලන්ගොඩ නගර සභාව නමින් ඇති විදුලි බිල්පතෙහි නම අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය නමින් සංශෝධනය කිරීමට අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ගිණුමේ නම වෙනස් කිරිම . ගිණුම් අංක 0406802407 සභාපති නගර සභාව අම්බලන්ගොඩ. උක්ත ගිණුම් අංකය සඳහන් ස්ථානයේ විදුලි බිල්පතේ නම සභාපති අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය නමින් සංශෝධනය කිරීම සඳහා අප වෙත අයදුම් පත්‍රයක් භාර දි ඇත. එම සංශෝධනය කිරිම සම්බන්ධයෙන් ඔබගේ අනුමැතිය ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටි.

මේ කියන්නේ තරුණ බෞද්ධ සංගමයට ලබා දෙන ලද ගොඩනැඟිල්ලේ විදුලි බිල. එය අපේ නගර සභාව සතු ඉඩමක්. එම ඉඩම නගර සභාව සතු නිසා නගර සභාව නමින් තමයි තවම විදුලි බිල එවන්නේ. ඔහු ඉල්ලා සිටිනවා එය සභාපති ,අම්බලන්ගොඩ , නගර සභාව කියන එක තරුණ බෞද්ධ සංගමය කියා වෙනස් කරන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එහි අයිතිය තිබෙන්නේ අපිට.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ අය ඉල්ලනවා එහෙම කරන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

සොයා බලා කරන්න. අයිතිය නැතිනම් බැහැ කරන්න. අයිතිය තියෙන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නගර සභාව සතු දේපළ වල අයිතිය කාටවත් ලියන්න හොඳ නැහැ. මල් සංගමයෙන් හුභාක් පාඩම් අපිට කියා දුන්නා. මේක මේ විදියටම තියෙන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නගර සභා දේපළක් නිසා කාටවත් පවරන්න බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව විදුලි සමාගමේ ඉංජිනේරු මහතා මා සමඟ පැවසුවා. මා හිතන්නේ මා හරියට ම දන්නේ නැහැ. දැනුවත් වෙන්නයි කතා කරන්නේ. මොකද ඒ ළිඳ තියෙද්දි ඒ ඉඩම නගර සභාවට පවරා තිබෙනවා. ඊට පස්සේ එම අයිතිකරුවන් ඔප්පුවක් මඟින් තරුණ බෞද්ධ සංගමයට පවරා තිබෙනවා කියන කතන්දරය තමයි කියන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නගර සභාවට ඔප්පුවක් මඟින් පවරා තිබෙනවා. ඔය පවරා දිපු එක පවරා දි තිබෙන්නේ ළිඳක් සඳහා. එතකොට ළිඳක් සඳහා දිපු එක පවරලා දිලා තිබෙනවා නම් එම ඥාතින්ට අනුමැතිය ගන්න ඕන ළිඳකට ඇරෙන්න දිපු මේක අපි මෙන්න මේ පවරා දීමේ කටයුත්ත වෙනස් කරනවා කියා. එකඟතාවයක් දෙන්න ඕන. එකඟතාවය දිපු පුද්ගලයා මැරිලා . එ ගොල්ලන්ගේ ඥාතින්ගෙන් . ලේ ඥාතින්ගෙන් ලබා ගත්තා මෙය තරුණ බෞද්ධ සමිතියේ ගොඩනැඟිල්ලක් ඉදිකිරිම සඳහා වෙනස් කර දෙන්න කියා. ඒ අනුව තමයි . වෙන දෙයක් නෙමේ. නගර සභාව සතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එහෙම නැතුව ඒ ගොල්ලන්ට ඔප්පුවක් දිලා නැහැනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපේ එකඟතාවයක් නැති වුණානම් එගොල්ලන්ට හදිස්සියේ වත් තමන් දීපු පැවරීම වෙනස් කරලා නගර සභාව කළා නම් ඉඩමේ අයිතිය ඉල්ලන්න. එමනිසා ඒ අයිතිය ඉල්ලීමේ පදනම මත මෙය අපි කර තිබෙන්නේ. මෙය නගර සභාව අම්බලන්ගොඩ නමින් තියා ගන්න. ඒ වෙනස් කිරීමට විරුද්ධ බව දන්වන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, තරුණ බෞද්ධ සංගමයේ මාත් හිටපු එක සභාපතිවරයෙක්. ඔබතුමා ඉදිරිපත් කරපු විදියට මෙහි අයිතිය නගර සභාව සතුයි. හැබැයි අම්බලන්ගොඩ නගර සභාව විසින් තරුණ බෞද්ධ සංගමයට මේ ගොඩනැඟිල්ල සැදීමේදී මෙය භාර දුන්නේ ඒ අයිතිකරුවන්ගේ කැමැත්ත පරිදි. ඒ අයිතිකරුවන් කැමැත්ත ලබාදීමේදී දෙන ලද ඔප්පුව ඔබතුමා කියන ආකාරයට නෙමේ තිබෙන්නේ. ඒ අය දී තිබෙන්නේ අයිතියක් පවරන විදියට. ඒ ගැන මා වාද කරන්නේ නැහැ. නගර සභාවට අයිතිය තිබෙන නිසා. තරුණ බෞද්ධ සංගමය සම්බන්ධව මෙතැන නිත්‍යානුකූලව කටයුතු නොකරන නිසා. හැබැයි ඒ අයට තිබෙන ප්‍රශ්නය තමයි විදුලි බිල මේ වෙනකොට රුපියල් 45000/= ක් එකතු වෙලා. එක්කො නගර සභාව ගෙවලා නැහැ. එක්කො නගර සභාව මේ ක්‍රියාවලිය නගර සභාව එක්ක එකතු වෙලා කෙරිලා නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය ගෙවන්න ඕන තරුන බෞද්ධ සංගමය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි එය ගෙවන්න ඕන තරුණ බෞද්ධ සංගමය. එය ගෙවලා නැහැනේ. නගර සභාව නමටනේ මේ බිල එන්නේ. එතකොට එගොල්ලන් දන්නේ නැහැනේ. නගර සභාව නමටනේ මේ බිල එන්නේ. එතකොට එගොල්ලන්ගේත් වාර්ෂිකව විගණනය වෙනවානේ. ගිණුම් ප්‍රතික්ෂේප වෙනවා. ඒ අයගේ තරුණ බෞද්ධ සංගමය ප්‍රතික්ෂේප වෙනවා. එතකොට මේ විගණනයේදි මේවා පෙන්වලා නැහැ. එහෙම ගැටළුවකුත් තිබෙනවා. නමුත් අවසානයේදි ඔය මොනවා වුණත් දැන් ඉඳලා හරි ඔය තරුණ බෞද්ධ සංගමය ගෙන්වා මා දන්නේ නැහැ මේ විදුලි බිල රුපියල් 45000/= ක් ඒ අයට ගෙවන්න වෙයි. අපිට සහනයක් දෙනවාද කියන එක වෙනම කතාවක්. ප්‍රධාන කාරණය ඒ අයට තිබෙන පුණ්‍යායතන වලට දෙන ඒකක ගණන නෙමේ නගර සභාවට තිබෙන්නේ. තවත් පොඩි ගැටළුවක් තිබෙනවා. එය ඔබතුමා විදුලි පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂකතුමා සමඟ කතා කරලා මෙය සත්‍ය වශයෙන්ම තරුණ බෞද්ධ සංගමය නමුත් අපේ නමට ඔප්පු තිබෙන නිසා අපිට මේක පවරන්න විදියක් නැහැ. නමුත් මේ අයට පුණ්‍ය කටයුතු සඳහා ගෙවන අයකිරීම ඔබතුමා මැදිහත්වෙලා කරලා දෙන්න පුළුවන් නම් එතකොට තරුණ බෞද්ධ සංගමයට කතා කරන්න අයිතියක් නැහැ. එකක් පුණ්‍යායතනයට හදන විදුලි බිල. අනිත් එක නගර සභාව සම්බන්ධවෙලා මස්පතා ඒ අයගේ විදුලිබිල ගෙවලා දෙන ආකාරයට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, දැන් මෙය විදුලි පුද්ගලික සමාගමෙන් නේද දන්වන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

විදුලි පුද්ගලික සමාගමට මේ අය ඉල්ලීමක් කර තිබෙනවා. සමිතිය අම්බලන්ගොඩ කියා බිල වෙනස් කරන්න කියා. විදුලි පුද්ගලික සමාගමෙන් අහලා තිබෙනවා අම්බලන්ගොඩ නගර සභාව නමට තිබෙන එක මේ ගොල්ලන්ගේ නමට වෙනස් කරන්න එකඟ ද කියා. ඉතිං ඒ අනුව එකඟතාවයක් නැහැ. මේකයි කියා අපි දැනුම් දෙන්නම්.

**තීරණය-**

ගිණුම් අංක 0406802407 යටතේ **සභාපති අම්බලන්ගොඩ නගර සභාව** නමින් ඇති විදුලි බිල්පතෙහි නම **සභාපති අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය** නමින් සංශෝධනය කිරීමට අනුමැතිය ලබාදිය නොහැකි බවට ගරු සභාව විසින් තීරණය කළ අතර, ඒ බව ලංකා විදුලි (පෞද්ගලික) සමාගම වෙත දන්වන ලෙස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් දැනුම්දෙන ලදී.

**03.09 අම්බලන්ගොඩ,පෝරඹ,ශ්‍රී සුගතබිම්බාරාම විහාරස්ථානයේ පිංකම් මාලාව සඳහා ප්ලාස්ටික් පුටු 100 ක්, කොඩි කණු 30 ක්,කැනපි 04 ක් සහ විහාරස්ථ භූමියට ප්‍රවේශ වන මාර්ගය ප්‍රතිසංස්කරණය කරදෙන ලෙස ඉල්ලා එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

විහාරධිපති, තැන්නෙකුඹුරේ සුමංගල හිමි , විහාරස්ථ පිංකම් මාලාව සම්බන්ධවයි. ඒ අනුව සභා අනුමැතියට යටත්ව දිලා තිබෙනවා ප්ලාස්ටික් පුටු 100, කොඩි කණු 30, කැනපි 4 ලබා දි තිබෙනවා. ඉල්ලීම පරිදි . ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා අවස්ථාවක් කොට ගන්නවා ගරු විහාරාධිපති තැන්නේ කුඹුරේ සුමංගල හිමි වෙනුවෙන් මෙම බඩු ලබා දීම සම්බන්ධව ඔබතුමා ඇතුළු සියළු මන්ත්‍රිවරු සහ සභාවට හා ඒ දින හතේ පිංකමට මහන්සි වෙලා ඒ වැඩ කටයුතු වලට මහන්සිවෙලා ඒ වැඩ කටයුතු සිදු කරනු ලැබු සෞඛ්‍ය හා මාර්ග කම්කරු සේවකයන් ඇතුළු සියළු දෙනාටම ස්තුතිය පුද කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ, පෝරඹ, ශ්‍රී සුගතබිම්බාරාම විහාරස්ථානයේ පිංකම් මාලාව සඳහා ඉල්ලා ඇති ද්‍රව්‍ය හා උපාංග සභා අනුමැතියට යටත්ව ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.10 2020 අගෝස්තු මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නිදහස් අයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව. ආයතනයෙහි සායන තැබූ දින ගණන 18, ආයතනයට පැමිණි රෝගීන් සංඛ්‍යාව 679, රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය ගණන 38, මාසය සඳහා වැය වූ ඖෂධවල මුළු වටිනාකම - 50,307.90, එක් රෝගියෙක් සඳහා වැය වූ මුදල රු.74.09 ක් වශයෙන් ඉදිරිපත් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මේ අයුර්වේද වාර්තාව පිළිබඳ මා ඉල්ලීමක් කරන්න හිටියේ. ජනතාවට සෞඛ්‍ය ගැන වෙන සේවාව ගැන කතා කරන කොට අම්බලන්ගොඩ ආයුර්වේද රෝහලකුත් තිබෙනවා. නගරය තුළ . විශේෂයෙන් ඔබතුමාට කියන්න ඕන . අම්බලන්ගොඩ බස්නැවතුම්පොළේ තිබෙන සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලයේ තිබෙන බෙහෙත් ශාලාවේත් සිටින වෛද්‍ය මහතාත් , ඒ නිලධාරි මහතා ගැනත් අපේ අධීක්ෂණයක් කරන්න තියෙනවා නම් හොඳයි කියනවා. මා ඔය අවස්ථාවල ගියාම ගොඩක් චෝදනා කළා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමිය කතා කරන්නේ ආයුර්වේද වාර්තාව ගැනද ? ඉංග්‍රිසි බෙහෙත් ශාලාව

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ඉංග්‍රිසි බෙහෙත් ශාලාව

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ ඉදිරිපත් කළේ ආයුර්වේද බෙහෙත් ශාලාව. වෙනත් කරුණු යටතේ ඉදිරපත් කරන්න. නැතිනම් පැටලැවෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ආයුර්වේද වාර්තා ගැන කතා කර නිසා තමයි මා කතා කළේ. මා ඔබතුමාගෙන් එම වාර්තාව ඉල්ලන්න තමයි ලැහැස්ති වෙන්නේ. මා එකයි කතා කළේ

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමිය අසන ප්‍රශ්නයට කලින් නගර සභාව යටතේ තමයි මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වැඩ කළේ. එතුමිය අපේ නගර සභාවේ තිබෙන කාර්ය මණ්ඩලයේ යටතේ සිටින නිලධාරියෙකු වශයෙන් තමයි හිටියේ. එමනිසා තමයි නගර සභාවේ තිබෙන ආයතන වල මහජන සෞඛ්‍ය වෛද්‍ය කාර්යාල තිබෙන්නේ. නගරය තුළ සෞඛ්‍ය බලධාරියා වන්නේ නගර සභාවේ සභාපතිවරයා. එමනිසා ඒ බලතල අපි මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමිය අපේ බලතල තමයි ක්‍රියාත්මක කරන්නේ. එතකොට මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වෙනම ස්වාධීන ආයතනයක්

බවට පත් කරනු ලැබුවා ඒ අනුව මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය අපෙන් ගලවා වෙනත් තැනක ස්ථාපනය කරනු ලැබුවා. ආයුර්වේද බෙහෙත් ශාලාව මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි යටතේ තමයි තිබෙන්නේ. නමුත් අපේ ගොඩනැගිල්ලක් තමයි දිලා තිබෙන්නේ. පරිපාලනය තිබෙන්නේ මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමිය යටතේ. එමනිසා ඔබතුමිය කියන කරුණ ගැන අපේ සෞඛ්‍ය කමිටුවට ඉදිරිපත් කරනවා. මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමිය එනවා එම කමිටුවට.

**තීරණය-**

2020 අගෝස්තු මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව ගරු සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

**03.11 අම්බලන්ගොඩ නගරයට ක්‍රීඩා සංකීර්ණයක් හා ජාත්‍යන්තර ක්‍රීඩාංගනයක් ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ,බෝරඹ,තොටුපොල පාර, සුගතබිම්බාරාම මාවත, අංක 35 හි පදිංචි ආර්.ජී.නිමල් චන්ද්‍රසිරි මහතා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ආර්.පී. නිමල් චන්ද්‍රිසිරි මහතා ඉල්ලිමක් කර තිබෙනවා. ජාත්‍යාන්තර ක්‍රිඩාංගණයක් ලබා ගැනිම . අම්බලන්ගෙඩ නගර සභාවට අයිති අක්කර 10ක පුරන් වු ඉඩමක් ඇති බැවින් ජාත්‍යාන්තර ක්‍රිකට් පිටියක් ලබා දෙන ලෙස දක්ෂ ක්‍රිඩකයන් සිංහ ක්‍රිඩා සමාජයට ක්‍රිඩා පිටියක් නොමැතිව බිහි කළ ක්‍රිඩකයන් නම් කියා ක්‍රිඩකයන් 12කුගේ නම් දමා තිබෙනවා. අජිත් ද සිල්වා, උපුල් තරංග , ලසිත් මාලිංග , තිලිණ තුෂාර , තිලකරත්න දිල්ෂාන්, රමේෂ් මෙන්ඩිස් , සමන් ජයන්ත , දිනේෂ් චන්දිමාල් , සික්කුගේ ප්‍රසන්න , සුරංග ලක්මාල් , සරත් අශෝක , නිපුන රංසික යන ක්‍රිඩකයන් බිහිවුනේ අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයෙන් ය. නමුත් පහසුකම් සහිත අම්බලන්ගොඩ ජාත්‍යාන්තර ක්‍රිඩාංගනයක් අවශ්‍යව ඇති බැවින් අවට පාසැල්වල හා ක්‍රිඩා සමාජ වලින් දක්ෂ ක්‍රිඩකයන් බිහිවීමට හැකි බවත් පාසල් ළමුන් , නගර වාසින් ක්‍රිඩා සංගම් අතුළ අපගේ අදහසයි. මේ කෙරෙහි ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කර අම්බලන්ගොඩ නගරයට ක්‍රිඩා සංකීර්ණයක් හා ජාත්‍යාන්තර ක්‍රිඩාංගණයක් ලබා දෙන ලෙස ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මා දන්න විදියට ඔබතුමා කලින් කිවුවා මෙය කරන්න පුළුවන් කියා. මෙය කරන්න පුළුවන් නම් හොඳයි කියා. පහත්බිමනේ ගොඩක් තිබෙන්නේ. එමනිසා මා හිතන්නේ සිංහ සමාජයට වසර 30ක වගේ කාල සිමාවක් දිලා ආපහු ලබා දුන්නා නගර සභාවට. මෙහි සැලස්මකුත් හැදුවා . මා හිතන්නේ ජාත්‍යාන්තර ක්‍රිඩාංගණයක් හදන්න. ගම්වාසින්ගේ දැඩි විරෝධතාවයක් තිබුණා. වනජිවි හා කුරුළු උද්‍යාන කතන්දරයක් තිබුණා. ඉඩම් වල අයිතිකරුවන්ට වන්දි දිලත් නැහැ. ඉතිං මේ යෝජනාව කොහොම වෙතත් මෙය හදන්න පුළුවන්නම් වටිනවා. මෙය ක්‍රමවේදයකට සැදිය යුතුයි කියන කතන්දරයත් මා කියනවා. මොකද අම්බලන්ගොඩ නගරයට ටෙස් ක්‍රිඩාංගණයක් නැහැ. තිබෙන ක්‍රිඩාංගණ නවිකරණය කළ යුතුයි.

ඔබතුමා දැන් එය කරගෙන යනවා. ඒ ගැන සතුටු වෙනවා. මේ ටෙස් ක්‍රීඩාංගණ දෙක ලොකු වටිනාකමක් වෙයි අම්බලන්ගොඩ නගරයට. මෙහි දෙපැත්තක් තිබෙනවා. යම් තටාකයක් ගසා එය තටාකයකට හරි ජලය ටික බස්සවා එහෙම වැඩ පිළිවලක් හරි ගස්සවන්න. එක වටිනවා. ලොකු විරෝධතායකුත් එන්න පුළුවන්. මේ සම්බන්ධව සොයා බලා නගරයට වැඩක් වන දෙයක් නම් ඒ පිළිබඳව කටයුතු කරන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මිට කලිනුත් මේ යෝජනාව ආවා. අපි විරුද්ධ වුණා පක්ෂයක් හැටියට. මොකද අපි දකින්නේ අම්බලන්ගොඩ කියන පටු සිමාවේ ඉඳගෙන නෙමෙයි. අපි දකින්නේ රටක් හැටියට. ලංකාව අද ට්‍රිලියන 1000කට වැඩි මුදලක් ණය වෙලා තිබෙනවා. මොකද ජාතික දේශපාලනය කතා කරන්න වෙනවා මේ ප්‍රශ්නයේදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ක්‍රිඩා පිටිය ගැන කතා කළාම ඇති.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ක්‍රිඩා පිටිය ගැන කතා කරන්න මට එන්න බැහැ එතනට අර වැට කඩා ගෙන තමයි එන්න වෙන්නේ. අපි ඉතිං වැඩියේ කතා කරන්නේත් නැහැනේ. එමනිසා මට ඉඩ දෙන්න මෙකට. අද වනකොට පොළි වාරිකය වැඩියි ණයට වඩා. එහෙම තත්ත්වයක තමයි අපි ඉන්නේ. එච්චරයි. එහෙම තත්ත්වයක ඉන්න රටේ අපි අම්බලන්ගොඩට ටෙස්ට් ක්‍රිඩාංගණයක් ඉල්ලනවා. එතකොට බලපිටියට තව එකක් ඕනේ. අම්බලන්ගොඩට තව එකක් ඕනේ. හැම නගරයටම ටෙස්ට් ක්‍රිඩාංගණ ඕනේ. මොකද ඒ හැම තැනින්ම ක්‍රිඩකයන් බිහි වෙලා තිබෙනවා. මා මේ ක්‍රිඩකයන්ට ගරහන්නේ නැහැ. එගොල්ලන් අපට ආභරණයක්. නමුත් අපි මේ කරන්නේ එක පැත්තකින් අපිට තිබෙන වෙල්ටික ගොඩ කරනවා. ඒ අශ්‍රිතව තිබෙන ගෙවල් යන වෙනවා. ඔය කොච්චර මේ තාක්ෂණයට මේවා කරනවා කිවුවාට ඒක වලකන්න බැහැ. වතුර පාර ආවාම ඉතිරි ටික ගෙවල් යටවෙනවා. එතකොට අපිට දරා ගන්න බැරි ණයක් රටේ තිබෙන වේලාවක අපේ ගමේ දරුවෙකුට බහින්න බැරි ක්‍රිඩාංගණයක් හදනවා අපි තව කෝටි ප්‍රකෝටි ගණන් වියදම් කරලා. මේක මේ ගරු සභාවට තෙරෙන්නේ නැද්ද කියා. මේක අපට විතර ද තෙරෙන්නේ. ඒ හින්දා මා ඉතාම ගරවයෙන් ඉල්ලා සිටිනවා. මමත් මගේ පක්ෂයත් මේ යෝජනාවට විරුද්ධයි. මෙකට ගොඩක් කතා කරන්න පුළුවන්. නමුත් විරෝධතාවය පමණක් වැදගත් වන නිසා මා මූලික කරුණු විතරයි විග්‍රහ කළේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පොඩි අදහස් දක්වන්නේ. නිමල් චන්ද්‍රසිරි මහතා ඉල්ලිමක් කර තිබෙන්නේ . හැබැයි මේ වැඩ කරන්න ආශාව තිබ්බේ. කරන්න බැහැ කියන්නේ ගමේ ගොඩ අයගේ විරෝධතාවයක් තිබෙනවා. අනිත් එක පරිසර අධිකාරියෙන් දෙන්නේ නැහැ මේවාට සහතික. එමනිසා මා හිතනවා මෙය කොහොමත්ම කරන්න බැහැ. අපේ කැමැත්ත දෙන එක තීරණය කරන්න ඕනේ සභාවේ මන්ත්‍රිවරුත් එක්ක කතා කරලා . මිනිසුන්ගේ විරෝධතාවයක් තිබෙනවා

නම් කරන්න බැහැනේ. කෙහොමත් කැමැත්තට කරන්න එපැයි. මිනිසුන් එපැයි මෙහි ජීවත් වෙන්න. අනිත් එක පරිසරය විනාශ වෙනවා නම් දෙන්න බැහැ. ජාත්‍යාන්තර ක්‍රිඩා පිටියක් ගන්න අපි ඔක්කොම කැමතියි. එතකොට ගාල්ලට යන්න ඕන නැහැ. මේක නගර සිමාවත් එක්ක ඉල්ලිමක්නේ. එතුමාගේ ලොකු සිතු පැතුම් ඇති . ඉෂ්ඨ වෙනවා නම් හොඳයි. එක අනිවාර්යයෙන්ම කරන්න බැහැ. කවුරු මොනවා කිවත්. රටේ මුදල් ඇත්තෙත් නැහැ. පරිසරය සම්පුර්ණම දූෂණය වෙනවා. ඔක්කොටම වඩා පෝරඹ අය පාරේ නිදා ගනියි. ඉතිං අපි මිනිසුන් දිහා බලන්න ඕන.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, කතා නොකරන්න හිටියේ. කතා නොකරත් බැහැ. මේ ලිපියෙන් සරලව මෙය ඉදිරිපත් කළාට නිමල් චන්ද්‍රසිරි මහතා තාම උද්යෝගයෙන් සිටින කෙනෙක් ක්‍රිකට් ක්‍රිඩාව මා දන්න තරමින් ඉතිහාසය පුරාම . ඒ තුමාලාගේ කැමැත්ත තමයි මේ ඉදිරිපත් කරන්නේ. ඒ එතුමා තනි පුද්ගලයෙකු විදියට මෙය ඉදිරිපත් කළාට අපි ගරු සභාවක් විදියට මෙහි ගත යුක්තක් තිබෙනවා. දරුවෝ 15000 මේ පාසැල් හතරේ ඉගෙන ගන්නවා. මේ දරුවෝ 15000 න් කි දෙනෙකු මේ ක්‍රිඩාවන් සඳහා යොමු වෙන්නේ. එතකොට මුළු සමස්ත දරු පරපුරටම තමයි මේ යෝජනාව කර තිබෙන්නේ. අපිට විවිධාකාරයේ විරෝධතා සම්බන්ධව ද රජයේ ණය සම්බන්ධව ද මේ සියළු දේ පිළිබඳ තර්ක විතරක් ගෙන්න පුළුවන්. හැබැයි මේ අම්බලන්ගොඩ නගරය තව අවුරුදු 10කින් හරි එතැනට යා යුතු වෙනවා. මේ අද කරන යෝජනාව අද අපි සැලසුම් සකස් කරන ඒවා තමයි තව අවුරුදු 10කින් 15කින් මේ අම්බලන්ගොඩ නගර සභාව පවතින්නේ. එතකොට එදා සභාපතිව සිටි ජී. එම්. එස් මහතා හල්වතුර යෝජනා ක්‍රමය යටතේ සැලසුම් හදලා තිබෙන්නේ. දස අවුරුදු විසි අවුරුදු සැලසුම් හදලා තිබෙන්නේ. සියල්ල යෝජනා කර තිබෙන්නේ. අපි ඒවා ඉදිරියට ගෙන ගියේ නැහැ. යන්නෙත් නැහැ. එතකොට අම්බලන්ගොඩ කවදා හරි දිනයක අම්බලමක්. මේ විදියට ගියහොත්. මේවාට මුහුණ දෙන්න තිබෙනවා. ගරු කරන්න තිබෙනවා. මේ ක්‍රිඩා පිටි සම්බන්ධව අපි අම්බලන්ගොඩට නගර සභාවට මේ මුදල් නැති වුණත් ඒ ආකාරයෙන් වත්කමක් නැති වුණත් ක්‍රිකට් ආයතනය තිබෙනවා. ඊට අමතරව ක්‍රිඩා අමාත්‍යාංශයක් තිබෙනවා. කිසි කෙනෙකුට කියන්න බැහැ ගරු පාර්ලිමේන්තුව හෝ ගරු ඇමතිවරයා හෝ ක්‍රිකට් ආයතනය හෝ මේ ක්‍රිඩා සංකිර්ණය නොහදාවි කියා අම්බලන්ගොඩ. මොකද අම්බලන්ගොඩ කියන්නේ ප්‍රසිද්ධ නගරයක්. ඒ වගේම විශාල ක්‍රිකට් ක්‍රිඩකයන් ජාත්‍යාන්තරයට බිහි කරපු නගරයක්. මේ නගරයට උරුමයක් තිබෙනවා ක්‍රිඩා සංකිර්ණයක් ලබා ගන්න. එය ක්‍රිඩා කරන දරුවන්ගේ අයිතිය. ඒ අයිතිය නැති කරන්න අපිට සදාචාරත්මක අයිතියක් නැහැ. එපමණයි . ආණ්ඩුව සම්බන්ධයෙනුත් කතා කරපු නිසා ආණ්ඩුව සම්බන්ධයනුත් යම් ප්‍රකාශයක් කරන්න තිබෙනවා. එතුමාගේ ප්‍රකාශයට විරුද්ධව නෙමේ. අපිටත් ආණ්ඩුව පැත්තෙන් කියන්න තිබෙනවා. ඔබතුමා ඒ අවස්ථාව දිපු නිසා මා ඒ වචන පෙළ විතරක් කියනවා. සම්ප්‍රදායානුකුලව මා ඒවා කතා කරන්නේ නැහැ. මාතෘකාවෙන් පිට. හැබැයි මේ සභාවේ දැන ගැනීමටත් මාධ්‍යවේදින් දන්නවා ඇති මේක . ගිය සතියේ මේ ආණ්ඩුව ගෙව්වා පසුගිය ආණ්ඩුවේ ණය යූඑස් ඩොලර් ලක්ෂ 1000 ක ණය මුදලක්. මේ ආණුඩුව ගෙව්වා. ගිය සතියේ මහ බැංකුව ගෙව්වා. රුපියල් වලින් ගණන් හදන්න බැහැ අපිට. යූඑස් ඩොලර් ලක්ෂ 1000 ක මුදලක් . මේක නොගෙවීම තුළ ලංකාව ණය දිමේ අවධානම් රටක් හැටියට හඳුන්වා තිබුණා. ණය දිමේ ආයතන.

ඒ සියල්ල අභිබව යාමින් අතිගරු ජනාධිපතිතුමත් , ගරු අගමැතිතුමත් , ආණ්ඩුවත් ඒ සවරින් ගිවිසුම නිදහස් කළා ගෙවලා. ගරු සභාපතිතුමනි , ආණ්ඩුව භාර ගත්තේ ආණ්ඩුව කරන්න පුළුවන් නිසා. එතකොට කවුරු හෝ විසින් කරන ලද ණය ණය තමයි. මේ දක්වා ආණ්ඩුව විසින් කරන ලද ණය ආණ්ඩුව විසින් ඔනේ ගෙවන්න. ඒ ආණ්ඩුවලින් අපි ඇහුවේ නැහැ . ඔබලා මේ ණය කරලා අපි මේ ණය ගෙවන්න ඕනේ කියා. ගෙවන්න ඕනේ. එමනිසා එය පැහැදිලි කිරීමක් කළේ. අදහස්වලට විරුද්ධව නෙමේ. ආණ්ඩුවේ තත්ත්වයත් මේ ජනතාවට මාධ්‍ය ඉන්නවා. අපි පැහැදිලි කළ යුතුයි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, නවක මන්ත්‍රිවරු රාශියක් සිටිනවා. මා දැනුවත් කරන්න ඕනේ මේ කරුණ සම්බන්ධව. ඔය යෝජිත ස්ථානය ක්‍රිකට් ක්‍රිඩාංගනය සැදිම සඳහා මෙතැන අක්කර 14ක් තිබුණා . අපි මේ 14 තුළ ජාත්‍යාන්තර ක්‍රිඩා පිටියක් සැදිම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයත් සමඟ එකඟතාවයකට පැමිණුනා. ඒ පැමිණුනාම ඔවුන්ට මුදල් ලබා දීමේ. නගර සභාවට ලබා දිමේ ක්‍රම වේදයක් එදා වගේම තිබෙන බාධකයක් තිබුණා. ඔවුන්ට මේ මුදල් ලබා දිමේ හැකියාව තිබෙන්නේ සාමාජිකයන් ඡන්දදායකයන් වශයෙන් තිබෙන ක්‍රිඩා සමාජයකට පමණයි. එමනිසා එක මෙවලමක් වශයෙන් අපි යොදා ගත්තේ සිංහ ක්‍රිඩා සමාජය. සිංහ ක්‍රිඩා සමාජය සමඟ වසර 33ක මෙම ස්ථානයේ ක්‍රිකට් ක්‍රිඩාංගනයක් ඉදිකිරිම පිළිබඳ අපි එකඟතාවයකට පැමිණුනා. ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දිලා සභා තින්දුවක් මගින් සිංහ ක්‍රිඩා සමාජය සමඟ ගිවිසුමකට ඇතුල් වුණා. ඒ ගිවිසුමට ඇතුල් වුණාට පස්සේ ඔය කියන පරිසර ප්‍රශ්න නෙමේ. අපි අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම සඳහා අප මුලින්ම කළේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් මෙම කොටස පිරිම නිසා වැසි ජලයෙන් යටවෙනවා කියන අදහස තුළ ඔබතුමාලා ප්‍රකාශ කරන ආකාරයට අපිත් එය කල්පනා කළා. එවකට සිටි සභාව. ඒ සභාව කල්පනා කරලා අපට ලබා දුන්නා වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ලක්ෂ 65 ක වාරිමාර්ග මෙවලම් වගයක්. එම ලක්ෂ 65 ම මෙවලම් වල අපි වැඩ අවසන් කළා. ඒ වගේම ඊට අමතරව කියන්න ඕනේ. අම්බලන්ගොඩ ප්‍ර දේශයේ අපි හැදුවා අක්කර 5ක වැවක් හැදුවා. මේ ක්‍රිඩාංගණය සැදිම සඳහා. පොල්වත්ත පන්සල පිටුපස අක්කර 5ක වැවක් හැදුවා. මේ අක්කර 14න් අක්කර 5ක වැවක් හැදුවේ. මේ ඉතිහාසය තුළ පළාත් පාලන ආයතන තුළ වැවක් හැදුවා නම් අපිම විතරයි. එදායින් පසු පොල්වත්ත ප්‍රදේශය ගංවතුරෙන් යටවෙලා. තව අවුරුදු 15ක විස්සකට වත් . ඒ එක්කම අපි ජනතා විමුක්ති පෙරමුණ සමඟ පරිවාස ආණ්ඩුවකට ගියා. පරිවාස ආණ්ඩුවේ මෙයට විරුද්ධව ඔබතුමලාගේ බොහොම පිරිසක් හිටියා. කළුවඩුමුල්ලේ ආරියදේව ස්වාමින් වහන්සේ මේ ප්‍රදේශයම අම්බලන්ගොඩ නගර සභාවේවත් , අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාවේ වත් , බලපිටිය ප්‍රාදේශිය සභාවේ වත් , රත්ගම ප්‍රාදේශිය සභාවේ වත් කරන්දෙණිය ප්‍රාදේභිය සභාවේ වත් කිසිම තැනක නොගිහින් රැස්විමක් තියන්නේ නැතුව අම්බලන්ගොඩ ප්‍රදේශයටත් අයිති වෙන නැති විදියට බස්නැවතුම්පොළත් මෙයට අයිති කර තිබෙනවා. වනජිවි කලාපයක් කියා ගැසට් එකක් නිකුත් කළා. ඔන්න ඔතන තමයි බාධාව ඇතිවුණේ. ඒ බාධාව අපි දන්නවා ජතතා විමුක්ති පෙරමුනත් එක්ක තිබෙන. ඉතිහාසයේ පෙකණිවැල කඩාගෙන ආපු බාධාවක් මේක. නමුත් ඒ බාධාව අපි කවදාහරි අපි ඉවත් කර ගන්නවා. මෙය සාදන්න අපිට අම්බලන්ගොඩ නගර සභාවට සතයක්වත් වියදම් වෙන්නේ නැහැ. මෙය අපේ අනාගත ක්‍රිකට් ක්‍රිඩකයන් වෙනුවෙන් අපි

කරන්න ඕන දෙයක්. මේක කරන්න ඕනේ කවදා හරි . අපි මේ පුටුවල ඉන්නත් පුළුවන්. අපි මේ දර්ශනය ලබා දෙන්න ඕන. ක්‍රියාත්මක වෙන්න ඕනේ. අම්බලන්ගොඩ නගරය තුළ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ඡන්දය ලබා දෙන පුද්ගලයින් 6කු සිටිනවා. සාමාන්‍යයෙන් පිට පළාත් වල ඡන්දය ලබා දෙන එක්කෙනෙකු හෝ දෙදෙනෙකු පමණයි සිටින්නේ. හය දෙනෙකු සිටින එකම නගරය අම්බලන්ගොඩ පමණයි. එමනිසා මේ තක්සේරුව තුළ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් මෙය ලබා ගන්න පුළුවන්. ඒ අවස්ථාව අම්බලන්ගොඩ නගරයට ලැබිලා තිබෙනවා. හැබැයි මේ හය දෙනා හැමදාම ඉන්නේ නැති වෙන්නත් පුළුවන්. එමනිසා මේ අය ඉන්න දවස්වල විතරයි කර ගන්න පුළුවන්. එමනිසා මේ දෙයට අපි එකතුවෙලා වැඩ කරන්න ඕනේ. මීන් ලැබෙන ප්‍රතිඵලය මුළු ප්‍රදේශයටම දැන් මෙතැන නම් 12ක් ඉදිරිපත් කළා. එම නම් 12න් 5කු ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ නායකත්වය දරා තිබෙනවා. උපුල් තරංග , ලසිත් මාලිංග , තිලකරත්න දිල්ශාන් , දිනේෂ් චන්දිමාල් සුරංග ලක්මාල් කියන 5 දෙනාම නායකත්වය දරා තිබෙනවා. එවැනි ක්‍රිඩකයන් රාශියක් මේ ක්‍රිඩාංගණයෙන් බිහිවෙලා ගිහින් තිබෙනවා. මේ තිබෙන බාධක මැද්දේ අපි මේ අයට වඩාත් ඵලදායි ස්ථානයක් ලබා දෙන්න ඕනේ. අම්බලන්ගොඩ නගරය ක්‍රිකට් ක්‍රිඩාවට ඉතා හොඳ ක්‍රිඩකයන් බිහි කරන නගරයක්. එමනිසා අපේ රටට ක්‍රිඩාවෙන් බිහිවෙච්ච අය සිටිනවා. ක්‍රිකට් ක්‍රිඩාවෙන් , බැඩ්මින්ටන් ක්‍රිඩාවෙන් , ටෙබල් ටෙනිස් ක්‍රිඩාව ට ජාත්‍යාන්තර වශයෙන් අපේ ක්‍රිඩකයන් ගිහින් තිබෙනවා. අම්බලන්ගොඩ නගර සභාවේ පරම යුතුකමක් වෙනවා සියල්ලම සංවර්ධනය කිරිම. ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබා දීම. මේ කටයුත්ත කර තිබෙන්නේ නිතියට අනුව කර තිබෙන්නේ. නිතියට අනුව මෙය සිද්ධ කරන්න ඕන. ඒ අනුව අපි කටයුතු කරන්න ඕන. අපි ප්‍රතිපත්තියක් වශයෙන් මේ නගරය තුළ කළ යුතුයි කියන අදහසේ සිටිම සභාවක් විදියට වැදගත් වෙයි කියා මා කල්පනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මගේ අදහස සියයට සියක්ම සම්පූර්ණ එකඟ වෙනවා. සරත් මන්ත්‍රිතුමාත් ප්‍රකාශ කළා. මෙදේ විය යුතුයි අම්බලන්ගොඩට. එක එක බාධා තිබෙන්න පුළුවන්. අපේ සරත් මන්ත්‍රිතුමා සමහර අදහස් දැකුවුවා. එය අදහස් වල හිටියොත් අම්බලන්ගොඩට මෙය ලබා ගන්න බැරි වෙනවා. අරුණ ක්‍රිඩා සමාජය , සිංහ ක්‍රිඩා සමාජය , රියෝ ක්‍රිඩා සමාජය . සිංහ ක්‍රිඩ සමාජයෙන් තමයි මේ හට දෙනාම බිහිවෙලා තිබෙන්නේ. කොහොම හරි මෙයට යන් කියන එක තමයි මගේ අදහස. අපේ දූ දරුවන් වෙනුවෙන් අපි කොහොම හර මෙය එකතු වෙලා කරන්න. හැමෝම මෙයට එකඟතාතවය පළ කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඡන්දය තිබෙන්නේ ක්‍රිඩා සමාජ හතරයි. ගාල්ල ක්‍රිඩා සංගමය සහ පළාත් ක්‍රිඩා සංගමය. මෙහේ තමයි පච්චිච් වෙන්නේ. එතකොට හයක් තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දිස්ත්‍රික්කයට එකයිනේ දෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේක දුන්නාට පස්සේ අපිට වියදමක් නැහැ. ඒ අය සම්පූර්ණ වියදම දරනවා. මෙය නගර සභාවට බරක් වෙනවා . දැන් මේ හදන ලද ක්‍රිඩාංගණය නඩත්තු කරන්න රු.16000 ක් යනවා. ක්‍රිඩා තරඟයක් තිබුණත් නැතත් රු.16000 ක් යනවා. මේ ක්‍රිඩාංගණයක් හැදුවාම ලොකු විශාල මුදලක් යනවා. එතකොට ඒ මුදල දරන්න පුළුවන් ආයතනයකට ලබා දීම සුදුසුයි. ක්‍රිඩකයන් ටික එහි සෙල්ලම් කරාවි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, ගරු සරත් චන්ද්‍ර මන්ත්‍රතිතුමා කිවු පරිදි ගරු මන්ත්‍රිතුමාගේ අදහස් වලට අපි ගරු කරන්න ඕන. පරිසරයට ආදරය කරන චරිත . වෙල්යායවල් වනජීවි කාලප ඒවා හොඳයි. අපි තව ඉදිරියට දශක හතරක් පහක් බලා තමයි අපි වැඩ කරන්න. එහිදි පෝරඹ වැඩ කරද්දි ගැටළු තිබෙනවා. එතැන පහත් බිම් තිබෙන නිසා. ප්‍රශ්න තිබෙනවා. මිනිසුන්ට ඕක ලොකුවට කා වදිනවා. කොටසක් ඉන්නවා මෙය කරන්න එපා කියන තැන . කොටසක් ඉන්නවා මෙය කරන්න කියන කියන තැන. පරිසරයත් එක්ක අපි බලන කොට අපේ ප්‍රකාශ හරි . මෙතුමාගේ ප්‍රකාශ හරියි. එය නිර්මාණය කරන්නේ නගරයක් වෙනුවෙන් , රටක් වෙනුවෙන් මෙය ලබා ගත්ත දේ කරන්න පුළුවන් එය ලබා ගැනීමට කටයුතු කරන්න. ප්‍රශ්න ගැටළු ඇති නොවන්න.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභාවට අයත් අක්කර 14 ක පුරන් වූ ඉඩමක් ඇති බැවින් එහි ජාත්‍යාන්තර ක්‍රීඩාංගනයක් සාදා දෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ, පෝරඹ, තොටුපොල පාර, සුගතබිම්බාරාම මාවත, අංක 35 හි පදිංචි ආර්.ජී.නිමල් චන්ද්‍රසිරි මහතා විසින් එවා ඇති ලිපිය ගරු සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**03.12 අමාත්‍ය මණ්ඩල තීරණ: පොදු මහජනතාව වෙත බදු සහන ලබාදීම සඳහා පළාත් පාලන ආයතනවලින් දැනට අයකරනු ලබන වරිපනම් බදු ප්‍රතිශතය අඩු කිරීම යන මැයෙන් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

අමාත්‍ය මණ්ඩල තීරණ: පොදු මහජනතාව වෙත බදු සහන ලබාදීම සඳහා පළාත් පාලන ආයතනවලින් දැනට අයකරනු ලබන වරිපනම් බදු ප්‍රතිශතය අඩු කිරීම. ඒ අනුව පොදු මහජනතාව වෙත බදු සහන සලසා දීම සඳහා පළාත් පාලන ආයතනවලින් දැනට අයකරනු ලබන වරිපනම් බදු ප්‍රතිශතය අඩු කිරිම සම්බන්ධයෙන් 2020.02.24 දින ගරු අග්‍රමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ල සාකච්ඡාවේ තීරණය, අමාත්‍ය මණ්ඩල සංදේශයක් ලෙස ඉදිරිපත් කර ඇති නමුත් දැනට පවතින වරිපනම් බදු ප්‍රතිශතය වෙනසකින් තොරව වසර 02ක කාල සීමාවක් සඳහා කවදුරටත් පවත්වා ගෙන යාම සුදුසු බව කැබිනට් මණ්ඩලය තීරණය ඇති බව දන්වා සිටිනවා. මෙය සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරනවා.

**තීරණය-**

**අමාත්‍ය මණ්ඩල තීරණ: පොදු මහජනතාව වෙත බදු සහන ලබාදීම සඳහා පළාත් පාලන ආයතනවලින් දැනට අයකරනු ලබන වරිපනම් බදු ප්‍රතිශතය අඩු කිරීම** යන මැයෙන් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවා ඇති ලිපිය ගරු සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**03.13 ඉදිරිපත් කරන වරිපනම් බදු විරෝධතාවය පිළිබඳව සලකා බලා සහනයක් ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ,ගාලු පාර,අංක 455, රැමෝන් බීච් රෙසෝට් හි එච්.පී.ටී.එස්.ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වර්ෂ 2019 අප්‍රේල් මාසයේ ඇති වූ පාස්කු සිද්ධිය හා මේ වනතුරු පවතින කෝවිඩ් 19 වසංගතය නිසා සංචාරක කර්මාන්තය මුලුමනින්ම අකර්මන්‍ය වී ඇති අතර ආයතනයේ ක්‍රියාකාරිත්වය හා ආදායම් සම්පූර්ණයෙන්ම නැවතී ඇත. තවද මෙම බැරෑරුම් තත්ත්වය  සලකා බලා පැවති හා පවතින රජයන් විසින් කරන ලද නියෝගයන් වලට අනුව අප ආයතනයට ණය පහසුකම් සලසන ලද මූල්‍ය ආයතනයද ණය පියවා ගැනීම දැනට මෙම වර්ෂ අවසානය වන තෙක් අත් හිටුවා ඇත. ඒ අනුව ඔබ විසින් එවා ඇති ලිපියට අනුව හිඟ බදු මුදල් ගෙවීම සඳහා ඉතා සාධාරණ සහන කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටි.  තවද මෙම දේපල වර්ෂ 2019 සිට නිවාසයක් ලෙස භාවිතා කරන නිසා ඉදිරිපත් කරන බදු විරෝධතාව සලකා බලා සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටි. එය සභාවට ඉදිරිපත් කරලා තින්දුවක් ගැනීම සුදුසුයි කියා තිබෙනවා. මේ තැනැත්තාගේ වාර්ෂික වටිනාකම රු.1285714 ක් කියා තිබෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා මෙය කතා කරන්න හිටියේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හැබැයි මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා. මා එකත් කියන්න ඕනේ. මේ තැනැත්තාගේ ලක්ෂ තුනක පමණ හිඟයක් තිබෙනවා. ඉදිරියට දෙන එකේ නෙමේ . මේ හිඟය අනිවාර්යෙන්ම ගෙවිය යුතුයි. මෙතන මේ අයගේ හිඟය කියක් තිබෙනවාද ? හිඟ මුදල 301499.99. හිඟය රු34071.43. 2020.03.30 දිනට හිඟ මුදල රු.370998.52 කාර්තුවකට මෙයාට වැටෙනවා රු35317.57

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, හිඟ වාරික අයකරගැනිම නෙමේ. මා හිතන්නේ වරිපණම් ගෙවීමේදී අපිට වරිපණම්කරුවන් විටිනි විට කතා කරනවා. මේ ඊයේ පෙරේදා කතා කළා තල්ගස්ගොඩ ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙක්. එතුමාට රු.13000 යි කිවුවා වාර්ෂික වටිනාකමට තමයි වරිපණම් අය වුණේ. මේ පාර දෙලක්ෂ ගණනක් ඇවිත් තිබෙනවා කිවුවා වරිපණම්. මා හිතන්නේ එහෙම විශාල මුදලක් ලබා දෙනකොට ඒ ව්‍යාපාරිකයන් ඉතාමත් අසරණ තත්ත්වයට පත්වෙනවා.

මොකක් දන්නේ නැහැ එයට හේතුව. තක්සේරුව රු.13000 වූ එක එකපාරට ලක්ෂ දෙක දක්වා වැඩි වෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔය කියන පුද්ගලයා මා සමඟ සාකච්ඡා කළා. විරෝධතාවයට අඩුවෙලා නැත්තේ මාත් එයාගෙන් සරලව ඇහුවා . වරිපණම් වලට එන රජයේ තක්සේරුකරු අහන ප්‍රශ්නය තමයි මාසයකට ඔයාගේ ඉඩම බද්දට දුන්නොත් කියක් ගතහැකිද කියා. එතුමා කියපු ගාණ හැටියට ඔය කියපු විදියට දෙගුණයක් වෙන මිසක අඩුනම් වෙන්නේ නැහැ. ඔන්න ඕක තමයි ඇත්ත තත්ත්වය. දැනට තක්සේරු දෙපාර්තමේන්තුව දිලා තිබෙන්නේ ඒ දිපු මුදලට වඩා 50% කට වඩා අඩු මුදලක් දි තිබෙන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

ඒ සම්බන්ධව මා දන්නේ නැහැ. එකපාරටම ව්‍යාපාරයක් කරගෙන යනකොට වාර්ෂික බද්ද දෙලක්ෂ ගණනක් යනවා කියන්නේ දරාගන්න බැහැ . කොහොමද එහෙම වෙන්නේ. එතනම ඉන්නවා අහිංසක මනුස්සයෙක්. කුරුඳු ඉඩම් උදලු ගහලා ජිවත් වෙන මනුස්සයකු. ඒ මනුස්සයාට වාර්ෂික බද්ද ඇවිත් තිබෙන්නේ රු 127/= මුදලක් පමණයි. දැන් මේ පාර දෙදහස් ගණනක් ඇවිත් තිබෙනවා. එතකොට සියයට කියකින්ද වැඩි වෙන්නේ. මොකක් ද මේ සම්බන්ධව වැඩි වෙන්නේ. දිගින් දිගටම කතා කරනවා. මේ වරිපණම් බදුකරුවන් . අපේ නිලධාරින්ට කියන්න මේ ගැන සොයා බලන්න කියා. ඒ මනුස්සයා සංශෝධනයක් සඳහා ඉදිරිපත් කළා කිවුවා. නමුත් එහිදි ක්‍රියාත්මක වුණේ නැහැ කිවුවා. මට ඇවිල්ලා කිවුවා බලන්න කියා. මෙච්චර මුදලක් කොහොමද ගෙවන්නේ කියා. ලක්ෂ දෙකයි ගණනක් . ගල් වැඩපළක් . එච්චර මුදලක් ඇයිද දන්නේ නැහැ තක්සේරු වුණේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා මේ අපේ ආදායම් පරික්ෂක මහත්වරුන්ටවත් කිසිම නිලධාරියෙකුටවත් මෙයට නිසි පිළිතුරක් දෙන්න බැහැ .  මේ තක්සේරු කරන සියල්ලම කරන්නේ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව. එතකොට රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් දෙන තක්සේරුවට අපි බැඳී සිටිනවා. ඒ බැඳී සිටින කොට තක්සේරුකරුට එන වාර්තාවට විරෝධතාවයක් දෙන්න පුළුවන්.  මේ පිළිබඳ නිති වෙනස් කිරිමේ ජාතික කමිටුවේ සාමාජිකයෙකු කළා පසුගිය කාලයේ ගරු ජානක බණ්ඩාර තෙන්කොන් මැතිතුමා දැනට අවුරුදු 10 කට 7කට කලින්.  ඉතිං මා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඇසුවා රජයේ තක්සේරු කිරිමේ ප්‍රතිපත්තිය මොකක්ද කියා. එතකොට තමයි මාත් දැන ගත්තේ රජයේ තක්සේරුව මොකක් ද කියා. තක්සේරු කිරිමේ ප්‍රතිපත්තිය. එතකොට ඔවුන් කියන්නේ ඒ ස්ථාන මාසයකට බදු දෙන මුදල කියද ?  ඒ මුදල වැඩි කිරිම 12  . ඊට පස්සේ අපි තක්සේරු කරනවානේ 8% ක් ගන්න 12% ගන්න කියා. එතකොට එය බෙදිම 100 වැඩි කිරිම 11. ඕක තමයි උත්තරය තක්සේරුකරු ගෙවන්න ඕන. බද්දෙන් සම්පූර්ණ එකතු වන මුදලින් 11% ක් ගෙවන්න ඕන. එහෙම නැතිනම් නේවාසිකව නම් 7% ක් ගෙවන්න ඕන. දැන් මේ තක්සේරු දෙපාර්තමේන්තුවට විරෝධතාවය දමන අපේ වැසියෝ දෙන පිළිතුර තමයි ඒ ගොල්ලන්ගෙන්ම අහනවා මහත්තයා මහත්තයාගේ ගෙදර බදු දිලා තිබෙන්නේ කියටද

කියා. එතකොට රු .5000 දිලා දිබේ නම් 5000 බෙදිම 100 වැඩිකිරීම 7. එතකොට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් දෙන මුදල් ගණන බැලුවොත් එහෙම ඔබතුමා ඔය කියපු ගල් වලේ පුද්ගලයා මගෙන් ඇහුවාම ඔය ප්‍රශ්නයම මේ දෙවන ප්‍රමාණය වගේ දෙගුණයක් ගෙවන්න ඕනේ. ඒ කියන්නේ එත් අඩුවෙන් තමයි තක්සේරු කර තිබෙන්නේ. මා එයාට පැහැදිලි කළා . මේ ඔයාට ලැබි තිබෙන පිළිතුර ලැබි තිබෙන්නේ ඔයා දිපු පිළිතුර අනුවම තමයි. එමනිසා ඉදිරියට ඔයා ඒ අනුව කටයුතු කරන්න කියා. තක්සේරු දෙපාර්තමේන්තුව තක්සේරු කරන්නේ එවැනි ක්‍රමවේදයකට. ඉතිං අපිට කරන්න දෙයක් නැහැ. තක්සේරු දෙපාර්තමේන්තුව ගන්න තින්දුවට පිළිගැනීමට අපි බැඳි සිටිනවා. ඒ වගේම අපේ සියළුම මහජනතාවත් බැඳි සිටිනවා. අඩු කරන්න නගර සභාවට හැකියාවක් නැහැ. නගර සභාවට හිතෙනවා නම් අයකරන ප්‍රතිශතය වැඩි නම් ඊළඟ අයවැයේදි අඩු කරන්න පුළුවන්. පසුගිය වතාවේ 8% හා 12%ක් ව තිබූ බදු ප්‍රතිශතය 1% කින් අඩු කළා. මේ සභාව. ඒ 1% අඩුවීම නගර සභාවෙන් ලක්ෂ 25 ක මුදලක් අඩු වුණා. ඉතිං එවැනි ක්‍රියාමාර්ගයකට යනවා මිසක අපිට වෙන ක්‍රමයක් නැහැ දකින්න. එය සභාව විසින් අඩු කරන්න තිබෙන එකම අවස්ථාව අයවැය ලේඛණයකදී. අයකරන ප්‍රතිශතය අඩු කිරිම. එ අඩුකිරිමත් එක්ක අපිට නැති වෙනවා මුදලක්. ඒ මුදල නැති විමත් එක්ක ඒ මුදල අඩු කර ගන්නේ කෙසේද කියා අපි කල්පනා කර බලන්න ඕන.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ ලිපිය අනුව ඉල්ලා තිබෙන්නේ කාලයක් නේ. ඒ කියන්නේ තක්සේරුව අනුව බදු ප්‍රමාණය. එය ගණනය කළාම එය ගෙවන්නත් දැන් හිඟයක් තිබෙනවා. ගියපාර ඉල්ලා තිබෙන්නේ එක අඩු කර ගන්න කියා. මා නම් කියන්නේ මේ ලිපියට කතා කරන්න ඉස්සරවෙලා හිඟය ගෙවන්න කියන්න. එය ගෙවා අවසන් කර ඊට පස්සේ ක්‍රමවේදයකට බලන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මෙහෙම තින්දුවක් ගන්න. මේ ප්‍රශ්නය තිබෙන්නේ අද වෙනකොට හෝටල් වලට තමයි. සංචාරකයන් නැතිවිම නිසා හෝටල් වලට. හෝටල් සඳහා ලියා පදිංචි වෙලා සිටින ඒ අයට විතරක් මාස තුනක සහනයක් ලබා දෙන්න. අය කර ගැනීමට . මා එහෙම යෝජනා කරනවා. හිඟය ගෙවන්න ඕනේ. මේ මා කරන ලද යෝජනාව කැමති නම් ස්ථිර කරන්න.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, එය මා හිතන්නේ විදේශිකයන්ට තමයි දෙන්නේ. සර්ව සාධාරණව මොකක් හරි කරන්න. දැන් ආදායම අඩුවෙලා තිබෙන්නේ. දැන් විදේශිකයන් පැමිණෙන්නේ නැහැ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

එක තමයි කියන්නේ. මේ තැනැත්තා හිඟ මුදල ගෙවන්න ඕනේ. අලුත් තිබෙන වරිපණම් ගෙවන්න තව මාස තුනක් කල් දෙනවා. ඒ කල්දීම මත ඉදිරියට කටයුතු කරන්න.

**තීරණය-**

ඉදිරිපත් කරන වරිපනම් බදු විරෝධතාවය පිළිබඳව සලකා බලා සහනයක් ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ, ගාලු පාර, අංක 455, රමෝන් බීච් රෙසෝට් හි එච්.පී.ටී.එස්.ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව හිඟ මුදල අය කරගත යුතු බවටත්, හෝටල් සඳහා ලියාපදිංචිව සිටින සියලු පුද්ගලයින්ට වරිපනම් බදු ගෙවීම සඳහා මාස 03 ක සහන කාලයක් ලබාදීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.14 දේශපාලන හා දේශපාලන නායකත්වය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව පිළිබඳව ශ්‍රී ලංකා පදනම් ආයතනයෙන් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ශ්‍රී ලංකා පදනම් ආයතනය දේශපාලනය හා දේශපාලන නායකත්වය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව. එය අවශ්‍ය කෙනෙක් සිටිනම් ඉල්ලා ගන්න.

**තීරණය-**

**දේශපාලනය හා දේශපාලන නායකත්වය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව පිළිබඳව ශ්‍රී** ලංකා පදනම් ආයතනයෙන් එවා ඇති ලිපියේ පිටපත් සියලු ගරු මන්ත්‍රීවරුන් වෙත ලබාදෙන ලෙස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් දන්වන ලදී.

**03.15 2020.10.27 දිනට අ.ම.කරුණාරත්න අනුස්මරණ දෙටු පියස මුදල් අයකිරීමකින් තොරව ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ,ජ්‍යෙෂ්ඨ පුරවැසි සමාජයේ ලේකම් විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

2020.10.27 දිනට අ.ම.කරුණාරත්න අනුස්මරණ දෙටු පියස මුදල් අයකිරීමකින් තොරව ලබාදෙන ලෙස ඉල්ලා ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ජ්‍යේෂ්ඨ පුරවැසි සාමාජික මහත්මීන් සඳහා වෛද්‍ය සායනයක් සහ වෛද්‍ය දේශනයක් පැවැත්වීමටට අදහස් කර ඇත. ඒ සඳහා නගර සභාව මඟින් පාලනය වන අ.ම. කරුණාරත්න අනුස්මරණ දෙටු පියස ලබා ගැනීමට අදහස් කරන බැවින් 2020.10.27 එම ස්ථානය පරිහරණය කිරිමට අවශ්‍ය අනුමැතිය ලබා දෙනලෙස කාරුණිකව ඉල්ලා සිටි. යටින් ලියා තිබෙනවා මේ පහසුකම් මුදල් අයකිරිමකින් තොරව ලබා දෙන්නේ නම් මැනවි කියා. එය ලබා දෙන්න ජ්‍යේෂ්ඨ පුරවැසියන් සඳහා.

<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මෙම ජ්‍යේෂ්ඨ පුරවැසියන්ට අ.ම. කරුණාරත්න දෙවු පියස කිලිටි වෙලා. සවුත්තු වෙලා. ඇතුළට යන්නත් ආමාරුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි එහි තින්ත ආලේප කරන්නම්.

**තීරණය-**

2020.10.27 දිනට අ.ම.කරුණාරත්න අනුස්මරණ දෙවු පියසෙ මුදල් අයකිරීමකින් තොරව ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ, ජ්‍යෙෂ්ඨ පුරවැසි සමාජයේ ලේකම් විසින් එවා ඇති ලිපිය අනුව ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.16 ජනාධිපති කාර්යාලයෙන් යොමුකරන ලද මහජන පැමිණිලි යටතේ අම්බලන්ගොඩ,හල්වතුර ව්‍යාපෘතියට පවරාගෙන ඇති ඉඩම් පිළිබඳ වන්දි නොගෙවීම සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ජනාධිපති කාර්යාලයෙන් යොමුකරන ලද මහජන පැමිණිලි . අම්බලන්ගොඩ හල්වතුර ව්‍යාපෘතියට පවරාගෙන ඇති ඉඩම් පිළිබඳව විමසීම පිළිබඳවයි. පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් එවා තිබෙනවා. ඒ අනුව අම්බලන්ගොඩ පෝරඹ රොබට් වික්‍රමසූරිය පාරේ 18/1 හි පදිංචි සී. කේ. එල් ගුණවර්ධන මහතා විසින් උක්ත කරුණ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් යොමුකර ඇති 2020.01.14 දින ලිපියට අදාල කරුණු සම්බන්ධයෙන් ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් පරීක්ෂාවක් සිදු කරනු ලදුව අංක පපාපකො/ගා/වි/01 හා 2020.08.26 දැනැතිව වාර්තාවක් මා වෙත යොමුකර ඇති අතර ඒ අනුව , පහත නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කර ඇත.

නිරික්ෂණ

01.) අම්බලන්ගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අම්බලන්ගොඩ නගර සභාවේ එකඟතාව ඇතිව හල්වතුර ඔය ව්‍යාපෘතිය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් හල්වතුර ප්‍ර දේශයේ අක්කර 230 ක පමණ ප්‍රමාණයක් 1988 වර්ෂයේ අත්පත් කර ගැනීමට කටයුතු කර ඇති අතර , ඉන් අක්කර 200ක පමණ ප්‍රමාණයක භුක්තිය 1989/08/25 දින අම්බලන්ගොඩ නගර සභාවට පවරා ඇති බවත් ,

02.) උක්ත අත්පත් කරගත් ඉඩම් සඳහා මේ වනවිට නාගරික සංවර්ධන අධිකාරියෙන් රු.ලක්ෂ 37.5 ක් ගෙවීම් සිදු කර ඇති බවත් අම්බලන්ගොඩ නගර සභාව විසින් රු.මිලියන 26.8 ක වන්දි මුදල් හා පොළි ගෙවීමට නියමිත බව ගොනුවේ ලිපිවල සඳහන් වන බවත් , උක්ත වන්දි මුදල් හා පොළි අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කරන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය හා අම්බලන්ගොඩ

ප්‍රාදේශිය ලේකම් වරයා විසින් වරින් වර අම්බලන්ගොඩ නගර සභාව දැනුවත් කර ඇති බවත්

03.) අත්කර ගත් ඉඩම් සඳහා වන්දි පරීක්ෂණ පවත්වා වන්දි තීරණය අනුව වන්දි මුදල් ගෙවීමට මූල්‍ය ශක්තියක් අම්බලන්ගොඩ නගර සභාව සතු නොවන බැවින් 2013.01.08 දිනැති මහ සභාවේ දි න්‍යාය පත්‍රයට ඇතුළත් නොවූ වෙනත් කරුණු 12.01 යටතේ හල්වතුර ව්‍යාපෘතියේ අක්කර 200 ක ඉඩමේ නිරවුල් භුක්තිය නාගරික සංවර්ධන අධිකාරියට භාරදීමට ඒකමතිකව තීරණය කර ඇති බවත්

04.) ඒ අනුව උක්ත භූමියේ අයිතිය පිළිබඳව 2016.05.06 සහ 2018.08.17 දිනැති ලිපි මඟින් වාර්තා ලබා ගැනීම ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධව උපදෙස් ලබා දි ඇති බවත් මහ නගර සභා හා බස්නාහිර පළාත් ඉඩම් අමාත්‍යාංශයේ ඉඩම් අධික්ෂක විසින් ඉඩම් අමාත්‍යා වෙතද , ඉඩම් ලේකම් වෙතද කරුණු සවිස්තරාත්මක ඉදිරිපත් කර ඇති බවයි.

05.) අම්බලන්ගොඩ නගර සභාව විසින් හල්වතුර භූමියේ කොටසක් කැළිකසළ අපහරණය කිරිමට යොදා ගන්නා අතර එම අක්කර 18 ක ප්‍රමාණය වෙන්කර ඉතිරි ප්‍රමාණය නාගරික සංවර්ධන අධිකාරියට පැවරිමට අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට 2018.05.18 දිනෙන් දක්වා ඇත.

06.) නමුත් අම්බලන්ගොඩ නගර සභාව උක්ත ඉඩමේ භුක්තිය නාගරික සංවර්ධන අධිකාරියට නැවත පැවරිමට මේ දක්වා කර නොමැති අතර මේ සම්බන්ධව සභාපතිවරයාගෙන් විමසිමේදි උක්ත භූමිය 2008 වසරේ වන සංවර්ධන කලාප ලෙස ගැසට් කර ඇති බවත් ඒ අනුව අම්බලන්ගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට එය බාධාවක් බවත් ඊට අදාල පර්ශව සමඟ සාකච්ඡා කර ඉදිරියේදි සංවර්ධන ව්‍යාපෘතියට අවශ්‍ය ඉඩම් කොටස් හැර ඉදිරියේදි නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීමට කටයුතු යොදා ඇති බවත් පවසා ඇති බවත්ය.

07.) අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම්ගේ 2019.10.16 දිනැති ලිපයෙන් පැමිණිලිකාරගේ වන්දි ඉල්ලිමට අදාළ ලේඛණ ඉදිරිපත් කර ඇති බැවින් උක්ත පැමිණිලිකාරට වන්දි හා මුදල් ගෙවීම තහවුරු වන බවත් විමර්ශනය කර ඇත. ඒ අනුව මගේ 2020.09.08 ලිපිය මඟින් අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති වෙත උක්ත වාර්තාවේ නිර්දේශ පරිදි හල්වතුර ව්‍යාපෘතියට පවරා ගෙන ඇති ඉඩම් භුක්තිය තබා ගනිමින් කටයුතු කරන මෙන්ද නො එසේ නම් නාගරික සංවර්ධන අධිකාරියට භාර දෙන්නේ ද යන්න කඩිනම් සභා තින්දුවක් මඟින් ඉදිරි කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටින බව කියා පළාත් පාලන නියෝජ්‍ය කොමසාරිස් ලිපියක් එවා තිබෙනවා. ඒ අනුව සභාව විසින් ගන්නා තින්දු මොනවාද කියා විමසනවා . නගර සභාවේ මා නම් කියන්නේ යෝජනා කර තිබෙන කසළ දැම්මේ ස්ථානයත් ජාත්‍යාන්තර ක්‍රිඩාංගණය ඉදිකරන ස්ථානයත් යෝජිත කඩොලාන උද්‍යාන ඉදිකිරිමේ ඉඩමත් ඉතිරි කරගෙන ඉතුරු කොටස් නාගරික සංවර්ධන අධිකාරියට පැවරිය යුතු යයි මා යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , මෙහි ජනතාව ජීවත් වෙනවා. හල්වතුර යෝජනා ක්‍රමයේ අවුරුදු හතළිහ පනහ . ඒ අයටත් සාධාරණයක් ඉටු කරන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහි මුදල් ගෙවන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

මුදල් ගෙවලා හරි මොනවා හරි වැඩපිළිවලක් කරන්න. ජනතාව පැත්තෙනුත් කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමාට කියන්න පාර්ලිමේන්තුවට දමා මුදල් ටිකක් ඉල්ලා දෙන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ඔබතුමාටනේ වගකීම තිබෙන්නේ. නගර සභාවට එහි වගකීම තිබෙන්නේ. මන්ත්‍රීවරුන්ගේත් සහායෝගය දෙන්න ඕන. ඒ අය එහෙම නම් එම භූමිවල ඉන්න ජනතාව ගෙන්වා සාකච්ඡාවක් තියා ඉක්මනින්ම ඒ අයට අවශ්‍ය කරන ඔප්පු ලබා දෙන්න. ඔප්පු නැතුවනේ ඉන්නේ. අවුරුදු 40 , 50 සිටින අය ඉන්නවා. එමනිසා ඒ අය කැඳවා යම්කිසි වැඩපිළිවලක් යම්කිසි මුදලක් දෙන්න ඒ අය කැමති වෙවි. අවුරුදු 40,50 සිටින අය ඉන්නවානේ. අපි සානුකම්පිතව බලන්න ඕනේ. ජනතාව අවුරුදු 40, 50 සිට සිටින ජනතාවක් ඉන්නවා . එමනිසා ඔබතුමා කැඳවන්න. මා එතුමාට සහායෝගය දෙන්නම්. ඒ ජනතාව කැඳවන්න. එතකොට අපිට ඒ අයගෙන් යම්කිසි මුදලක් අයකර ගන්න පුළුවන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමිය , ඔප්පු තිබෙන අය සිටිනම් ඉදිරිපත් වෙන්න කියන්න. අපි අවසතු කරන්න කියා සභාවට තීරණයක් ලබා දෙන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ ඉඩම් වල අයිතිකරුවන් සිටිනවා. දැන් ඉන්නේ ඔය වතු බලාගත්ත කට්ටිය. හිතවත්කමට පදිංචි වෙන්න දුන්නාම සමහර ගෙවල් දොරවල් හදා ගෙන. සමහර කට්ටිය ඔප්පුත් හදාගෙන. ගෙන්වනවා නම් හරි අයිති කට්ටියත් ගෙන්වා ගන්න වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි අයිති කට්ටිය කවුද කියා ප්‍රාදේශිය ලේකම් තීරණය කර අවසන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

අරගොල්ලන් විතරක් ගෙන්වා සට්ටනයක් ඇති වෙනවා. ඉඩමේ ඉන්න කට්ටියට විතරක් ඔප්පු දෙන්න ගියොත්. ඔප්පු දෙන්න ඕනේ. හරි අයිති කට්ටිය ඉන්නවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් ඔය ඉඩම් පැවරීමේදී ඒ මුදල් පවරා ගැනීමේ ඒ පවරා ගන්න ඉස්සරවෙලා ඔය තැන්පත් කරන් ඕනනේ. සභාවෙන් වුණත් සභාවට පවරා ගන්න විට මුදල් තැන්පත් කරන්න ඕන. අවශ්‍ය වෙනවා නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ පවරා ගැනීම සිදු කළේ 88 , 89 . ඒ දිනවල තිබූ නීතිය අනුව මුදලේ තක්සේරුව අනුව 10% බදින්න ඕන. 10% බැඳලා තිබෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එතකොට 10% අනුව එක්දහස් නමසිය අසූනමයේ බැඳලා තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

රජයේ අත්පත්කර ගැනීමේ ක්‍රියාවලි දෙකක් තිබෙනවා . ඒ දිනවල තිබූ නීතිය අනුව . එකක් තමයි පලවෙනියෙන්ම දැන්වීමක් කරලා අත්පත් කර ගැනීමේ 4වෙනි වගන්තිය 4 සිට 38 දක්වා කටයුතු කරමින් ඉදිරියට යාම . එතකොට මැනුම් කටයුතු සිදු කරන්න ඕනේ. මෙය කර තිබෙන්නේ 38 (ආ ) මුලින්ම ගසා බුක්තිය එදාම ගන්නවා. අරගෙන පිටුපස්සට ගෙන තිබෙන්නේ. මේ ක්‍රියාදාමය. ඒ අනුව රජය සතු වෙලා තිබෙනවා ඒ ගත්ත දිනයේම . 1989 , 1988 විතර. බුක්තිය සතු වෙලා තිබෙනවා. එගොල්ලන්ට පසුව තක්සේරු කිරීමේදී මුදල් ගෙවන්න ඕනේ. ඕක තමයි සංසිද්ධිය.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා දන්නේ නැහැ මුදල් ගෙවලා ද කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එයට හැකියාව දීලා තිබෙන්නේ නාගරික සංවර්ධන අධිකාරි පණතටම පමණයි. ඒ අනුව තමයි මෙය කර තිබෙන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එතකොට 10% ක් නාගරික සංවර්ධන අධිකාරියට ද ගෙවලා තිබෙන්නේ. නැතිනම් අපේ ගරු සභාවෙන්ද කර තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දෙගොල්ලන් එකතු වෙලා කර තිබෙන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය ලේකම් නමින්නේ තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය දැන් ගෙවලා තිබෙන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සම්පූර්ණ ගෙවලා තිබෙන්නේ. දැන් මේ ගෙවපු නැති අය තමයි මේ මුදල් ඉල්ලන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් මෙහි අක්කර 40ක් විතර වනජීවි දෙපාර්තමේන්තුවට පවරා තිබෙනවා. ඉදිරිපස පෝරඹ පහළ තිබෙන ඉඩම් කැල්ල. එය දිසාපතිගේ 44 වෙනි වගන්තියේ නියෝග අනුව තිබෙන්නේ ඉඩම් රේජිස්ට්‍රාර් කාර්යාලයට. එම ඉඩම් රේජිස්ට්‍රාර් සතුව තිබෙන සියළුම ඉඩම් වලට වන්දි ගෙවා අවසන්.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

වන්දි ගෙවන්න ඕනේ. ඒ ඉඩම් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට විකුණලා තිබෙන්නේ. විකුණලා ලොකු මුදලක් හම්බ කර ගෙන තිබෙන්නේ. දැන් මෙය ලොකු ආසාධාරණයක්. අර පවරා ගත් අයිතිකරුවන්ට මුදලුත් නැහැ. දැන් ඒ පවරා ගත් ඉඩම් සභාව සතුත් නැහැ. අයිති නැති මිනිසුන් අල්ලා ගෙන තිබෙන්නේ. නිලානි මන්ත්‍රිතුමිය කිවු ආකාරයට. දැන් අවුරුදු 30 ගණනක සිට ඒ මිනිසුන් ඉන්නවා. ඒ මිනිසුන්ටත් සාධාරණයක් ඉස්ට වෙන්න ඕනේ. එතකොට ඉඩම අයිති මිනිසුන්ටත් තාම වන්දි මුදලක් නැහැ. ඒ මිනිසුන් මෙච්චර කල් අවුරුදු තිස් ගණනක් බලාගෙන ඉන්නවා. මෙහි මොකක් හරි විසඳුමකට එන්න වෙනවා. ගරු සභාවට. නැතිනම් මෙය හරි ප්‍රශ්නයක්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් එකතමයි මා යෝජනා කළේ දැනට අපිට අවශ්‍ය වන්නේ අපි කසළ බැහැර කරන ස්ථානයත් , ඒ වගේම අපි යෝජනා කර තිබෙන ක්‍රිඩාංගණය සැදිමට යෝජනා කර ස්ථානයත් , ඒ වගේම කඩොලාන උද්‍යානයක් ඉදිකිරිමට අපි ස්ථානයක් වෙන් කළා. එම ස්ථානත් පමණයි. එතකොට ඒ ස්ථාන තුනට අපි වන්දි ගෙවීම කරන්න. ඊට අමතරව අපි කුලරත්න විද්‍යාලයට වෙන්කර කොටස. එතැන අක්කර 5ක් අපි වෙන්කර තිබෙනවා . අපි අධ්‍යාපන දෙපාර්තමේන්තුවට කියන්න ඕනේ මෙහි වන්දි මුදල ගෙවන්න කියා. අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතු කර ගන්න කියා. එතකොට ඉවරයි ප්‍රශ්නය

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මා කියන්නේ ඕක ඉල්ලන්නේ පෝරඹ ප්‍රදේශයට විතරයි. ඒ කොටස හඳුනාගෙන අපිට සභාපතිතුමා කියන විදියට මෙය අතහරින්නත් බැහැ. සභාපතිතුමා වශයෙන් ඔබතුමාත් , අපි මන්ත්‍රිවරුත් තමයි අසු වෙන්නේ . ඉතිරි කොටස අතහැරියා කියා. මේ නගරයේ දියුණුව වෙන්න තිබෙන්නෙත් මේ කොටස විතරයි. අපි කොච්චර කෑ ගැසුවාත් පරිසරය රකින්න ඕනේ . අපිට

නගරය රකින්න ඕනේ. යන්න තිබෙන එකම කොටස ඔක විතරයි. එතකොට අපි මේක අතහරිනවා කියන්නේ එතනත් අපිට ලොකු ගැටළුවක් වෙනවා. මෙය අවුරුදු 30කට කලින් පවරලා දුන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභාව විසින් මිලියන 28.8 ක් එකියන්නේ ලක්ෂ 268ක් වන්දි මුදල් හා පොළි . එතකොට වන්දි මුදල් ගණන ලක්ෂ 268යි. මේ කියන්නේ 1989 දි. අද වෙනකොට පොළිය. මෙය දැනට වාර්තා වෙච්ච හැටියට ලක්ෂ 700 පැනලා තිබෙන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එකතමයි ගරු සභාපතිතුමනි , මා කියන්නේ අයිතිකරුවන් කවුද කියන එක තින්දු කරලා අවසන්. තින්දු කරනවා ගරු සභාපතිතුමා ඔය වගේ ලිපියක් අපිට එනවා එක්කම මෙන්න අයිතිකරුවන් මෙන්න කියා ඔප්පු කරන්න ඕන. එතකොට බලන්න පුළුවන් . අපි දන්නේ නැහැනේ පළාත් පාලන කොමසාරිස්තුමාට හා සහකාර කොමසාරිස්තුමාට ගිහින් තිබෙන්නේ කොච්චර මුදලක් ද කියා. අපිටත් ඉදිරිපත් කරන්න කියන්න. කොච්චර මුදලක් ද මෙන්න මේ කට්ටිය තමයි මෙය ඉදිරිපත් කරන්නේ කියා . මා දන්න තරමට මෙය ඉල්ලන අය සිටින්නේ සුළු කොටසක් විතරයි. උදාහරණයකට ගන්නම්. දැන් ගත්තොත් එහෙම තල්ගස්ගොඩ බටපොළ පාරේ යනකොට දකුණුපස කොටසේ කොටස අයිතිකරුවන් කවුද කියලා දන්නේ නැහැ. කිසි කෙනෙක් වත් දන්නේ නැහැ. අවුරුදු ගණනක් දැන් තිබෙනවා. හැබැයි මේ වටිනාකම තිබෙන්නේ මේ පෝරඹ මේ කොටසේ තමයි. වටිනාකම පෙන්වන්නේ. ඔච්චර කියලත්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය අත්පත් කර ගන්නේ 89 වර්ෂයේ. 89 සිට අදවෙනකොට කොච්චර කල්ද ?

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

අවුරුදු 31 වෙනවා. අවුරුදු 31 සිටිනවා කියා ඉන්නවා නම් කවුරු හරි කෙනෙක් පදිංචි වෙලා සිටිනවා නම් අවුරුදු 30ක් 25 ක් වෙනකොට නිතිඥ මහත්වරු වුණත් ඔබතුමාත් දන්නවා . පිළි ගන්නවා. ඔප්පුවක් භුක්තියට හැදුවාත් අපේ ලක්ෂ්මි මන්ත්‍රීතුමිය දන්නවානේ පිළිගන්නවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

රජයේ ඉඩම් භුක්තියට අයිතිය කියන්න බැහැ. දැන් මෙය 89 දි රජය සතුවෙලා ඉවරයි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

රජය සතු විම ගැන නෙමේ මේ කතා කරන්නේ. දැන් ඔහොම ගියොත් එහෙම අපි මේක අතහැරියා කියන්න. අපි තින්දුවක් ගන්නවා අපි මේක අතහරින්න සභාව . ඉදිරියේදි මේ සභාව නියෝජනය කරන හැම මන්ත්‍රිවරයෙක්ම . මේක අපි අතහැරියා කියා ලොකු දෝෂාරෝපණයක් එනවා. මෙකේ සත්‍ය සොයන්න. අයිතිකරුවන් කි දෙනෙක් ඉන්නවාද ? කොච්චර මුදලක් අය

වෙන්න තිබෙනවාද කියා. දහදෙනෙක් ගත්තොත් මෙයාට කියක් යනවාද ? මෙයාට කියක් යනවාද ? මෙය හරියට හොයන්න

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මේ ක්‍රියාදාමය කරන්නේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඉඩම් නිලධාරි මඟින්. ඉඩම් කච්චෙරි පවත්වා ඒ අයිතිකරුවන් තින්දු කරලා ඔවුන් විසින් ඔවුන්ට ලබාදිය යුතු මුදල තින්දු කරලා ඉවරයි.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

සභාපතිතුමා ගාව තිබෙනවාද ඒ  ගැසට් එක.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

එය අපිට ගන්න බැරි ද ? අපිට ගන්න බැරිද ? පිටපතක් එවන්න පුළුවන්නේ. මෙන්න ඉන්නවා. මෙච්චර ගණනක් ඉන්නවා කියා. එහෙම අරගෙන අපි මෙයට මොකක් හරි පිළියමක් ගන්න. මේක අපි අතහරින්න එපා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

අතහැරිම කෙසේ වෙතත් දැන් මේ වගේ ලිපි එනවා අවුරුදු ගණනක්. මේ අවුරුදු 10ට මා දැන් පිළිතුරු දිලා මා ලිස්සනවා. ඒ වුණාට අදාළ නිලධාරින් ටික මේ ගැටවට . අපි එක්කෝ අඩුම ගණනේ ලක්ෂ 50 ක්වත් ගෙවන්න ඕනේ.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

දැන් මේක 1989 ගත් තින්දුවක්. මේ ගරු සභාවෙන් යෝජනා වෙලා ගත් තින්දුවක්. හැබැයි අවුරුදු ගණනක් ගියාට පසු මෙය නිදහස් කරනවා කියන්නේ බොරු වැඩක් . මා ඉස්සරවෙලා කිවුවා වගේ මේ නගරය යන්න තියෙන පැත්ත මේ. මා දන්නේ නැහැ මාගේ මතය. එමනිසා මා ඉලලිමක් කරනවා ගරු සභාවෙන්. මෙය නැවත වරක් අන්සතු කරන්නේ නැතුව සභාව සතුව තියාගෙන මෙයට මොනවා හරි ක්‍රියාමාර්ගයක් ගන්නා හැටියට ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**</u>

මගේ නම් අදහස මෙහි ගෙවල් හදාගෙන තිබෙන ප්‍රශ්නය තමයි. නැහැ එගොල්ලන්ටත් මොනවා හරි ආසාධාරණයක් වුණොත්. අපේ පැත්තේ තිබෙනවා. එමනිසා එහෙම වගකීමක් නගර සභාව පැත්තෙන් අපිට දරන්නත් බැහැ. මොකද මේ නගර සභාවම පාලනය වෙන්නේ මිනිසුන්ගේ

වරිපණම් ගෙවන බදු වලින් තමයි. එහෙම එක කොටසකට පමණක් වරප්‍රසාද දෙනවා ද ? එහෙමනම් ඒ අයගෙන් යම් මුදලක් අයකර ගන්න ඕන. ඒ මුදලම ඉල්ලන්න ඕන. මා කියන්නේත් අර ගරු සභාපතිතුමා ඉස්සෙලා කියපු විදියට ඒ කොටසට විතරක් ගෙවලා ඒ කොටස විතරක් නිදහස් කර ගන්න. අපි ඒ ටික ගෙවන්න . දොඩම් ගොඩ බදා ගත්තා වගේ ඔක්කොම බදා ගන්නවා. හැමදාම ලියුම් එනවා. ප්‍රශ්නය එතනමයි. කුණු දමන කොටස ඉස්සරවෙලා ඔබතුමා යෝජනා කලානේ මේ ටික ගෙවන්න . ඒ ටික ගෙවලා අයිතිය තහවුරු කරලා ඒ ටික අපි ගෙවා ඉන්න. එතකොට දෙවැනි පියවරකට යන්. නැතුව සියල්ලම ඒ විදියට යන්. ඒක ප්‍රශ්නයක්. ඊට පස්සේ දෙවැනි පියවරකට ඇතුළුවන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා හිතන්නේ මෙය ජනාධිපති ලේකම් කාර්යාලයෙන් කොමසාරිස්තුමාට තමයි ලිපිය යොමු කර තිබෙන්නේ. මෙය 1989 තමයි අත්පත් කර ගෙන තිබෙන්නේ. මොනවා හරි හේතුවකට සභාව. සංවර්ධන කටයුක්තකට තමයි මෙය යොමු කර ගෙන තිබෙන්නේ. මේ කාලය කෙසේ හෝ වන්දි මුදල් නෙගෙව මේ වෙනතාක් තිබෙනවා. නමුත් මේ කියන කාරණාව ගරු උප සභාපතිතුමා කිවු ආකාරයට අනවසරයෙන් ඉන්න කට්ටියත් ලියුම් දි තිබෙනවා. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට එය දෙන්න. එතකොට ඔය සුද්ද වශයෙන් ගෙවන්න ඕන මුදල ඕක හරිද කියන එකයි ප්‍රශ්නය තිබෙන්නේ. එමනිසා ප්‍රාදේශිය ලේකම් එක්ක සාකච්ඡා කරලා ඔකේ අයිතිය තිබෙන කට්ටිය හරි මන්ත්‍රිවරු හිටියට කමක් නැහැ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

19 වෙනිදා 2.00 ට කතා කරන්න. 19 වෙනිදා 2.00 ට සියළුම මන්ත්‍රිවරුන්ට කතා කරලා දැනුම් දෙන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

කතා කරලා විසඳා ගන්න. මොකද නගරික සංවර්ධන අධිකාරිය තවත් ගනුදෙණුවක් කරන්නේ. ඕක අරගෙන කාටහරි දෙන්න තමයි මේ කටයුතු කරන්නේ. අපි බලන්නේ නගර සභාවට. නිකං තිබ්බත් එය නගර සභා දේපලක් හැටියට තිබ්බත් අපිට වටිනවා. එමනිසා ගෙවන්න ඕන ගණනයි. ගෙවන්න ඕන පුද්ගලයන් බලා නගර සභාවෙන් මොනවා හරි කරලා එය මේවා කරන්න. ප්‍රතිපාදනයක් හරි ගන්න පුවවන් අයගෙන් අරගෙන මේවා කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, එක පාරක් ඔබතුමා සභාපතිව ඉන්නකොට ගිහින් ඩෝසර් කළා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා හිතන්නේ අද අපි මේ කතා කරන්නේ නගර සභා ඉතිහාසය තුළ ඉතා වැදගත් මාතෘකාවක්. එක සරල දෙයක් නෙමේ. අම්බලන්ගොඩ නගරය නගරයක් විදියට ඉදිරියට යාමට තිබෙන අවස්ථාව ගැන මේ කතා කරන්නේ. හෙක්ටාර් 6 ½ ක තමයි අපි ජිවත් වෙන්නේ. මේ පදිංචිකරුවන් මේ නිවාස 6000 ගණන තිබෙන්නේ මේ භූමි ප්‍රමාණයේ. එතකොට මා දන්නේ

නැහැ ගරු සභාපතිතුමනි , තාම ඒවා තිබෙනවා ද කියා මේ නගර සභාවේ. දස අවුරුදු විසි අවුරුදු සැලසුම් සකස් කළා. ඒවා අනුමැතිය සඳහා පවා යැව්වා. ඒ සැලසුම් වලට අනුව ඔය මුළු භූමියේම සැලසුම් හදපුවා තිබෙනවා. නාගරික සංවර්ධන අධිකාරියේ. අම්බලන්ගොඩ නගරයේ මේ පාසැල් වල ක්‍රිඩාංගණ. ගෘහස්ථ ක්‍රිඩාංගණ , සුසාන භූමි , මහජන ක්‍රිඩාංගණ . ඔය සියළුම දේවල් වෙන්කරන්න හල්වතුර භූමි භාගයේ සැලසුම් සකස් කර තිබෙනවා. ඒවා ඉදිරිපත් කර තිබුණා. අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණා. අනුමත වෙලා ආවාද කියා දන්නේ නැහැ. ඒ නැතත් අද මේ රැස්වෙලා සිටින සියළුම මන්ත්‍රිවරුන්ගේ වගකීම වෙලා තිබෙන්නේ. නාගරික සංවර්ධන අධිකාරිය විරුද්ධව නෙමේ. ඒ අයත් එක්ක තමයි යන්න තිබෙන්නේ. තනියම මේ ගමන යන්න බැහැ. කලින් වතාවේත් නගරාධිපතිවරයා මේ සංවර්ධන කටයුත්ත කරන්න අරගෙන තිබෙන්නේ නාගරික සංවර්ධන අධිකාරිය සමඟ එකතු වෙලා. ඔවුන්ගේ ආශිර්වාදය ඇතුව. ඒ අනුව නිත්‍යානුකූලව පහත්බිම් අධිකාරියට අක්කර 40ක් පවරලා අපි වන්දි ගෙවලා ක්‍රමවත් සැලසුමකට ගිහින් එක අතර මහදි අධිකරණයට යන්න සිදුවෙලා ඒ අධිකරණයෙන් දිපු තින්දු තුළ ඔය අක්කර 10 වැවක් හදන්න කියන එක. එකේ තමයි අපි කුණු දමන්නේ. ඊළඟට ඔය හල්වතුර ඇළ. එය අඩි 30කට සංවර්ධනය කරන්න කිවුවා. පොරුක් ඇළ. මේ සංවර්ධන කටයුත්තේ ඉදිරියට අරගෙන යාමේ වගකිමයි අපිට තිබෙන්නේ. අපි එක මගහරිමින් තිබෙනවා. එය කනගාටුවට කරුණක්. අපිටත් පුළුවන් මෙය අත ඔසවා සභාපතිතුමා මෙය නාගරික සංවර්ධන අධිකාරියට දෙන්න ඕන දෙයක් කර ගන්න කියා. එකට නෙමේ අපි මේ මන්ත්‍රිවරු වෙලා මෙතනට ඇවිත් ඉන්නේ. මේක ආරක්ෂා කර ගන්න. ඉදිරි දරුවන් සඳහා මෙය සංවර්ධනය කළ යුතුව තිබෙනවා. මේ නගරය සංකෝචනය වෙන්න වෙන්න මේ නගරයේ ඉතිරිවෙලා තිබෙන බිම් කඩ ඕක. එක නගර සභාව විදියට අපි අතහරින්න නරකයි. එක තමයි මූලික අවශ්‍යතාවය. මා කියන්නම් ප්‍රාදේශිය ලේකම් එකේ මේ සම්බන්ධව තිබෙන තොරතුරු. ඒ අය අතර තිබෙනවා හල්වතුර අක්කර 240 ම මැනපු සිතියම්. ඒ මැනුම් නිලධාරින් පර්චස් එකක් පර්චස් එකක් ගානේ සටහන් කර තිබෙනවා. මෙකේ අයිතිකරු කවුද ? හිමිකම් කියන්නේ කවුද ? දැනට පදිංචි වෙලා ඉන්නේ කවුද ? මේ සිතියම් පරිශිලනය කරාම පර්චස් එකක් ගානේ තිබෙනවා. මේ ටික බැලුවොත් තමුන්නාසේලා සියළු දෙනාටම තෙරෙයි . මේ ඉඩම් 240 න් අක්කර 40 ක වත් නිත්‍යානුකූල සියයට සියයක් මෙතුමිය නිතිඥවරියක් . අන්න ඒ නිතිඥවරුන් පිළිගන්නා විදියට අයිතිය නැහැ. අක්කර 40 ක නැහැ. මා වගකිමෙන් කියන්නේ. ඉතුරු 200 ම හිමිකම් කියයි හෝ රජය සතු ඉඩම්. එතකොට මේ අක්කර 40ක වන්දි ගෙවීම ගැන තමයි මේ කතා කරන්නේ. මේක තෝරා බේරාගෙන කරන්නේ නැතු වුණොත් මේ කියන කාරණයට ඔබතුමාටත් අපිටත් එකඟ වෙන්න වෙනවා. නැතිනම් අවුරුදු 10 ක් තිස්සේ අර කියපු විදියට උත්තර දෙන්න වෙයි. මා මෙය වගකිමෙන් කියන්නේ. 09 හෝ සාකච්ඡා කරලා ප්‍රාදේශිය ලේකම්තුමියට ඉදිරිපත් කරන්න කියන්න. නිතිඥ මහතෙක් සනාථ කළ අවුරුදු 30 ක 40ක ලුහුඩු සටහන් දමන්න. ඔබතුමා දන්නවා මට වඩා හොඳට. මෙතුමිය දන්නවා මට වඩා හොඳට. මේ සෑම ඉඩම් කට්ටියකටම පැටි කිරියක් එක්ක සටහන් කර එවන්න කියන්න අයිතිය. එතකොට අපි පිළිගන්නවා. අපි වන්දි ගෙවනවා. අපි බැඳිලා ඉන්නවා. අන්න ඒ ප්‍රමාණය තමයි. මා වගකිමෙන් කියන්නේ. අක්කර 40 කට වඩා නැහැ. ඒ 40ටම වන්දි ගෙවන්න නගර සභාව බැඳි සිටිනවා. ඒ ලක්ෂ 200 ක් 300ක් ගෙවන්න ඔබතුමාට නගර සභාවට වත්කම තිබෙනවා. මේ සියළුම සංවර්ධන කටයුතු බාල කර හරි මෙය ගෙවන්න. කොටස් කොටස් වශයෙන්. මොකෝ පැය 24න් වන්දි ගෙවන්න කියා නියමයක් නැහැ. අවශේෂ වශයෙන්

පිලිගැනිමට ලක්වෙන්නේ නැතිනම් අයිතිකරුවන්ට නඩුවක් දමාගෙන අපි යන්. මොකක්ද ප්‍රශ්නය. ඔබතුමලා දක්ෂ නිතිඥ මහත්වරු. අපිට මෙය බෙදුම් නඩුවකින් අවසන් කර ගන්න පුළුවන්නේ. අයිතිකරුවන් සිටිනම් එයිනේ උසාවියට එයි. එකයි මා මේ කියන්නේ මේක මේ වගකිමට ඉතාම සරල ක්‍රියා මාර්ග තිබ්යදි මහ බරපතල විදියට ආණ්ඩුවේ නිලධාරින් කිවූ විදියට කොමසාරිස්තුමා කිවූ විදියට ජනාධිපති ලේකම්ගෙන් ලිපි ආ පලියට අපි තින්දු ගන්න ඕනේ නැහැ. අපි සත්‍යයට යන්න ඕනේ මෙකේ. සත්‍ය තමයි මා ඉදිරිපත් කළේ. ඔබතුමා හිතයි මෙය මහ බරපතල කාරණයක්. මෙයට පටලැවෙන්න බැහැ. මෙය සරලයි. ප්‍රාදේශිය ලේකම්තුමියගෙන් අපි මේ කිවූ කාරණා ටික ඉල්ලන්න. අවුරුදු 40 ක පැටි කිරියත් එක්ක මේ වාර්තාව දෙන්න කියන්න අපිට. ඔබලා දෙපළම නිතිඥවරු. මෙහි පත්ඉරු දෙන්න කියන්න. රුපියල් සියයනේ යන්නේ බලන්න. නැතිනම් 500 නේ. මා එකයි කියන්නේ. ඉතිං ඒ ටිකකට වන්දි ගෙවිම සඳහා අපි කටයුතු කරන්න. ඉදිරියේදි වනජිවි එකයි එවත් එක්ක කටයුතු කරලා අපි මේ ඉඩම් ප්‍රමාණය බේරා ගන්න බලන්න. මේ සංවර්ධන කටයුතු සඳහා සභාවට අත්‍යවශ්‍යයි . මේ ඉඩම් ප්‍රමාණය. නගර සභාව තමයි මහජනතාවගේ පොදු මහජනතාවගේ සේවය සඳහා ඉදිරිපත් වන ආයතනය. ජනතාවගේ සෞඛ්‍ය සම්පන්න කටයුතු සඳහා. දැනටමත් පෙන්න තිබෙනවා. වාහන අංගනයට , කුනු අංගනයට . මේ නගර සභාවටත් අවශ්‍ය ඉඩම් නැහැනේ. ඔකෙන්නේ ගන්න තිබෙන්නේ. සංවර්ධන කටයුතු කිරිමේදි කොටසක් විරුද්ධයි, කොටසක් කැමතියි. මේ සම්බන්ධව ජනතාව දැනුවත් කරලා කෙරුවොත් අපිට මේ කටයුතු කරන්න පුළුවන්. එමනිසා 09 වෙනිදා ප්‍රාදේශිය ලේකම් සමඟ සාකච්ඡාවක් තිබෙන නිසා . ලිපිලේඛණ සියල්ල ඒ අය ළඟ නැතිනම් මා ළඟ තිබෙනවා මා අරගෙන එන්නම්. ඒ සියල්ල ඉදිරිපත් කරලා ඔය කිවූ ආකාරයට අපිට ගන්න පුළුවන් නම් අවුරුදු 35 ක ලුහුඩු සටහන් එක්ක මෙන්න මේවා ඔබතුමලා සහතික වෙනවා නම් අපිට ගෙවන්න පුළුවන්. ඔබතුමා නිතිඥ මහතෙක්. එකඟතාවය පල කරන ලෙස මා යෝජනාව පල කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**</u>

දැන් මේ වගේ දෙයක් කතා කරන්න අද වගේ දවසක වත් සභාවට එන්න බැරි .

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

තාක්ෂණසේවා නිලධාරි මහත්ම මහත්මින්ට එන්න කියන්න.

**තීරණය-**

ජනාධිපති කාර්යාලයෙන් යොමුකරන ලද මහජන පැමිණිලි යටතේ අම්බලන්ගොඩ,හල්වතුර ව්‍යාපෘතියට පවරාගෙන ඇති ඉඩම් පිළිබඳ වන්දි නොගෙවීම සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් එවා ඇති ලිපිය සම්බන්ධව 2020.10.09 දින පවත්වන රැස්වීමේදී ප්‍රාදේශීය ලේකම්තුමා සමග සාකච්ජා කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.17 2020.09.18 දින පැවති අබලි භාණ්ඩ වෙන්දේසි වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කාර්යාල පරිශ්‍රයේ ගොඩගසා ඇති අබලි ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් පත්කිරීම පිළිබඳ අදහස් දක්වන්න පුළුවන්

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මා මේ කියන්න ආවේ සාමාන්‍ය යෙන් මෙතැන අපේ නිලධාරින් වගේම අපේ මන්ත්‍රිවරු 20ත් ගරු සභාපතිතුමා ඇතුළු 21 ත් සාමාන්‍ය යෙන් බුද්ධියක් තිබෙන පුද්ගලයන් හැටියට. මේ වෙන්දෙසියේ වෙන්දේසි ලොඩ් 28ක් තිබුණා. දැන් ඔබතුමලා කල්පනා කරන්න මේ ලොට් 28ක් වෙන්දේසි කරන්න පැය භාගයක්වත් ගියේ නැහැ. සාමාන්‍ය යෙන් විනාඩියයි ලොට් එකක් වෙන්දේසි කරන්න ගිහින් තිබෙන්නේ. සාමාන්‍ය යෙන් වෙන්දෙසියක මා දන්නේ නැහැ මොන හේතුවක් ද කියා මා මේ දැන් බැලුවේ. ලොට් 28 ක් තිබෙනවා. අන්තිම එක යනකොට තමයි ගරු සභාපතිතුමා ගරු රාහුල මන්ත්‍රිතුමා කිවුවා රු.41 ඉල්ලපු පුද්ගලයාටත් ගන්න දුන්නේ නැහැ. දැන් මේකේ එකත් දමා තිබෙන්නේ 40ට ඉල්ලුවා කියා. දැන් මෙහි එකත් දමා තිබෙන්නේ 40ට වෙන්දෙසියේ ඉල්ලුවේ නැහැ කියා. ඉල්ලපු එකත් දමා නැහැ. මෙහි ලංසුව රු.40 තිබ්බාට පසු රු.42 වෙනකම් ඉල්ලුවා. මෙහි අර පුද්ගලයාගේ බලපෑම මත මෙහි ඔක්කොම තිබෙන්නේ රු .35 ට වැඩියි. රු.36 දුන්නා වෙන්දෙසි කළා. එහෙම වෙන්දේසියක් කොහොමද මේ පැය භාගයෙන් ලොට් 25ක් වෙන්දේසි කරන්නේ. කොහේද තිබෙන්නේ එහෙම නිතියක්. කොහොම වුණාද කියා එය . හරි කනගාටුයි සිද්ධිය සම්බන්ධව. මෙහි ඔබතුමාලාට බලා ගන්න පුළුවන්. හැම එකම රු.35, 150 ගියා 160 ගියා. 250 යි 260 ගියා. ඉතිං වෙන්දෙසිය 35 යි ලංසුව තිබ්බාම 36 කියා එහෙම වුණොත් දෙනවා. එහෙම එකක් නැහැ. සාමන්‍යයෙන් ලොට් එකක් වෙන්දේසි කරන්න විනාඩි 10 ක් විතර යනවා. මෙය නිලධාරින්ගේ රාජකාරියක්. බලන් හිටියේ රාහුල මන්ත්‍රිතුමා විතරයි. මා හිටියේත් නැහැ. එතුමා කිවු නිසා මා හිටියේ. එමනිසා ඒ වගේ වෙන්දේසි මෙහි තියන්නත් එපා. ඊට වඩා හොඳයි ටෙන්ඩර් දමා ටෙන්ඩර් වලින් දෙන්න. ටෙන්ඩරයෙන් දුන්නා නම් මීට වඩා ලොකු මුදලකට යනවා. මා ඔන නම් උදාහරණයක් කියන්නම්. මට මෙතැන මාධ්‍ය ඉන්න නිසා කියන්න බැහැ. මෙතැන ගත්ත ලාභය එක පුද්ගලයෙක්. එමනිසා මා ඇත්තටම කනගාටු වෙනවා. මාගේ ඇස්දෙකටම දැක්කේ මා හිටිය නිසා. මෙය කිවුව ගමන් මාධ්‍ය යේ යනවා. එතකොට ලොකු කතන්දරයක්. එමනිසා මේ කතාව මා මෙතැන කියන්නේ නැහැ. එමනිසා මේ වගේ සිද්ධින් නම් ඇති වෙන්න දෙන්න එපා. ඔබතුමා දන්නවා. ඔබතුමාට කියන්න ඕන නැහැ. ලොට් 28 ක් තිබෙන එක පැය භාගයෙන් මෙය වෙන්දේසි කර අවසන්. පෙරවරු 10.30 ට පටන් ගෙන 11.00 වෙනකොට අවසන්. ඒවා කියලා වැඩක් නැහැ. එවා කිවුවාම අපි නිකං මේවා වෙනවා. එමනිසා තමයි මා මෙය කිවුවේ. අපෙත් පෞද්ගලික ජීවිතයත් තිබෙනවා. එම නිසා තමයි මා මේ ඉල්ලා අස්වුණේ

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි එයට සභාවේ අනුමැතිය ලබා දෙනවා.

**තීරණය-**

2020.09.18 දින පැවති අබලි භාණ්ඩ වෙන්දේසියේ වාර්තාවේ පිටපත් සියලු ගරු මන්ත්‍රීවරුන් වෙත ලබාදෙන ලෙස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් දන්වන ලදී.

**03.18 මහ නගර සභා හා නගර සභා සම්බන්ධයෙන් වාර්ෂික වාර්තාව සකස් කිරීම - 2019 වර්ෂය යන මැයෙන් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

නගර සභා සම්බන්ධයෙන් වාර්තාවක් එවා තිබෙනවා. දකුණු පළාත් කොමසාරිස්. ඒ අනුව එම වාර්තාව ඉදිරිපත් කිරිමට ලේකම්තුමියට කියනවා. සභා රැස්විම් පිළිබඳ ලිපියක් ඔබතුමලාට දි තිබුණා. එහි 23 පිටුව . සභා රැස්විම් කටයුතු. ශ්‍රී ලංකා සමාජවාදි රජයේ 18/11 2013.05.17 දින ගැසට් පත්‍රයේ 6 ( අ ) වගන්තිය ප්‍රකාරව සභා රැස්විම් කරගෙන යාමේ අතුරු ව්‍යවස්ථාව 2016.01 දිනැති තීරණ අංක 01.02 යටතේ අම්බලන්ගොඩ නගර සභා බල ප්‍ර දේශයේ ක්‍රියාත්මක කිරිමට තීරණය කළ බව පත්‍රයේ පල කර ඇත. නගර සභා ආඥා පණතේ 25 ( 1 ) ප්‍රකාරව අම්බලන්ගොඩ නගර සභාව විසින් රැස්විම් පවත්වාගෙන යාමේදි නගර සභා ආඥා පණතේ 29 ( 1 ) වගන්තිය අනුව අම්බලන්ගොඩ නගර සභාව විසින් කමිටු පත්කර පවත්වාගෙන යාම සිදු කරන බව නිරික්ෂණය විය. රැස්විම් වල වාර්තා පරික්ෂා කිරිමේදි පහත කරුණු අනාවරණය විය. සභා කටයුතු න්‍යාය පත්‍රයේ 3 යටතේ සභා කටයුතු සම්බන්ධයෙන් සභිකයන් විසින් අදහස් දක්වා ඇති බවත් සහා සම්මුති ලබා ගෙන ඇති බවත් නිරික්ෂණය විය. පෙත්සම් හා සංදේශ ඉදිරිපත් කිරිමේදි සභා රැස්විමට අනුව කටයුතු කිරිමේදි අතුරු ව්‍යවස්ථාවේ 09.01 යටෙත් අවධානය යොමු කිරිම සුදුසු වේ. න්‍යාය පත්‍රයේ 05.01 යන කරුණු යටතේ යෝජනා සලකා බලන විට යෝජනා යටතේ එම යෝජනා ස්ථිර කිරිමට පෙර සභිකයන් අදහස් දක්වා ඇති බව නිරික්ෂණය විය. උදාහරණ 2019.02.05 රැස්විම් වාර්තාවේ 05.01.04 යටතේ ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ඉදිරිපත් කළ යෝජනාවට අනුව එය ස්ථිර කිරිමට පෙර අදහස් දක්වා ඇත. එසේම එම යෝජනාව සම්මත විම හෝ ප්‍රතික්ෂේප වීම ඒකමතිකව සිදු විම නැති වුවහොත් වැඩි විස්තර අනුව එම අවස්ථාව නිරික්ෂණය විය. උදාහරණ 2019.02.05 පැවති 05.02.01 යටතේ ගරු නගර සභා මන්ත්‍රි සරත් ශ්‍රි ලාල් මහතා කළ යෝජනාව ස්ථිර කිරිමට පෙර සභිකයන් විසින් අදහස් දක්වා ඇති බවත් එම යෝජනා වලට ඡන්ද විමසිමක් සිදු කර තිබුණද පක්ෂව ඡන්දය ප්රකාශ කිරිම විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරිම ආදි අදාල කරුණු අනුව ඔවුන්ගේ විස්තර නොමැති බව ප්‍රකාශ විය. එ අනුව කිසියම් රැස්විමක කටයුතු තීරණය විම සම්බන්ධයෙන් මහ සභාව සහ සභා රැස්විම්වල කටයුතු කරගෙන යාම අතුරු ව්‍යවස්ථාවේ 08 ( 02 ) යටතේ අවධානය යොමු කරවමි. 2019.02.05 පැවති මාසික සභා රැස්විමේ න්‍යාය පත්‍ර යේ 05.01.02 යටතේ සභාපතිවරයාගේ යෝජනා 05.01 ලෙස සඳහන් වුවද 05.02 මාසික සභා රැස්විමේ වාර්තාවට අනුව යථා පරිදි යෝජනා යටතේ යෝජනා 21ක් ඉදිරිපත් කර ඇත. ඉන් අනතුරුව න්‍යාය පත්‍රයේ 05.02 යටතේ ගරු උප සභාපතිතුමාගේ යෝජනා සලකා ඇති බවත් අනාවරණය විය. යථා පරිදි කල් දි ඇති නොමැති මාසික රැස්විම් සඳහා ඉදිරිපත් කිරිම මාසික සභා රැස්විම් කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 11.08 වගන්තියට යොමු කිරිම පෙන්වා දෙමු. කියා අපේ වාර්තාවේ අඩුපාඩුවක් වශයෙන් දක්වා තිබෙනවා.

**තීරණය-**

මහ නගර සභා හා නගර සභා සම්බන්ධයෙන් 2019 වර්ෂයට අදාළව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද වාර්තාවෙහි පිටපත් සියලු ගරු මන්ත්‍රීවරුන් වෙත ලබාදෙන ලෙස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් දන්වන ලදී.

## 03.19 කාර්යාල පරිශ්‍රයේ ගොඩගසා ඇති අබලි ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් පත්කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කාර්යාල පරිශ්‍රයේ ගොඩගසා ඇති අබලි ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් පත්කිරීම සඳහා . දැනට ඉතිරි වි ඇති ටික. නිරික්ෂණ මණ්ඩලය සභාපති රේණුකා නිලන්ති , සමාජික ප්‍රභාවි නානායක්කාර , සාමාජික රජිතා ක්‍රිශාන්ති , සාමාජික හර්ෂණ නිලමුණි. මහතා සාමාජික ටී වන්න මහතා . නාගරික මන්ත්‍රිවරු දෙදෙනෙකු පත් කරන්න කියා ඉල්ලා සිටිනවා. රාහුල මන්ත්‍රිතුමා පත් කරනවා. අපි මෙය වඩා හොඳයි මෙය ටෙන්ඩර් කරන්න. එතකොට ඉවරයිනේ. ටෙන්ඩර් කරන්න. ලබන සභාවට ඉදිරිපත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් අර අබිලි ද්‍රව්‍ය විනශ කිරිමේ බැලුවාම ලී වගයක් තිබුණා. එම ලී වල වැඩ නොකරම තමයි වේයෝ කා තිබෙන්නේ. නිකං තිබිලා. ඒ පාර මා කිවුවා අර වේයෝ කාපු මේක විනාශ කරන්න එපා. වේයො කාපු ටික කපලා අයින් කරන්න. දැන් පරණ ලි වලින් කොච්චර වැඩ කරනවාද? මෙය ප්‍රයෝජනයකට ගන්න කියා. ඒ ටික විතරක් අයින් කරන්නේ. නන්දන රාජපක්ෂ මන්ත්‍රිතුමාත් සිටියා. එමනිසා ඒවා ප්‍රයෝජනයට ගන්න. වැඩක් කරන කොට . රාක්ක ගසන ඒවාට එහෙම. හොඳ ලී තිබුණා. අන්න ඒවායින් කරන්න කියා මා කිවුවා. එමනිසා මෙය ටිකක් දැනිමක් තිබෙන අය සමඟම කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ සඳහා මණ්ඩලයපත් කරන්න ඕනේ. වාර්තාවක් දෙන්න ඔනේ මෙය ටෙන්ඩර් කරනවා ද නැද්ද කියා. ගරු නගර සභා මන්ත්‍රිවරු 2කු ඇතුළත් කරන්න. ඒ සඳහා අපි ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා හා එස්.එම්. සරත් චන්ද්‍ර මහතාත් යෝජනා කරනවා. ඔබතුමාලාගේ නිර්දේහ පරිදි අපි මෙය ටෙන්ඩර් කරන්නම්.

**තීරණය-**

කාර්යාල පරිශ්‍රයේ ගොඩගසා ඇති අබලි ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩලය ලෙස රේණුකා නිලන්ති මිය, ප්‍රභාවි නානායක්කාර මිය, රජිතා නිශාන්ති මිය, හර්ෂණ නීලමුණි මයා, ටී.වන්න මයා, ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා සහ ගරු නගර සභා

මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා පත්කිරීම සුදුසු බවත් එම නිර්දේශ අනුව ටෙන්ඩර් කිරීම සුදුසු බවත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් තීරණය කරන ලදී.

**( 04)** කල් දී ඇති ප්‍රශ්න

**( 05)** කල් දි ඇති යෝජනා

**05.01** **ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.01.01** **අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ නව ක්‍රීඩාගාරයක්, වෙළඳසැල් කිහිපයක් ඉදිකළ යුතු යැයි කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ නව ක්‍රීඩාගාරයක්, වෙළඳසැල් කිහිපයක් ඉදිකළ යුතු යැයි යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ නව ක්‍රීඩාගාරයක්, වෙළඳසැල් කිහිපයක් ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ලංකා බැංකුව අසළ තිබෙන කොටසේ මහල් දෙකක ක්‍රිඩාගාරයක් ඉදිකිරිමටත් , එහි පහත මහළ දෙක වෙළඳසැල් සඳහා ලබා දීමටත් විශාල වෙළඳසැල් දෙකක් , මගේ නම් බලාපොරෝත්තු තිබෙන්නේ එය පවතින වෙළඳපොළ වටිනාකම අනුව ලබා දිය යුතුයි. අපේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන තක්සේරුව වගේ දහ ගුණයකට අපට ලබා දෙන්න පුළුවන්. ඒ මුදලින් ඉහළ මහළය නිර්මාණය කරන්න පුවවන්.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ක්‍රිඩාංගණය අවසන් වී මෙය සිදු කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ක්‍රිඩාංගණය අවසන්. මා මේ සම්බන්ධව කියන්න ඔනේ. නොවැම්බර් 10 දා ක්‍රිඩාංගණය විවෘත කරනවා. ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රිඩකයන් පැමිණ එදාට ක්‍රිඩා තරඟයක් පවත්වනවා. ප්‍රදර්ශන තරඟයක්. ඒ සඳහා අපි ලැහැස්ති වෙන්න ඕනේ. ඒ එන ක්‍රිඩකයන්ට පහසුකම් සපයන්න ඕනේ. මුදල් අයකිරිමකින් තොරව පැමිණෙයි කියා අපි බලාපොරෝත්තු වෙනවා. ඒ ක්‍රිකට් පාලන ආයතනය මඟින් ම මෙතැනට ප්‍රවාහනය කරන්න වෙවි. දැනට තිබෙන ක්‍රිඩාගාරය මීට වඩා පහසුකම් සහිතව අපි අලුත්වැඩියා කර ගන්න ඕනේ. එකටත් අවශ්‍ය දේ කටයුතු කරන්න. 10 වෙනිදා අපි එය විවෘත කරලා ඉදිරියට අපේ අයට ලබා දීමට කටයුතු කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>**

විශාල මුදලක් අපි වැය කර තිබෙනවා නගර සභාවෙන්. මේ අනුව ක්‍රිඩාංගණයේ තිබෙන තත්ත්වය අනුව ඔතන ගොඩනැගිල්ලක් ඉදිකළාම ඇත්තටම මහජනතාවට අවහිරයක් වෙන්නැද්ද? අපි මේ ක්‍රිඩාංගණය හදා තිබෙන්නේ තරඟයක් තිබෙන කොට එය නැරඹීම සඳහා මහජනතාවට කටයුතු කරන්න. ඔතන සෙනඟ ගැවසෙන තැනක් ක්‍රිඩාංගණයේ මොනවා හරි උත්සවයක් තිබෙන කොට.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ක්‍රිඩාගාරයේ එක තට්ටුවක 400ක් වාඩි වෙන්න පුළුවන්. එතකොට 800ක් වාඩි වෙන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>**

මේ ක්‍රිඩාංගණයට වියදම් කළ මුදලත් එක්ක බැලුවාම . සංවර්ධන කටයුතු අඩාල වෙලා තිබෙන්නේ. කාණු පද්ධති ද මාර්ග ද ඒ වගේ ගැටළුත් තිබෙනවා. මෙය එක්කෝ ප්‍රතිපාදනයක් අරගෙන හදන්න ගන්න. නගර සභාවේ මුදල් මෙයට වැය කරන්න ගියොතින් අනිත් කටයුතු කොට්ඨාශවල සම්පූර්න ඇණ හිටලා තිබෙන්නේ. එකපාරක් ඔබතුමාත් ඉන්න කාලේ හිටපු සභාපති ජී.එම්.එස් සිල්වා මහතාගේ කාලයේ ගොඩනැඟිල්ලේ ඉදිකිරිම සම්බන්ධව ගොඩක් විරෝධතාවයන් ආවා. අපේ සහායෝගය දිපු නිසා අපි එය හැදුවා. එක වෙනම කතන්දරයක්. ඔක ප්‍රතිපාදනයක් අරගෙන මොනවා හරි කරන්න. මොකද අපි ක්‍රිඩාංගණය විශාල මුදලක් වැය කරලා තිබෙන්නේ. කොට්ඨාශ වල වැඩ කටයුතු ගොඩක් ඇණ හිටලා තිබෙන්නේ. එක නිසා

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කොට්ඨාශවල වැඩ කටයුතු දැනට කෙරිගෙන යනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, නැහැ මා අයවැය ලේඛණයේ බැලුවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීවරු විසින් එය කරන්න ඕනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>**

ඒ තියෙන එක නෙමේ. මේ වගේ තිබෙන යෝජනා එකින් එක අරගෙන බැලුවාම මා දැක්කා සියක් විතර යෝජනා. මේ අයවැයේ තිබෙන්නේ එකක් දෙකක් කොට්ඨාශවල තිබෙන ඒවා. ඒවා අවසන් කරන්න. ඔබතුමා මන්ත්‍රීවරුන්ට එය දුන්නායි පසු එය කරාවි. නොකර ඉන්නේ නැහැ. එමනිසා ඔබතුමා එක ගැනත් බලන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්රීතුමා ඔබතුමා ආවාද අපි කොට්ඨාශ මන්ත්‍රීවරුන්ගේ ප්‍රගති සමාලෝචන වැඩ සටහනක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>**

මා ආවා. මා ඇවිලත් ඕක කිවුවා. ඔබතුමා දන්නේ නැහැ මා ආවා විත්තිය.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ග්‍රේෂන් මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ සියළු වැඩ කොටස් ටික අවසන් කර තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>**

ඒ වගේම කොට්ඨාශ 13 ම කරන්න ඕනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි එයට උදවු වෙනවා කරන්න. වැඩ කරන්න ඕනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>**

අපි නෙමේ ඇත්තටම කළුවඩුමුල්ලේ කාණු පද්ධති තිබෙනවා. මිනිසුන්ට ඇත්ත වශයෙන්ම කාණු පද්ධති විශාල වශයෙන් හදන්න තිබෙනවා. ළිඳේ තිබෙන තත්ත්වයන්. නගර සභා ළිඳ. අපි කියන්නේ ඒවා තර්ක කිරිමක් නෙමේ. මා කියන්නේ මෙතැනට දැන් විශාල මුදලක් යට කරලා තිබෙන්නේ. නගර සභාව ලක්ෂ 300 ක් විතර වැය කරලා තිබෙනවා මෙයට. මා කියන්නේ එක. මේ ගොඩනැඟිල්ල කියන එක අත්‍යවශ්‍යම කරුණක් වශයෙන් සලකනවා නම් ප්‍රතිපාදනයක් හරි ගෙන කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලක්ෂ 300ක් වියදම් ගිහින් නැහැ නගර සභාවට. අපි එක සැරයක් ඉදිරිපත් කළා. ඒ දින වෙනකොට ලක්ෂ 79 ගිහින් තිබුණේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>**

අරගෙන වාර්තාව ඉදිරිපත් කරන්න ඔබතුමා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපේ සරත් මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි අපි ඉදිරිපත් කළා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>**

එක නෙමේ . ඔබතුමා එකතු කරලා බලන්න. ඔබතුමා දන්නේත් නැහැ. මා කියන්නේ මෙකයි. අපේ ගොඩනැඟිල්ල ඉදිකරනවාට නෙමේ. මේකටම යට කරනවා වගේම මෙකේ සැහෙන මුදලක් . මේක අමතර මේවා එකක්. එකනිසා අපි ඉල්ලා සිටිනවා එය කරන්න කියා. නැතිනම් මේ මුදල් එක තැනකට යට කරලා මේ සංවර්ධන වැඩ කටයුතු සිදු නොවේනා කියන එකයි අපේ හැඟිම. එකනිසා මා මන්ත්‍රිවරුන්ට කියා සිටිනවා මේ මුදල් එකම තැනකට යනවා බර ගාණක්. මේ ගොඩනැඟිල්ලත් එක්කම. අනිත් එක තිබෙන්නේ ඉඩකඩ ඔතනමයි. ඔක තමයි තිබෙන්නේ ඔක්කොටම. එකත් ගොඩනැඟිල්ලක් ගැහුවාම දෙයියන්ගේ පිහිටයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා අදහස් දැක්වීම ගැන කතා කළොත් මෙය සැදීම වැදගත් දෙයක්. එක තර්ක කරන්නේ නැහැ. නමුත් සභාවේ මුදල් නැතුව බැරිද ? ඔබතුමලාට බැරිද ක්‍රිඩා අමාත්‍යතුමාට කතා කරලා එහෙම මුදල් ගෙන මෙය හදන්න. සභාවේ මුදල් යට කිරිමෙන් ඇත්තටම ගම්වල මුකුත් වැඩක් කෙරෙන්නේ නැහැ. ඇත්තටම දැන් අපේ කියන කියන දේ කෙරෙන්නේ නැහැ. මුදල් නැති කමද නොකෙරෙන කමද දන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමිය මෙහෙමයි . මේ වැඩසටහනේ බලාපොරෝත්තු වෙන්නේ සභාවේ මුදල් . අපට පලවෙනියෙන්ම සභාවේ මුදල් වියදම් කරන්න වුණත් අපිට එහි වෙළඳසැල් දෙක හැදුවාම එකෙන් අපි බලාපොරෝත්තු වෙනවා අඩුම ගණනේ වෙළඳසැල් දෙකෙන් ඇපතැන්පත් මුදල් ලක්ෂ සියයක් විතර ගන්න පුළුවන් කියා. ඒ මුදල් වලින් තමයි ඉහළ මහල හදන්නේ. ඒ විදියට අපිට නිර්මාණය කරගෙන යන්න පුළුවන්. මෙකෙන්ම උපයන මුදල් වලින් අපිට පුළුවන් කරගෙන යන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය  කතා කරමින්</u>**

ආදායම් එන විදියක් කරගෙන යන්න

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ආදායම් එන විදියට තමයි කරගෙන යන්න යෝජනා කරන්නේ . නැතුව නැති වෙන විදියක් නෙමේ. මේ තුළිනුත් අපි ආදායම් උත්පාදනය කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

නැතිනම් මා බැලුවේ සභාවේ මුදල් ඔකට යට කළහොත් එහෙම ගම්වල වැඩ කරන්න බැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගම්වල වැඩ කෙරිගෙන යනවා. එහෙම වැඩ නොකර ඉන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අහන්නත් සතුටුයි. බාලගිරි දෝෂය අද නෙමේ හෙට වගේ මිනිසුන්ගෙන් අපි මහජන නියෝජිතයන් හැටියට ගොඩක් බැණුම් ඇහුවා. නගරයට වැඩ කරන්න පත් වූ මන්ත්‍රීවරුන් විදියට. ලොකු ගැටළුවක් තිබුණා. මොකද ලොකු ගැටළුවක් තිබුණා මේ ක්‍රිඩාංගණයනයයි තනායමයි සම්බන්ධව. ඇත්තටම අහන්න සතුටුයි නොවැම්බර් 10 වෙනිදා මේක විවෘත කිරිම සම්බන්ධව. මේ ක්‍රිඩාගාරයයි කඩ කාමරයි හදන එක හොඳයි. යම්කිසි පිළිවලක් තිබෙනවා. වටිනාකමක් තිබෙනවා. මාගේ කොට්ඨාශයේ වසර 30, 40 තිබෙනවා කාණු පද්ධති සාදා නොමැති එවා. අඩුම ගණනේ සභාපතිතුමාගේ යෝජනාවක් හරි දමා මෙය කරන්න. පොඩි පොඩි වැඩ තිබෙනවා. ඒවා කොන්ත්‍රාත් දෙන්න වැඩක් නැහැ. මේ අපේ තාක්ෂණසේවා නිලධාරින් එක්කගෙන ගිහින් මේ යෝජනා ඉදිරිපත් කර ස්ථිර කරපුවා මෙහි අනත්තවත් තිබෙනවා. ප්‍රජා මණ්ඩල හරහා. එහි ලොකු වටිනාකමක් තිබෙනවා. පොඩි පොඩි වැඩ කොන්ත්‍රාත් නොදී කරන්න පුළුවන්. හැම ගමකම තිබෙනවානේ. ඒවාට මුල්තැන දෙන්න. මා නම් ඕනම දෙයකට නගරයේ දියුණුවට සභාපතිතුමා ඇතුළු සභාවට උදවු කරනවා. එක මගේ යුතුකම. එය කඩාකප්පල් කරනා නම් අපේ රාහුල මන්ත්‍රිතුමා ඔය හැම දෙයක් සම්බන්ධවම කතා කරනවා. එතුමා විරුද්ධව කතා කරනවා නෙමේ . එතුමා හරි දේ කතා කරන්නේ. නමුත් අපි ඒ දේවල් වලට එකඟයි. ඔබතුමා හරි දෙයක් කතා කළොත් අපි ඒ දේවල් වලටත් එකඟයි. දේශපාලනික වශයෙන් පක්ෂ පාට වශයෙන් වැඩ කරනවා හැම දෙයකටම. එමනිසා ඔබතුමාගෙන් ඉල්ලිමක් කරන්න කැමතියි. කොට්ඨාශ වල මන්ත්‍රිවරු මා උදාහරණයක් කියන්නම් පණ්ඩුල මහතාගේ නිවස අසළ. 2018 වසරේ නියෝජනය කළ මන්ත්‍රිවරයෙක් වශයෙන් නියෝජනය කළ දිනයේ සිට මේ යෝජනාව දැම්මා. එය බොහෝ දුරට ගරු සභාවෙන් කරන්න පුළුවන්. එකට කොන්ත්‍රාත්කරුවන් අවශ්‍ය නැහැ. මේ වගේ වැඩ සභාපතිතුමාගේ යෝජනා වශයෙන් දමා කළ හැකියි. ඇත්තටම කනගාටුයි. පණ්ඩුල මහතා මේ ළඟදි දිනයකදිත් පැමිණ ඇහුවා මොකද මෙය කෙරෙන්නේ නැත්තේ කියා. මා කිවුවා මෙහෙම ප්‍රශ්න තිබෙනවා. කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රශ්න තිබෙනවා. එමනිසා ඔබතුමාගෙන් ඉල්ලිමක් කරන්න කැමතියි. කොට්ඨාශ වල පොඩි පොඩි අඩුපාඩුකම් තිබෙනවා. කාණු පද්ධති තිබෙනවා. ඒවාට මුල්තැන දෙන්න. ප්‍රජා මණ්ඩල හදන්න මා එන්නේ නැහැ එහෙම වැඩ නොකෙරුණොත් . මොකද ප්‍රජා මණ්ඩල හදලා වටිනාමක් දිලා අපේ වැඩ නොකෙරුණොත් වැඩක් නැහැ මන්ත්‍රිධුරය සම්බන්ධව. ඔබතුමාගෙන් ඉල්ලිමක් කරන්න කැමතියි. ක්‍රිඩාංගණය අවශ්‍යයි. ක්‍රිඩාගාරය අවශ්‍යයි. කඩකාමර ගසා ඒවා කරන්න. කොට්ඨාශවල ඔබතුමාට කරන්න පුළුවන් ඒවා කරන්න. අපිට එක ඔනේ නැහැ. ලකුණු ඕන නැහැ. ප්‍රශ්නයක් නැහැ. අපේ යුතුකම අපි ඉටු කරන්න. පොඩි පොඩි දේවල් තිබෙනවා කොට්ඨාශ 13ම. අපි නගරය සංවර්ධනය කරන්න. ගරු උප සභාපතිතුමාටත් ඔබතුමාටත් මන්ත්‍රිවරුන්ටත් ඒ සම්බන්ධව මුදල් ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි . ලක්ෂ්මි හේමන්තා මෙනවිය  කතා කරමින්

ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ නගරයේ තාක්ෂණසේවා මහත්වරු නැහැ. අනිවාර්යෙන් කියන්න කොහේ ගියත් කමක් නැහැ. සභාව දවසට මෙතැනට එන්න කියා. අපි එගොල්ලන් එක්ක එපැයි සාකච්ඡා කරන්න. ඔබතුමාට අපි කිවුවාට ඔබතුමා සංවර්ධන කටයුතු කරන්න දන්නේ නැහැනේ. ඇයි අද වගේ දිනයක එන්න බැරි. අද වගේ දිනයක මෙතැන ඉන්න ඕනේ. අපි කතා කරන්නේ කවුරු එක්කද ? පාඨලි මහත්මිය සමහර ප්‍රදේශ දන්නේ නැහැ. අපි කතා කරන්නේ කවුරු එක්කද? දෙවැනි කරුණ තමයි ඔබතුමා මේ යෝජනාව ගෙනා එක හොඳයි. එතුමිය මගේ කොට්ඨාශයේ වටරවුමක් ගැනවත් දනනේ නැහැ. එතුමිය මට දුරකථනයෙන් කතා කර අසනවා. අසරණයි. දන්න මිනිසුන් පැත්තක ඉඳගෙන කොහේ හරි හෙංචයියෙක් දමනවා. මේ වැඩ වලට. ඊට පස්සේ අපි කෝලම් වගේ. අපි පිස්සෝ වගේ ගම්වල. මේ සභාවක ගණකාධිකාරිතුමිය ඉන්නවා, ලේකම්තුමිය ඉන්නවා. අදාල මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරු ඉන්නවා නම් තාක්ෂණසේවා නිලධාරින් මෙතැනට එන්න එපැයි. පිළිතරු දෙන්න. කතා කරන්නේ කවුරු එක්කද අපි.  එතකොට මේ ඔබතුමා ගෙන ආ යෝජනාව හොඳයි. එකට අපි බොහොම කැමතියි. අර අයිරාංගනි මන්ත්‍රීතුමිය කිවු පරිදි ක්‍රිඩා අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කර මොකක් හරි උදවුවක් ගන්න පුළුවන්.  එක හොඳයි. එතකොට කියන්න ඕනේ . ගොඩක් අය කියනවා මේ ගම්වල ගොඩක් වැඩ කෙරිලා නැහැ කියා. අපේ ගමේ නම් ලොකු වැඩක් කරන්න නැහැ.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

මට ක්‍රිඩා ආමත්‍යතුමාගෙන් මුදල් ඉල්ලා ගැනිම සුළු දෙයක්. අපි තල්ගස්ගොඩ අලුතින් ක්‍රිඩාංගණයක් ඉදිකරනවා. ලක්ෂ සියයක් යනවා. එයට මුදල් ඉල්ලා ගැනිමට මගේ බලාපොරෝත්තුව තිබෙනවා. ඒ දේ කරන්න. එතනත් මිටර් 500ක පරිධිය ඇති ක්‍රිඩාංගණයක් හදන්න පුළුවන්. අපි එය ගිහින් බැලුවා. දැනට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට දමා තිබෙනවා එක ක්‍රිඩාංගණයක් හදන්න. එක නැති වෙනවා. එමනිසා මෙකත් හදන්න . එකත් හදන්න. පුළුවන් දෙයක් අපි කරන්න.

ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි . ලක්ෂ්මි හේමන්තා මෙනවිය  කතා කරමින්

අපේ කොට්ඨාශයේ අපිට ගම්පෙරළිය යටතේ අපිට පාරවල් ටිකක් කෙරුණා. ඒ හැර දැන් සපිරි ගමක් යටතේ දමන ලද ලක්ෂ 20ම යොදවා වැඩ කටයුතු අවසන් කර තිබෙනවා. මට ප්‍රතිපාදන ආවා වුණත් මට නිලානි මන්ත්‍රිතුමිය මට මොනවා කිවාත් මා සාමාන්‍යයෙන් මුකුත් කාටවත් කියන්න කැමැති නැහැ. එතුමියත් මැදිහත්වෙලා අපේ ලක්ෂ 20 වැඩ කරලා තිබෙනවා. අපේ ගමේ ලොකු වැඩ කොටසක් නැහැ. අපිට තිබෙන්නේ දැන් තුඩුවමුල්ලේ කාණු පද්ධතිය හා අර ඉරෝෂ්මි බින්දුහේවා මහත්මියගේ නිවස අසළින් යන පාර. ඔන්න බලන්න සභාපතිතුමා වැඩ. ඉරෝෂ්මි බින්හේවා මහත්මියගේ නිවස අසළින් යන පාර මේ ඉන්නවා සාක්ෂි. මේ මන්ත්‍රිතුමලා. මෙය කරනකොට මා කිවුවා අර ගැට්ටක් තිබෙනවා. ගැට්ට කඩලා කරන්න කියා. එයට තාක්ෂණසේවා නිලධාරි මහතා මා සමඟ දුරකථනයෙන් හොඳටම බැණ ගත්තා. මට බැන්නා. ඔබතුමිලා සභාපතිතුමලා කියන විදියට මට වැඩ කරන්න බැහැ කිවුවා. එහෙම කිවුවා මට.

මෙන්න සාක්ෂි . දැන් මට යන්න බැහැ. වතුර වළක්. අර ළමයි පාසැල් යන්නේ සපත්තු ගලවා ගෙන. ඒ මදිවට දැන් ඊයේ පෙරේදා අපේ නැති වූ අම්මා , තාත්තා මතක් කර බනිනවා හොඳටම.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඊයේ පෙරේදා නිලානි මන්ත්‍රීතුමිය සිමෙන්ති ඉල්ලුවේ ඔතනට දමන්න නේද? සිමෙන්ති ඉල්ලුවා මෙතුමිය. දෙන්න කිවුවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි . ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

සිමේන්ති දමා බැහැ. එතැන ලොකු වළක් තිබෙන්නේ. ඔක හරියට හදන විට ලේවල් කර හැදුවේ නැහැ. එක කිවුවාමත් මට කඩාගෙන පැනලා ඔය කලින් හිටිය ලේකම්තුමියටත් මා විස්තරය කිවුවා. එතුමිය ස්ථානිය පරික්ෂණයකට යැව්වා. හිටපු ලේකම්තුමියත් ගිහින් ඇවිත් කිවුවා හරි හරි කියා. දැන් ගිහින් බලන්න සභාපතිතුමා. මා යන්නේ නැහැ. මෙතුමියලා කියන්නේ. මහජන සෞඛ්‍ය පරික්ෂක මහතා ළඟදි ගිහින් කිවුවාලු එහි ඩෙංගු මදුරුවන් ඉන්නවා කියා. දැන් එයට මුදල් ගෙවලත් අවසන්. තාක්ෂණසේවා නිලධාරි මහත්වරු හරි කියලත් අවසන්. වචන අහන්නේ අපේ අම්මා තාත්තාලා මතක් කරනවා හොඳට ඒ මිනිසුන්. අපි මේ නුල් පොටක දෙයක් ඒ අයගෙන් අරගෙන නැහැ.අන්න එකට පිළියමක් ගන්න. තාක්ෂණසේවා නිලධාරි මහත්වරු මෙතැන ඉන්න එපැයි. අපිට උත්තර දෙන්න අහන්න. ඒ මිනිසුන් දැන් මාධ්‍යයට දමනවා කිවුවා. මාධ්‍යයට දැම්මාම රෙදි ගැලවෙන්නේ අපේ. ඕක මං එච්චර කියලත් කළේ නැහැ. මොකක් හරි විකල්පයක් දෙන්න. අපිට මේවා අහන්න තාක්ෂණසේවා නිලධාරි මහත්වරු ඉන්න ඕනේ. එතකොට ගරු සභාපතිතුමා අපේ කොට්ඨාශයේ ලොකු වැඩක් නැහැ. අපි ආපු වැඩවලින් කර තිබෙනවා. මාගේ නිවස ඉදිරිපස කාණුව නම් ඒ ආකාරයෙන් ජලය පිරි තිබෙනවා. ඒක ගැනත් කියන්න ඕන. මට මේකට අත දමන්න බැහැ. මාගේ කොට්ඨාශය 6 නෙමේ. අපේ මන්ත්‍රීතුමාට තමයි කියන්න වෙන්නේ. අපේ මේ ගේ ළඟ තිබෙන පුස්තකාලයේ ඔක්කොම කඩන් වැටිලා. මගේ කොට්ඨාශයේ නෙමේ වුණත් ඒ ටික කර දෙන්න කියනවා. අපේ කොට්ඨාශයේ ලොකු වැඩ කොටසක් නැහැ. එමනිසා අපේ කොට්ඨාශය ගැන ලොකු ගැටළුවක් ඇති කර ගන්න එපා. මේ කාණු පද්ධතියක් විතරයි තිබෙන්නේ කර ගන්න. මෙතැන කිවුවානේ වෙන කොට්ඨාශ වල වැඩ තිබෙන නිසා එය කරන්න එපා කියා. අපේ කොට්ඨාශයේ එහෙම ගැටළුවක් නැහැ කියන්න ගත්තේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, නොවැම්බර් මාසයේ 10 දා ක්‍රිඩාංගණය විවෘත කිරිම ගැන අපි සතුටු වෙනවා. මොකද අම්බලන්ගොඩ ලොකු පිපිදිමක් ඇති වෙනවා. හැමෝම අසන ප්‍රශ්නයක් තමයි ඔය ක්‍රිඩාංගණය තව නැද්ද ඉවර තව නැද්ද ඉවර. ඔය ගොඩනැඟිලි හැදිම සාමාන්‍යයෙන් ක්‍රිඩා පිටියට වටිනාකමක් එනවා. ලස්සනක් එනවා. ඒ ක්‍රිඩාගාරය , ඒ ගොඩනැඟිලි ඉදිකිරිම තුළින් ක්‍රිඩා පිටියට ලස්සනක් එනවා. කොහොම හරි ඒ කටයුතු ඒ ආකාරයෙන් කරන්න ඕන. අපේ ප්‍රදේශවල වැඩ කටයුතු කිරිමේදි අපේ ප්‍රදේශවල වැඩ කටයුතු කෙරි තිබෙනවා. ඔබතුමාගෙන් ඉල්ලන්නේ ඔය ගම්පෙරළිය වගේ ගමේ වැඩ කටයුතු කිරිමේදි ඒ කොන්ත්‍රාත්කරුවන්ට මුදල් ගෙවා නොමැති නිසා ඒ වැඩ කටයුතු සිදු නොවන්නේ ඒ නිසායි. ඒ නිසා නගර සභාව මඟින් කරන වැඩවලදි ඒ කොන්ත්‍රාත්කරුවන්ට මුදල් ලබා දෙන්න කියන ඉල්ලිම කරනවා.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

අපේ තිබෙන ඒවා අපි ගෙවලා ඉවරයි. අපිට කොන්ත්‍රාත්කරුවන් එක්කෙනෙකුටවත් ගෙවන්න තිබෙන්නේ නැහැ.

__ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම් නිලානි මෙනවිය කතා කරමින්__

ගරු සභාපතිතුමනි, මේ ක්‍රීඩාංගණය 10 විවෘත කරන එක ගැන හරිම සංතෝෂයි. ඇත්තටම මං මෙයට සතුටු වෙනවා. ජනතාව බලාපොරෝත්තු වු දෙයක් තමයි ක්‍රීඩාංගණය. පාසැල් ක්‍රීඩකයන් සඳහා ඉතා ඉක්මනින් ජනතා අයිතියට පැවරීම තමයි සිදු කළ යුත්තේ. ඒ දිනයක් දැනුම් දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිය ප්‍රකාශ කරනවා. ඔබතුමා දමා තිබෙනවා යෝජනාවක් ක්‍රීඩාගාරයක් හදන්න සහ වෙළඳසැල් ඉදිකිරිමට. අර ධර්මදාස මන්ත්‍රීතුමා කිවු ආකාරයට අලංකාරයට නෙමේ ඇත්ත වශයෙන්ම අවශ්‍ය වෙන්නේ අවශ්‍ය නම් ඒ දේවල් සෑදිය යුතුයි යන්නයි. මොකද අත්‍යවශ්‍ය නම් මේ දේවල් කරන්න. ඒ වගේම ඔබතුමාට පාර්ලිමේන්තුවේ ගරු අමාත්‍යවරු දෙදෙනෙක් ඉන්නවා ගාලු දිස්ත්‍රික්කය නියෝජනය කරමින්. මා හිතන්නේ ඔබතුමා කිවුවා තල්ගස්ගොඩ ප්‍රදේශයේ ක්‍රීඩාංගණයක් හදන්න ක්‍රීඩා අමාත්‍යතුමාගේ ප්‍රතිපාදන වලින් . එහෙමනම් අපි මෙය හදනවා නම් ඔබතුමාට ගාලු දිස්ත්‍රික්කයේ අමාත්‍යවරු දෙදෙනෙක් සිටිනවා. ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමා හා ගරු නිතිඥ මොහන් ප්‍රියදර්ශන මැතිතුමා. ඒ දෙදෙනාගෙන් ඒ දේවල් අරගෙන ක්‍රියාත්මක කරන්න. මෙතැන සිටින සියළුම මන්ත්‍රිවරු කියන්නේ නගර සභාවේ මුදල් වලින් සංවර්ධන වැඩ කටයුතු සිදු කරන්න කියා. ඒ විදියට ක්‍රියා කරන්න කියා ඉල්ලා සිටිනවා.

__ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව යටතේ ඇස්තමේන්තුවක් නම් ඉදිරිපත් කරලා නැහැ. ඇස්තමේන්තුවත් අපි සලකා බැලිය යුතුයි. මොකද නගර සභාවට ඔරෝත්තු දෙන වැයක් ඔනේ අපි දරන්න. ඔබතුමාට ඒ ශක්තිය තිබෙනවා නම් එය මහ ලොකු ගැටළුවක් නැහැ. මා විශ්වාස කරනවා ඔය කොටසේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ක්‍රීඩා කටයුතු කළා. පුහුණුවීම් කටයුතු කළා. පාසැල් හෝ පාසැල් හැරගිය අය ඉදිරියේදි ක්‍රීඩාංගණය හතර වටෙන්ම අහුරලා තිබෙන නිසා හදිස්සියේවත් ක්‍රීඩකයෙක් ආවොත් ක්‍රීඩා කරන්න ඉතිරිවෙලා තිබෙන්නේ ඔය කොටස විතරයි. එක එක පැත්තක්. අනිත් පැත්ත මා දකිනවා වානිජමය වශයෙන් වෙළඳසැල් සඳහා මෙහි වටිනාකමක් තිබෙනවාද කියා. මොකද අපි මේ අපනශාලාව ගත්තාත් රු.10000/= කට මෙය බදු දිගන්න බැහැ. මේ මනුස්සයාට රු.10000/= සොයා ගන්න බැහැ මේ වෙළදාමෙන්. මේ හරිය එහෙම වානිජ්‍ය වෙලා නැහැ. ඔය හිස් ඉඩම්. ඩී.ජේ. ලාගේ වුණත් හිස් ඉඩම් වශයෙන් තිබෙන්නේ ඒ නිසායි. සමාගමක් අරගෙන මොකක් හරි දැම්මොත් ඔය රොසෙල් වගේ සමාගමක් දැම්මොත් එහෙම . සාමාන්‍ය යෙන් වාණිජ්‍ය ආයතනයක් මෙය අරගෙන කළොට වෙළඳාම් තිබෙද කියන එක ගැටළුවක්. ඒ හැර ඔය දුන්නොත් ඒ අයගේ වාහන නතර කිරිමේ ආයතනයක් වෙනවා . එමනිසා වෙළඳ කුටි සෑදිම ගැන ඔබතුමාට තව දුරටත් කල්පනා කරන ඉල්ලිම කරන්න කියා ඉල්ලා සිටිනවා. ක්‍රීඩාගාරය සෑදිම ගැන අපේ විරෝධතාවයක් නැහැ. එය අවශ්‍ය කොටසක් නිසා ඔබතුමාගේ සිතුවිලි පරිදි එය කරන්න කියන ඉල්ලිම මා කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ යෝජනාවට විරුද්ධ අය කවුරුත් ඉන්නවාද ? ඒකමතිකව සම්මත වෙනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ නව ක්‍රීඩාගාරයක්, වෙළඳසැල් කිහිපයක් ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**05.01.02 2021 වසර සඳහා අඩු ආදායම්ලාභී පාසල් ළමුන් සඳහා අභ්‍යාස පොත් ලබාදීමට සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2021 වසර සඳහා අඩු ආදායම්ලාභී පාසල් ළමුන් සඳහා අභ්‍යාස පොත් ලබාදීමට සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා වෙනත් කරුණු යටතේ කතා කරන්න හිටියේ. මේ පාර ලක්ෂ 40ක් විතර දමා තිබෙනවා නේද? කලින් ලක්ෂ 50 ක් විතර ඇති.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගියපාර ලක්ෂ 50න් 38ක් වැයවෙලා තිබෙනවා. .

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

මෙය දෙන ක්‍රමවේදය මොකක්ද දන්නේ නැහැ. ගියපාර දිපු විදියටම කොට්ඨාශ වලට.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගියපාර දිපු විදියට

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

දැන් මෙහෙම දෙයක් තිබෙනවා. අයදුම්පත් 150කට වගේ හම්බවුණා. මා ඔක්කොම ලියාගෙන කරගෙන තමයි ඔක්කොම දුන්නේ. කාටත් මා කිවුවා මගේ ළඟ අයදුම්පත් ටික තිබෙනවා. මට සියළු ළමයින්ට මෙය ලැබිය යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , ක්‍රමවේදය මොකක්ද දන්නේ නැහැ. ගියපාර දීපු විදියට දෙන්නේ. කොට්ඨාශ වලට දෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කොට්ඨාශ වලට දෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මෙහෙම එකක් තිබෙනවා. මගේ කොට්ඨාශයේ අයදුම්පත් 150 ක් වගේ මන්ත්‍රිවරයෙකුට හම්බ වුණා. ඒ හම්බවුණු එවා මා අයදුම්පත් දුන්නේ ඔක්කොම ලියාගෙන කරගෙන. එම විෂය නිලධාරිටත් මා කිවුවා මාගේ ළඟ කොළ ටික තිබෙනවා. මට සියළු ළමයින්ට මෙය ලැබිය යුතුයි. දේශපාලනයක් නැහැ. මා එම අයදුම්පත් දේශපාලනයකින් තොරව සෑම නිවසකටම ළඟට ගිහින් දුන්නා. මාගේ ළඟට එන්න තියා ගත්තේ නැහැ. සාමාන්‍යයෙන් මන්ත්‍රිවරු කියන්නේ ළඟට එන්න තියා ගන්නවා. හැම නිවසකටම ගිහින් පාසැල් යන ළමුන් සිටින හැම නිවසකටම ගිහින් මෙම අයදුම්පත් 150 බෙදුවා. ඔබතුමාගෙනුත් මා අයදුම්පත් 05ක් ඉල්ලා ගත්තා. ගරු සභාපතිතුමනි මෙය මදිවෙලා තිබෙනවා කියා. ඉතිං මා මේ ලියාගෙන කරගෙන මේ අයදුම්පත් ටික දුන්නේ. මට කියන්න කනගාටුයි. මෙතුමාට ඇඟිල්ල දික් කරන්න වෙනවා. ගරු ශ්‍රේෂන් මන්ත්‍රිතුමාට . දීපු කොළවල මෙය බොරු කරන්න බැහැ. ඒ දීපු අයදුම්පත් වල මා ලිපිනයන් ලියාගෙන තිබෙන්නේ. මාගේ නිවසට පැමිණියා අයදුම්පත් දෙන ලැබු තුන්දෙනෙකු මට පොත්ටික හම්බ වුණේ නැහැ. මාගේ නමට වෙන කෙනෙකුට එම පොත්ටික දී තිබෙනවා මන්ත්‍රවරයෙක්. එතුමාත් එක්ක පුද්ගලික තරහාක් නැහැ මා. ඔබතුමාට හොඳ නැහැ සභාපතිතුමා විදියට.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ කියන්නේ මොකක්ද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ඒ කියන්නේ අයදුම්පත් මේ නමට නැතුව එදාට එන්න කියා දෙනු ලැබුවා කොළයක් . ඒ කියන්නේ මේ නම් නැතුව වෙන නම් පුරවා දීලා ඒ පොත්ටික ගියා. එවිට මා අපේ විෂයභාර ප්‍රජා සංවර්ධන නිලධාරි හෙවුවා මොකක්ද වෙලා තිබෙන්නේ කියා. ඒ වේලාවේම මා සභාපතිතුමා මුණ ගැසෙන්න කලින් ශ්‍රේෂන් මන්ත්‍රිතුමා නගර සභාවට ගෙන්නුවා. වැඩක් නැහැ. මා මේ කිවුවේ වෙච්ච දෙයක්. එහෙම වෙන්න දෙන්න එපා. මෙතුමා එයට සාධාරණයක් කළා. පොත්ටික මුදල් වලින් මෙතැනට ගෙනත් අරගෙන දුන්නා. එතුමා අරගෙන දෙන එක නෙමේ. මේ වගේ කොච්චර දේවල් වෙන්නැතිද කොට්ඨාශ වල. මා පුද්ගලික නම් වශයෙන් කියන්නේ නැහැ. මට ආරංචි වෙච්ච විදියට.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිතුමා අපි අතින් නම් එහෙම වරදක් සිදු වුණේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ඔබතුමා අතින් නෙමේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වරදක් වෙලා තිබෙනවා නම් එයත් නිවැරදි කරයි  කරන විදිය එහෙම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

කොට්ඨාශයකට 150 වුණාට සමහර කොට්ඨාශවල 400, 350 වගේ ගියා. බල ප්‍ර දේශයෙන් පිටත් මේ කොළ ගියා. ග්‍රාමසේවක මහතුන් මෙය අත්සන් කර දි තිබෙනවා. මා දැනුවත් . මා නම් එක්කම කියන්නම් ඕන නම්. කොට්ඨාශවල එහෙම අනවශ්‍යයි. මෙය බොහොම වැදගත් කටයුක්තක්. පාසැල් ළමුන්ට අපි හරි ආශාවෙන් මේ පොත්ටික දෙන්නේ. රටේ ආර්ථික තත්ත්වයත් එක්ක. මෙය විනිවිදභාවයකින් කෙරෙන්න ඕනේ. පොත් කට්ටල කියද ? ගහන්නේ කොහොමද ? විනිවිදභාවයකින් තියෙන්න ඕන. අපිටත් හොඳ නැහැ. ඔබතුමාටත් හොඳ නැහැ. තව එකක් තිබෙනවා. මා කොට්ඨාශයේ මන්ත්‍රීවරයා . මා කොට්ඨාශයේ එම අයදුම්පත් දේශපාලනයකින් තොරව දෙනවා නම් පිටස්තර අයට මෙය දිලා මන්ත්‍රීවරයාගේ ගරුත්වය නැති කරන්න එපා. එය ඔබතුමාගෙන් කාරුණික ඉල්ලීමක් කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි කවදාවත් මන්ත්‍රීවරයාට හැර කිසිම පිටස්තර කෙනෙකුට දි නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

මා දෙනකොට අපි කට්ටිය අරගෙන දිපු එවා තිබෙනවා. මා මේ බොරු කියනවා නෙමේ. එහෙම කට්ටියට දිලා. එහෙම නම් ඒ අයටම දෙන්න. කිසිම ප්‍රශ්නයක් නැහැ. මන්ත්‍රීවරයාගේ ගරුත්වය රැකෙන විදියට කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ කියන්නේ ඔබතුමාගේ කොට්ඨාශයේද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

මා දන්න හින්දා කියන්නේ. දෙන්නෙක් තුන්දෙනෙක් මේ අයදුම්පත් බෙදුවා. මා දන්න කතන්දරය. එහෙම වෙන්න දෙන්න එපා. මා හිතන්නේ හැම කොට්ඨාශයකම ඇති ඔය කතන්දරය.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කොට්ඨාශ දෙකයි ප්‍රශ්නයක් තිබෙනවා නම් තිබෙන්නේ. හිරේවත්ත සහ පෝරඹ. දැන් අපෙත්ත පාර්ශිකයන් ඉන්නවානේ. ඒ පාර්ශිකයන් ගොඩක් වෙලාවට කියන දෙයක් තමයි ඔබතුමාගෙන්

මෙය හම්බ වෙන්නේ නැහැ. අපිට මෙය දෙන්න. එතකොට අපි මෙයට ගන්න පියවරක් වශයෙන් ගන්න පියවර තිබෙනවා. ඒ වගේ එක්කෙනෙකු ආවොත් අපි දෙනවා. වුණේ එකයි. ඔහොම සාධාරණව කරනවා නම් හොඳයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

බලනකොට කියා තිබෙනවා. අතුල දි තිබෙනවා කොළ. මට කොළ ඉතිරි වුණා. මා දඩබඩ ගා කොළ ටික දුන්නා. එය දේශපාලනයකින් තොරව දෙනවානේ. එමනිසා උපරිම විනිවිදභාවයකින් මේ වැඩ කටයුතු ටික කරන්න කියා ඔබතුමාගෙන් ගරු සභාපතිතුමා විදියට ඉල්ලා සිටිනවා. මොකද අපි සත්භාවයෙන් දෙනු ලබන පොත් කට්ටලය. මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය තිබෙන විදියට. අනිත් එක තව දෙයක් තිබෙනවා. මන්ත්‍රීවරයා හැල්ලුවට ලක් කරන්න එපා පොත් දෙන දවසට. ගරු ස්වාමීන් වහන්සේලා ඉදිරිපිට දෙන එක හොඳයි. එක වැදගත්. හැම කොට්ඨාශයකම එහෙම කෙරෙන්න ඕන. මොකද දේශපාලන හේතුන මත සමහර කොට්ඨාශවල ගරු ස්වාමීන් වහන්සේලා අතින් දෙනවා. සමහර කොට්ඨාශවල මන්ත්‍රීවරයා අතින් දෙනවා. එතකොට අර කොට්ඨාශයේ මන්ත්‍රීවරයාට තිබෙන තැන ඉබේම නැති වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි ගරු ස්වාමීන් වහන්සේලා හැරෙන්න අපි බෙදුවේ නැහැ එක පොතක්වත්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එකතැනක එය සිද්ධ වුණා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ස්වාමීන් වහන්සේ නැති තැනක එහෙම වුණේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

මා කියන්නේ එහෙම වෙන්න දෙන්න එපා කියා. මට ආරංචියක් ආවා එහෙම වුණා කියා. විහාරාධිපති හිටියේ නැද්ද කොහේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

විහාරාධිපතිහිමි නැති වුණාම ගැටළුවක් වෙනවා. අපි විහාරාධිපතිහිමිගේ අතින් තමයි හැම පොතක්ම දි තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

විහාරාධිපති නැති වුණාට විහාරස්ථානයක සිටින්නේ එක ස්වාමීන් වහන්නේ කෙනෙකු නෙමෙයිනේ. එම නිසා එම වැඩකටයුතු කරද්දි මීට වඩා සැලකිලිමත් වෙන්න කියා ඉල්ලා සිටිනවා. එහෙම වෙන්න දෙන්න එපා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ඔබතුමා පාලක පක්ෂයට ආවානම් ඉවරයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, දරුවන්ගේ සිත් සැනසූ අභ්‍යාස පොත් ලබාදීමේ වැඩසටහන ගැන කොයි කාගේත් සිත්වල ඇත්තේ ප්‍රසන්න අදහසක්. මෙම වැඩසටහනේදි අපත් බොහෝ දුෂ්කරතාවයන්ට මුහුණ දුන්නා. ඔබතුමන් මේ අභ්‍යාස පොත් ලබා දිමේ සුදුස්සන් තොරද්දි ග්‍රාම නිලධාරි සහතික කිරිමේදි මාත් ගොඩක් අසිරුතාවයට පත්වුණා. අපේ ග්‍රාමනිලධාරිණියගේ ඇතැම් දැඩිබව නිසා අපේ බල ප්‍රදේශයේ දරුවන් පනහකට හැටකට එම නිර්දේශය ගන්න වුණේ නැහැ. එමනිසා අපිට වෙනත් මං සොයන්නට උත්සාහ ගන්නට වුණා. එත් නියම දින පනහකට වගේ ඒ පොත් ලබන්නට නොහැකි වුණා. ඒ නොහැකි වුණු දරුවන් අපේ ගම්මානයේ මෙතැන ගෙන්වා පෝලිම් ගස්සවා ඒ පොත් ලබා දෙන්න සිද්ධ වුණා. මේ ග්‍රාම නිලධාරින්ට අපේ රජය අනිසි විදියට බලයක් ලබා දෙනවා කියා මා හිතනවා .මෙන්න මේ බලය අපේ මේ නගර සභාවෙන් දෙනු ලබන පොතෙනුත් ඇයි ඔවුන් පුම්බන්නට උත්සාහ දරන්නේ. එමනිසා අපි ග්‍රාම නිලධාරි නිර්දේශයෙන් තොරව ලබා දෙනවා නම් හොඳයි. අපේ ගමේ විහාරස්ථානයේ ගරු ස්වාමින් වහන්සේ සිටිනවා . අපේ මේ වගකීම් දරන ගමේ මන්ත්‍රිවරුන් සිටිනවා. එමනිසා මෙවර වැඩපිළිවෙලේදි වෙනත් ආදේශයකට යන්න. මෙවැනි වැඩ කිරිමේදි. අපි ඒ වගේම සඳහන් කරනවා .

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ගරු මන්ත්‍රිතුමා, මෙහෙමයි ගමේ සිටින පුද්ගලයන්ගො ආර්ථික තත්ත්වය මනින්න පුළුවන් හොඳම නිලධාරියා ග්‍රාම නිලධාරියා. අපි එයට වෙන කෙනෙකු යොදවන එක සුදුසු නැහැ. එයා ළඟ නේ තිබෙන්නේ අඩු ආදායම්ලාභින්ද කියන එක. මේක දෙන්න එපා. මුදල් තිබෙන කට්ටියට. කරුණාකරලා මන්ත්‍රිවරුන්ට කියන්නේ. දුප්පත් මිනිසුන්ට දෙන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මේ පොත් ලබා දිමේ වැඩපිළිවෙලේදි බොහොම කඩිනම් වැඩක් ළමයින් දහස් ගාණක් සතුටු කරපු. මේ වැඩපිළිවල ක්ෂණිකව අපේ බල ප්‍ර දේශයට අයදුම්පත් 125 ක් 130 ක් වගේ ලැබි තිබුණා. එම ප්‍රමාණය කඩිනමින් බෙදා දිය යුතුව තිබුණා. අපේ නගර සභාවේ එම ලිපි බෙදන නිලධාරින් එම කාර්ය කළ නොහැකි නිසා අපේ ග්‍රාමයේ කිහිප දෙනෙක් යෙදෙව්වා සුදුසුසන් තෝරා දෙන්න කියා. එහිදි මේ අතුල මන්ත්‍රිතුමා දෙනු ලැබූ අයදුම්පත්‍ර දෙකක් අතුරු දහන් වි වෙනත් කෙනෙකු පොත් ලබාගෙන තිබුණා. මා ඒ වෙනකොටත් එම පොත් ලබා දුන්නා අපේ මුදලින්. නමුත් ගරු සභාපතිතුමනි, කල් ඇතිව මේ වැඩසටහන පටන් ගතහොත් හොඳයි.

කඩිනම් වැඩ කරන්න ගියාම අන්න අපිට ඒ වගේ දුෂ්කරතාවයන්ට මුහුණ දෙන්න වෙනවා. ඔබතුමාගේ වරදක් නෙමේ. මේක මේ කාලය නිසා තමයි ඒ දේ වුණේ. එමනිසා ඒ දේ සඳහන් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔබතුමා ගෙන එනු ලැබු යෝජනාවට අපගේ ස්තුතිය පුද කරනවා. ඒ වගේම කියන්න ඕන ටික අතුල මන්ත්‍රිතුමා විසින් සභාවට ප්‍රකාශ කළා. ඒ ගැනත් එතුමාට ස්තුති වෙමින් , ගරු සභාපතිතුමනි , ඒ වගේම මන්ත්‍රිවරු කිවුවාම ජාතික ලැයිස්තුවේ මන්ත්‍රිවරු සිටිනවා. ඒ වගේම නියෝජිතයන් වශයෙන් පත්වෙච්ච මන්ත්‍රිවරු සිටිනවා. මා හිතන්නේ අද අපේ පාර්ලිමේන්තුවේ අධිකරණ අමාත්‍ය ධුරය දරන්නේත් ජාතික ලැයිස්තුවේ මන්ත්‍රිවරයෙක්. ඒ වගේම අපේ අධ්‍යාපන අමාත්‍ය වශයෙන් කටයුතු කරන ගරු ජී. එල් පිරිස් මැතිතුමාත් අද ජාතික ලැයිස්තු මන්ත්‍රිවරයෙක්. එහෙමනම් ඔබතුමාගේ යුතුකමක් ඉෂ්ඨ කරන්න තමයි පොත් ලබා දෙන අයදුම් පත් ලබාදිමේදි සියළු දෙනාටම එක ප්‍රමාණයෙන් ඒ දේවල් ලබා දිලා ජනතාවට සේවය කරන්න. මොකද මේ පාසැල් පොත් ලබා දිමේ කටයුත්තේදි මට මතක් වෙනවා 1998 සිට 2001 වෙනකම් මහජන නියෝජිතවරියක් විදියට අම්බලන්ගොඩ නගර සභාවේ සිටින විට මා ඔබතුමාට යෝජනා කළා මේ දේ කරන්න කියා. ඇත්තෙන්ම ඔබතුමා ඒ දේ ඡන්දයක් ලංවෙන විට දෙනවා. නැවත නොදි එහෙමම ඒ දේ අමතකවෙලා යනවා. එහෙම නෙමෙයි විය යුත්තේ අපි කළයුතු යුතුකමක් අම්බලන්ගොඩ නගරයේ ජනතාවට කළ යුතුනම් ඒ දේ සාර්ථකව සිදු කිරිමේ යුතුකමයි. එමනිසා දිර්ඝව කතා කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මොකද හොඳ වැඩක් . ඒ හොඳ වැඩයට කිසිම ප්‍රශ්නයක් ඇති නොවන විදියට අර අපගේ ශ්‍රේෂන් මන්ත්‍රිතුමා කිවුවා ග්‍රාම නිලධාරින්ගේ ප්‍රශ්නයෙක් . නමුත් මා නම් හිතන්නේ අපි පිදිය යුත්තන් පුදන්න ඕනේ. ඒ වගේම ගරු කළ යුතු නිලධාරින්ට අපි ගරු කරන්න ඕන. මා නම් හිතන්නේ එය අපි අවංකව ඉෂ්ඨ කරනවා නම් අපිට නිලධාරින් කොයි විදියට කටයුතු කළත් ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. මොකද නිලධාරින්ට ප්‍රමුඛස්ථානය දි කටයුතු කිරිම මහජන නියෝජිතවරියක් වශයෙන් අපේ යුතුකම. ඒ වගේම ඒ ග්‍රාම නිලධාරින්ට අගෞරව වෙන විදියට කියන්න එපා. ඒ අය කරන්නේ ඔබතුමා කිවු පරිදි ඒ අයගේ යුතුකම තමයි ඒ අය ඉටු කරන්නේ. පසුගිය වර පොත් බෙදා දිමේදි ලොකු තදබදයක් අපේ නිලධාරින්ට ඇති වුණා. එමනිසා ඒ නිලධාරින්ට ඒ තමන්ට පවරන වැඩය සාරථක අයුරින් කරන්න අවස්ථාව ලබා දෙන්න. මේ යෝජනාවට අපේ උපරිම ශක්තිය ඔබතුමාට ලබා දෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සෝභිත මන්ත්‍රිතුමාගේ මස්සිනා නැතිවෙලා. අපි දැනගත්තෙත් මේ අවස්ථාවේ. එම අවමංගල්‍යයට සහභාගි වීමට අවශ්‍ය නිසා වැඩිදුර කතා කරන්නේ නැහැ. අපි දැන ගත්තෙත් මේ සරත් මන්ත්‍රිතුමා කි පසුවයි. මා එම අවමංලා පිළිබඳ සියළුම මන්ත්‍රිවරුන් වෙනුවෙන්ගේ හා සියළුම නිලධාරින්ගේ ශෝකය මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. ඇත්තටම මේ පොත් දිම ගැන කතා කරන්න ඕන දෙයක් . මොකද ගිය සැරේ ලොකු අසාධාරණකම් සිදු වුණා. මා නම් ඔය

කොහොම පත්කර මන්ත්‍රී කිවුවත් වැඩ කටයුතු ටික කරගෙන යනවා. ගම්වල හරයි බලපැවා. මොකද අපේ නිවසට පැමිණ අයදුම්පත් ඉල්ලුවා . මට එම අයදුම්පත් නැහැ කියන්න සිද්ධ වුණා. අපිට ඒ අයදුම්පත් හරි විදියට ලබා දුන්නේ නැහැ. මොකද ඕක කොට්ඨාශ මට්ටමින් දිනපු මන්ත්‍රීවරු කියා කිවුවා. අර නිලානි මන්ත්‍රීතුමිය කිවූ ආකාරයට. එහෙම වෙන්න බැහැ. මේ සභාවේ මුදල් නේ යට කරන්නේ. එතකොට සභාවේ මුදල් වලින් අපිට වැටුපක් දීමනාවක් ගෙවන්නේ එක හා සමානවනේ. පත්කර මන්ත්‍රීවරුන්ට වෙනම දීමනාවකුයි පත්නොකර මන්ත්‍රීවරුන්ට වෙනම දීමනාවක් ලැබෙන්නෙත් නැහැ. පාර්ලිමේනතුව ගත්තාත් සැමටම වරප්‍රසාද එක හා සමාන ලැබෙන්න ඕන. මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ පත්කළ මන්ත්‍රී , පත්නොකළ මන්ත්‍රී නෙමේ අපි ඔක්කොම මන්ත්‍රීවරියන්. මේ පුටුවේ වාඩිවෙන්නේ ඒ වගේ තීරණ ගන්න. දැන් මාධ්‍යයට දමන්නේ නැහැනේ මේ පත්කළ මන්ත්‍රී තමයි මේ ප්‍රකාශය කළේ. පත්නොකළ මන්ත්‍රී තමයි මේ ප්‍රකාශය කළේ. එහෙම දමන්නේ නැහැනේ. එමනිසා විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා අපි ඔක්කොම එක හා සමානව සලකන්න ඕන. සභාවේ ලැබෙන දේවල් අපිට හැම විදියටම ලැබෙන්න ඕන. නැතිනම් අපේ අදහස් විතරක් අවශ්‍ය නැහැනේ මෙය කරගෙන යන්න. එමනිසා සාධාරණව ඒ ටික ලබා දෙන්න. සභාවේ දීපු පොත්පත්වල වාර්තාවක් වත් මා නම් දැක්කේ නැහැ. ඉදිරිපත් කළාද සභාවට එම වාර්තා ටික. ඒ කියන්නේ මේවා විනිවිදභාවයෙන් කෙරෙන්න ඕන. අපි සභාවේ ලක්ෂ 50ක් විතර යටකරන්නේ වැදගත් දෙයකට. අපි හැම කෙනෙක්ම කැමතියි දරුවන්ගේ අනාගතය උදෙසා විශේෂයෙන්ම අපි ආශිර්වාද කරනවා ඔබතුමාට. ඔබතුමා මෙය දිගටම කරගෙන යනවා. මා හිතන්නේ එක අවුරුද්දක් මෙය දුන්නේ නැහැ මොකක් හරි ප්‍රශ්නයක් නිසා. මා පැමිණි වසරේ නම් දිගටම දිගන ගියා. එමනිසා මේ ලක්ස 50ක් වගේ මුදලක් වැය කරන්නේ වැදගත් දෙයකට. මෙය සාධාරණව හැම මන්ත්‍රීවරියකටම මන්ත්‍රීවරයෙකුටම යම්කිසි සේවයක් කරනවා යන හැඟීමෙන් මොකද මෙය කල කිරිලා කළොත් එම ආශිර්වාදය ඔබතුමාට ලැබෙන්නේ නැහැ. අපි කවුරුහරි මන්ත්‍රී කෙනෙක් පොඩ්ඩක් හරි දුක්වුණොත් බලන්න අපේ සභාපතිතුමා මෙහෙම කළා . සභා ාවෙන් මෙහෙමෙ කළා කිව්වොත් එම ආශිර්වාදය ලැබෙන්නේ නැහැ. අපි හැමගේම ආශිර්වාදය මැද මෙය දෙන්න. හැමටම සාධාරණයක් කරන්න කියා ඉල්ලා සිටිනවා. ඉතාමත් වැදගත් දෙයක්. ඔබතුමාට සුභාෂිංසන කරන එක කළ යුතුම දෙයක්. මෙය ළමයින්ගේ දෙයක් කළ යුතුම දෙයක්. විශේෂයෙන් ආර්ථික අපහසුතා මැදට ජනතාව පත් වෙච්ච මේ මොහොතේ. මෙය මේ වසරේ ඉතාමත්ම වැදගත් දෙයක්. මෙය ලබා දෙන්න. සාධාරන විදියට විනිවිදභාවයෙන් කරන්න කියා ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභි පාසැල් ළමුන් සඳහා අභ්‍යාස පොත් ලබා දීමේ යෝජනාව සම්බන්ධව. මා හිතන්නේ අපි මෙය කලින් සිටම ක්‍රියාත්මක කළා. එම වැඩසටහන් ක්‍රියාත්මක කිරිමේදි දැන් මන්ත්‍රීවරුන් මන්ත්‍රීවරියන් කියන ආකාරයට යම්කිසි ප්‍රශ්න ගැටළු තිබුණා. ඒ සම්බන්ධව අවධානය යොමු කරන්න ඕන. ඒ වගේම ඔබතුමාට කියනවා ගියවර පොත් බෙදා දිමේ වාර්තාවක් මේ සභාවට ඉදිරිපත් වුණේ නැහැ. ඒවා ඉදිරිපත් වෙන්න ඕන.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ප්‍රජා සංවර්ධන නිලධාරි ඉන්නවාද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මා කිහිප පාරක් එය කිවුවා. එතුමියට

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහි වාර්තාවක් ඉදිරිපත් කළේ නැද්ද? ඉදිරිපත් කරන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මොකද ගියවර වෙච්ච දේ මෙවර වෙන්න බැහැ එකක් . ඔබතුමාගේ සංකල්පය හොඳයි . මේ කොරෝනා දිනවල දෙමාපියන් මහත් අසිරුතාවයකට පත් වී ඇති කාලවකවානුවක්. එක ලබා දිම ගැන කිසිම ගැටළුවක් නැහැ. හැබැයි මේ කියන්න වගේ විනිවිදභාවයෙන් කරන්න ඕන. කලින් අයදුම්පත් බෙදිමේදි අපේ මන්ත්‍රිවරුත් එක්ක පොඩි පොඩි ගැටළු තිබෙනවා. පිටපත් වැඩියෙන් වෙලා තිබෙනවා. ඒ අනුව වැඩ කටයුතු සිදු කරන්නේ නැතුව මොකද අපේ ප්‍රදේශයේ ළමුන් සඳහා එය දෙන්න ඕන. විනිවිදභාවය අනුව කටයුතු කරන්න. අනිත් එක තමයි අපේ නිලධාරින්ටත් එය ලබා දෙන්න. නගර සභාවේ සේවය කරන අයටත් එම පොත් ලබා දීම සිදු කරන්න. අපි එය ඉල්ලා සිටිනවා. ඒ වගේම මේ නිසිලෙස මේ පොත් බෙදාදිම සිදු කරන්න. අපි මේ බෙදන්නේ මහජන මුදල්. අපේ නිවෙස්වලින් ගෙනත් නෙමේ දෙන්නෙ. එමනිසා හරියට ලිපිලේඛන බලන්න පවත්වා ගෙන යන්න කියන ඉල්ලිම කරනවා. මොනවා හරි ප්‍රශ්නයක් ඇති වුණාම ටක්ගාලා ඉදිරිපත් කරන්න පුළුවන් ආකාරයට. එමනිසා ඔබතුමාගේ යෝජනාවට අපි සහායෝගය ලබා දෙනවා. ඒ ආකාරයෙන් කටයුතු කරන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ඇත්තටම අපි හැම වසරක් පාසාම මේ පාසැල් යන ළමුන්ට නොමිලේ පොත් ලබා දෙනවා. ඒ වගේම තමයි පෙර පාසැල් යන හැම ළමයෙක් සඳහාම පොත් ලබා දෙනවා. ගරු සභාපතිතුමනි, හැම මන්ත්‍රි කෙනෙකුටම ලබා දුන්නොත් එක හා සාමාන ප්‍රමාණයක් අපේ ගමට ඉන්නේ මන්ත්‍රිවරු මා විතරයි. කළුවඩුමුල්ලට ඉන්නවා මන්ත්‍රිවරු හතරදෙනෙකු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රිතුමා මාගේ අයදුම්පත් ටිකක් දෙන්නම්. ප්‍රශ්නයක් නැහැ. අපි ජනතා විමුක්ති පෙරමුනේ අයනේ. ඔත්කොම දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ස්තූතියි ගරු මන්ත්‍රීතුමා. එම ප්‍රකාශයට. එහෙම ලබා දෙනවා නම් ග්‍රාමසේවා වසමකට එක සාමන අයදුම්පත් ප්‍රමාණයක් ලබා දෙන්න. ඕකන්දටත් මන්ත්‍රීවරු දෙතුන් දෙනෙක් ඉන්නවා. හැම කොට්ඨාශයකටම එක හා සමාන ලබා දේනන කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත්තටම දැන් හැමෝම කතා කරනවා. අපි මෙය දිගින් දිගටම කරගෙන ආවා. මා හිතන්නේ මෙය බෙදන්න බැරි වුණේ නැහැ. නිලානි මන්ත්‍රතුමිය කිවූ ආකාරයට ඡන්දයකට මෙය දුන්නේ නැහැ. ඒක බොරුවට කියපු කතාවක්. එතුමිය තටට එන දේ ඕහේ කියාගෙන කියාගෙන යනවා. මේ ළමුන්ට මේ වරප්‍රසාදය ලැබුණේ නැත්තේ 2015 වසරේ හා 2018 වසරේ පමණයි. ක්‍රිඩාංගණය හදන නිසා  එක අවුරුද්දක් දුන්නේ නැහැ. දිගටම කරගෙන ආපු වැඩ පිළිවළක්. මෙය දේශපාලනය බදාගෙන අපේ අතුල මන්ත්‍රීතුමා කිවූ පරිදි අපි එහෙම කළේ නැහැ. කාටත් පක්ෂ භේදයකින් තොරව ලබා දුන්නා. එමනිසා මා විශේෂයෙන්ම කියන්න ගියේ එය මන්ත්‍රීවරුන්ට දෙන ප්‍රමාණයක් නෙමේ කොට්ඨාශයකට යම්කිසි ප්‍රමාණයක් ලබා දෙන්න. මොකද කොට්ඨාශ වල එක එක ළමයින් සීමාවත් ඉන්නේ .  තලගස්ගොඩ ගත්තොත් එහෙම මා ඇත්තටම අයදුම්පත් 300ක් බෙදුවා. සභාපතිතුමාගෙන් මා ඉල්ලාගෙන ගියා.  මට 300 බෙදලාත් බැරි වුණා. මා ඊට පස්සේ රාහුල මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා ගත්තා. සරත් ශ්‍රී ලාල් මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා ගත්තා . ජගත් කුමාර මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා ගත්තා. අපේ නන්දන රාජපක්ෂ මන්ත්‍රීතුමාගෙනුත් ඉල්ලාගෙන තමයි ඔබතුමා දීපුවාට අමතරව මා තව බෙදුවේ. ඔබතුමාගෙනුත් මා ඉල්ලාගෙන ගියා. ඉතුරු වූ ටික. එහෙම අසාධාරණයක් වුණේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අයදුම්පත් ග්‍රාම නිලධාරි මහතුන්ට දෙමුද ?.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,  මේ කොට්ඨාශවල සිටින ළමයින් ප්‍රමාණයේ වාර්තාවක් ලබා ගන්න. ඒ අනුව කොට්ඨාශ මට්ටමින් කොට්ඨාශයට ලබා දිය යුතු අයදුම්පත් ප්‍රමාණය ලබා දුන්නොත් හොඳයි කියන මතයේ මා සිටිනවා. පසුගිය කාලයේත් හැම ළමයෙකුටම ලබා දුන්නා. මේ පාර ඊට වඩා දෙමාපියන් ආර්ථික අපහසුතාවයෙන් ඉන්නේ. කොරෝනා ව්‍යාප්තිය නිසා. මෙය ක්‍රියාත්මක කළ යුතු හොඳ වැඩසටහනක්. එමනිසා එය කොට්ඨාශ මට්ටමින් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි. මා නිතරම වෙනස් මතයක්නේ ඉදිරිපත් කරන්නේ. කමක් නැහැ. මා කියන්නම් මාගේ හැඟීම. දැන් අපි මේ අභ්‍යාස පොත් බෙදා දෙනවා ළමයින්ට. මෙහි සම්පූර්ණ වටිනාකම රුපියල් 2000/=ක් රු.3000/= ක් වේ. මා මේ කරන කටයුත්ත හැල්ලු කරනවා නෙමේ. එතකොට මාගේ අදහස් මාගේ දැක්ම මා මේ කියන්නේ. අපි නිදහස ලබලා අවුරුදු 70ක් වෙනවා. 70 ක් වෙලාත් සංවර්ධනය කරලා කරලා අද මේ වනකොට අපි ගමේ ජනතාවට අභ්‍යාස පොත් ටිකක් දෙනවා රු.2000/= ක රු.3000/= ක. අපිට ලැජ්ජා නැද්ද? අපිට ලැජ්ජාවක් කියා එකක්

නැද්ද? මාගේ අවංක හැඟිම එකයි. අපි ඉන්න ඕන මෙතැන නෙමෙයි. අපි මේ වනකොට ගෙදරින් ගෙනත් නගර සභාවට දෙන්න පුළුවන් තත්ත්වයේ ඉන්න ඕනේ. අපි එතැන නැහැ. කනගාටුයි කියන්න. මාගේ අදහස මතය වෙනස්ම තමයි. නමුත් මා මේ කියන කතාව ඇත්ත. අපි ඉන්න ඕන මෙතැන නෙමෙයි. කනගාටුදායකයි.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අර උප සභාපතිතුමා කිවුවා කොට්ඨාශයකට එහෙම තීරණය කර දෙන්න කියා. මට ගැටළුවක් තිබෙනවා එකේ. ප්‍රායෝගික ගැටළුවක්. මාගේ කිසිම මත ගැටුමක් නැහැ මේ සම්බන්ධව මන්ත්‍රිවරු එක්ක. කළුවඩුමුල්ලට ඉන්නවා මන්ත්‍රිවරු 4කු. එතකොට කොට්ඨාශයකට තීරණය කරලා එහෙම බෙදලා දුන්නොතින් . අපි 100 නම් මන්ත්‍රිවරයෙකුට 25ක් දෙනවා. එතකොට මා ඡන්දය දිනපු මිනිහා වැඩිම ඡන්ද ගණනක් අරගෙනත් 25 තමයි බෙදන්න ඕනේ. එතකොට අරගොල්ලත් 25යි. එක සාධාරණ ද? එක හරි ක්‍රමයටකට යන්න ඔනේ. මා කියන්නේ එහෙම යන්න බැහැනේ. මෙතැන 4ක් ඉඳලා මෙය සම සමව බෙදා දිම සාධාරණද ? මා කියන්නේ මම නෙමේ. මෙතුමා දිනුවත් ඔයාටත් සාධාරණයක් නැහැනේ එතකොට. එමනිසා එය හරි ක්‍රමයකට බෙදන්න තීරණය කරන්න කමිටුවක් දමා හරි හරි ක්‍රමය ලැහැස්ති කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි.ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

කිසි ප්‍රශ්නයක් නැහැ. ග්‍රාම නිලධාරි මහතුන්ට යවන්න. මටනම් එවන්නත් එපා.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදර ධර්මදාස මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම ඔබතුමාගේ යෝජනාව ඉතාමත් හොඳයි.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මා තිලකපුරට බෙදුවා කිවුවොත් මා ඉල්ලා අස්වෙනවා. මේ සභාවේ බොරු කියන්න එපා.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදර ධර්මදාස මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ පොත් බෙදා දිමේදි දරුවන්ගේ ලොකු බලාපොරෝත්තුවක් තිබෙනවා. ගිය පළාත් පාලන මැතිවරණයේදි එම ඡන්ද ප්‍රතිඵල ලැබෙන කොටම අපේ කන්දෙකට ඇහුණ දෙයක් තමයි අරුණ ප්‍රදිප් මහතා නාගාරාධිපති වුණා කියා ගමේ ප්‍රචාරය වෙනකොට එක ළමයෙක් කියපු කතාවක් තමයි අපිට එහෙනම් පොත් ගන්න පුළුවන් කියා. ඒ කියන්නේ ඔබතුමා පොත් දිමේ ලොකු ප්‍රසිද්ධියක් තිබෙනවා. අන්න එකයි මේ පොත් දිමේ ලොකු ගැටළුකාරි තත්ත්වයකට පත්වෙනවා. අපේ ශ්‍රේෂන් මන්ත්‍රිතුමා කිවු ආකාරයට පසුගිය දිනවල කොරෝනා ව්‍යාසනයේදි රු.5000/= දීමනාව දිමේදි අපේ ග්‍රාම නිලධාරිතුමිය සමඟ අපිට පැටලෙන්න සිද්ධවෙලා අද එතුමිය මාරු කර තිබෙනවා. අපිට ග්‍රාම නිලධාරි කෙනෙක් තවම නැහැ. එමනිසා ඒ තත්ත්වයට යන්න නොදි මේන්න මේ කටයුක්ත එතුමන්ලාගේන් නිදහස් කර ලබා දෙන ලෙස මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි.ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මාත් පොඩ්ඩක් කතා කරන්න ඕනේ. 2011 සිට මාත් ඔබතුමන්ලාත් එක්ක ඉන්නවා මේ සභාවේ. අපි එහෙම ඡන්දයක් බලාගෙන මෙය දුන්නා නෙමේ. පොදු අරමුණක් තකා අපේ අම්බලන්ගොඩ නගරයේ සිටින ළමුන් වෙනුවෙන් තමයි මෙය සිදු කළේ. දූප්පත් ළමයි පෝසත් ළමයි කියා තෝරන්න බැහැ. නමුත් මොටර් රථ වලින් පැමිණත් පොත් අරගෙන යනවා අපි දැක තිබෙනවා. ඇත්තටම එය ඒ අයගේ තිබෙන අඩුවක්. තිබෙන දූර්වලතාවයක්. තමන්ට ආර්ථිකය ශක්තිමත්ව තියෙද්දි නගර සභාවෙන් ඕක දෙනවා කියන්නේ හිතට එකඟව නෙමේ. එතනදි දකින්නේ. මටනම් ඔය අයදුම්පත් ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා එය ග්‍රාම නිලධාරි මහතාට එව්වාට කමක් නැහැ. මට නොදුන්නත් කමක් නැහැ. නිලානි මන්ත්‍රිතුමියට දෙන්න. මිනිසුන් මා ගැන දන්නවා. මා මං කවුද කියා දන්නවා. එමනිසා මට අයදුම්පත ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි නොදෙන කාලයේ මා පොත් කට්ටල 25ක් 20ක් විතර අතින් අරගෙන දුන්නා. මට ඒවා නම් වශයෙන් කියන්නේ නැහැ. ඔබතුමා මට නොදුන්නා කියා මාගේ කිසිම තරහක් නැහැ. ගමේ ජනතාවට පොත් ටිකයි ලැබෙන්න ඕනේ. කමක් නැහැ ග්‍රාම නිලධාරි මහතාට හරි අයදුම්පත එවන්න. කිසි තරහක් නැහැ. ඔබතුමා මේ කරන සතකාරයට සුබ පතනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව සියළුම මන්ත්‍රිවරු ලබා දුන් සහාය පිළිබඳව මා විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. මෙම ක්‍රමවේදය අපි ආරම්භ කළේ. අපිට දැනුනා තමන්ට වියදම් කරන්න තිබෙන ප්‍රමාණය සමහර වේලාවට කැමට බිමට ගියාම ළමයින් වෙනුවෙන් වියදම් කරන්න නැතිවෙන නිසා අපි එම ළමයින් ගැන හිතලා ළමයින් අපේ අනාගත ආයෝජනයක් කියා සිතා අපි මේ අභ්‍යාස පොත් සඳහා වියදම් කිරිම දිර්ඝ කාලයක් කළේ. ඇත්ත වශයෙන්ම ඉන් අප සතුටක් ලැබුවා. මටත් සිටිනවා වැඩිහිටි වූ ළමයින්. අපි මෙය ආරම්භ කළේ 1998 විතර. 1998 සිට අදවෙනතුරු තිබෙනවා. ඒ කෙටි කාලයක් තුළ එක්සත් ජාතික පක්ෂය බලයේ සිටින කාලයේත් ඒ වගේම නිලධාරින් පාලනය කළ කාලයේත් ළමයින්ට මේ පොත් ලබා දිම කෙරුණේ නැහැ. නමුත් අපි මෙය ලබා දිම වැදගත් වෙනවා. මොකද මම දෙමාපියෙක් වශයෙන් මටත් ළමයින් තිදෙනෙකු ඉන්නවා. ඒ ළමයින් තුන්දෙනා සිටින කාලයේ සමහර වේලාවට මටත් ගැටළුවක් වෙලා තිබෙනවා. ඒ දිනවල ළමයින් තිදෙනාට පොත් අරගෙන දෙනවිට රු.10000/= ක් විතර ගියා. දැන් බැලුවාම රු.20000/= වගේ මුදලක් යනවා ඇති. එවැනි උදව්වක් අපි කරන්නේ. මේ පොත් බෙදාදිම සම්බන්ධයෙන් මට අසාධාරණයක් සිදු නෙවෙන්න ලබා දෙන්න පුළුවන්. අපි ඒ දිනවල අපි උපදෙස් ගත්තේ අපේ රාහුල මන්ත්‍රිතුමා, නිලානි මන්ත්‍රිතුමිය . ඒ අය තමයි කිවුවේ මේ පොත් විදිය. ඒ කියපු විදියටම කරලා දෙන්නම් කියන එක මා කියන්න ඕන. බොහොම ස්තුතියි. මේ සම්බන්ධව විරුද්ධ මන්ත්‍රිවරු සිටිනවා ද කවුරු හරි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි. දෙනකොට එක තැනකට ගෙනත් දෙන්න. නගර සභාවේ භාගයයි. විහාරස්ථානයේ භාගයයි. එතකොට මිනිසුන් අපහසුතාවයට පත්වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමා අපි වෙනදා එක තැන තමයි මෙය කළේ. අපි එකතැන කරනකොට ලොකු උත්සවයකට ලොකු වියදමක් දරන්න ඕනේ. අපි වියදමකින් තොරව තමයි විහාරස්ථාන වලට ගිහින් කරන්න ගත්තේ. ඔබතුමා යෝජනා කරනවා නම් කරන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

එක නෙමේ කියන්නේ. අපි ගියපාර පොත් භාගයක් දුන්නාම ඇවිත් නැතුව පොත් භාගයක් නගර සභාවේ දුන්නානේ. මේ පාර එහෙම කරන්නේ නැතුව ලැයිස්තුව හදලා ඉවර වෙලා උත්සවය පවත්වන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි.ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි. සමහර මිනිසුන් පොත් දෙනකොට මේ ලැජ්ජාවේ ගමේ විහාරස්ථානයට එන්නේ නැහැ. හැංගි හැංගි ඉන්නවා. ඊට පස්සේ ඇවිත් නගර සභාවෙන් ගන්නවා. ඒ තත්ත්වයේ අයට පොත් දෙන්න එපා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එක අපි කරන්නම්.

**තීරණය -**

2021 වර්ෂය සඳහා අම්බලන්ගොඩ බල ප්‍රදේශය තුළ සිටින අඩු ආදායම්ලාභී පාසැල් යන වයසේ දරුවන්, දහම් පාසැල් දරුවන් හා පිරිවෙන්ගත ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් නොමිලේ අභ්‍යාස පොත් ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.03 නගර සභා කාර්යාල ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ වහලේ සිවිලිම අලුතින් ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නගර සභා කාර්යාල ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ වහලේ සිවිලිම අලුතින් ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

නගර සභා කාර්යාල ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ වහලේ සිවිලිම අලුතින් ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය

**05.01.04 නගර සභා කාර්යාල ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ වහල නවීන තාක්ෂණය අනුව ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නගර සභා කාර්යාල ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ වහල නවීන තාක්ෂණය අනුව ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ වහල ගහන්න තිබේද්දි ඇයි මේ තින්ත ආලේප කිරිම් කරන්නේ. පොටි ඇඳලා. දැන් ඕක ගලවපු ගමන් පොටි ටික ගැලවෙනවා. පරණ මේවා එක්ක වැස්සට.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ මේ වහල සඳහා උළු වෙනුවට ෂීට් දමා වහන්න ඕන. උළු බිදෙනවා බෝල වලට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් මෙහි බිත්ති වහලා හරි කරන්න කියන්න. අර පරණ මේවා එකට තමයි ප්ලාස්ටර් කර තිබෙන්නේ. වතුර වැටුන ගමන් කඩාගෙන වැටෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ අලුතින් ගසා තිබෙන්නෙ ප්ලාස්ටර්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මොකද නැත්තේ. අර පරණ ගඩොල් වලටමනේ ගහන්නේ ප්ලාස්ටර් එක.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සිමේන්ති ගැහුවා.

**තීරණය -**

නගර සභා කාර්යාල ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ වහල නවීන තාක්ෂණය අනුව ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.05 පැරණි පටබැඳිමුල්ල ආයුර්වේද ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පැරණි පටබැඳිමුල්ල ආයුර්වේද ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.ජී.ආර්. පේෂලා කුමාරි මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

පැරණි පටබැඳිමුල්ල ආයුර්වේද ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ජී.ජී.ආර්.පේෂලා කුමාරි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.06 මෝනක මහතාගේ නිවස අසල අසල පාර අග කොටස කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෝනක මහතාගේ නිවස අසල අසල පාර අග කොටස කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

මෝනක මහතාගේ නිවස අසල අසල පාර අග කොටස කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.07 කුලරත්න පාර අසල මාර්ගය ගල් අතුරා සංවර්ධනය කිරීම (අදියර 01) සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

**කුලරත්න පාර අසල මාර්ගය ගල් අතුරා සංවර්ධනය කිරීම (අදියර 01) සුදුසු බවට යෝජනා කරනවා.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

කුලරත්න පාර අසල මාර්ගය ගල් අතුරා සංවර්ධනය කිරීම (අදියර 01) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.08 තල්ගස්ගොඩ අශෝක උයන පාර ඇතුල් වන මාර්ගයේ හරස් කාණුව ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

තල්ගස්ගොඩ අශෝක උයන පාර ඇතුල් වන මාර්ගයේ හරස් කාණුව ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

තල්ගස්ගොඩ අශෝක උයන පාර ඇතුල් වන මාර්ගයේ හරස් කාණුව ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඒ.පී.ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.09 නගර සභා පැරණි බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය අසල පොළොව කොටසක් කොන්ක්‍රීට් යොදා සැකසීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නගර සභා පැරණි බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය අසල පොළොව කොටසක් කොන්ක්‍රීට් යොදා සැකසීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී . ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙතැන ඉන්ටර්ලොග් ඇල්ලුවානම් හරි. කොන්ක්‍රිට් කළාම පෙද කැවාම ලිස්සනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙතැන පොඩි ඉඩක් තිබෙන්නේ. උපරිම ළමුන් හතර දෙනෙක්නේ සෙල්ලම් කරන්න පුළුවන්. එතකොට ව්‍යායම කරන්න පුළුවන් සුළු විදියට හදා දෙන්න කියන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී . ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇතුළේද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එළියේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී . ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

එතනට ඉන්ටර්ලොග් ටිකක් සවි කර දෙන්න. ඊට වැඩයේ හොඳයි. වැඩේත් පිළිවලයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙතැන රු.20000/= ක රු.30000/= ක වියදමක් තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී . ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

එච්චර යන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

බලමු අඩුනම් කර දෙන්නම්.

**තීරණය -**

නගර සභා පැරණි බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය අසල පොළොව කොටසක් කොන්ක්‍රීට් යොදා සැකසීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.10 සංසරාජ පාර කාණුව සංවර්ධනය කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සංසරාජ පාර කාණුව සංවර්ධනය කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

සංසරාජ පාර කාණුව සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.11 දෙවට පළමු හරස් පාර කාණුව ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සංසරාජ පාර කාණුව සංවර්ධනය කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

දෙවට පළමු හරස් පාර කාණුව ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.12 සිරිනිකේතාරාම පාර කාණුව ඉදිකිරීම (RHS) සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සිරිනිකේතාරාම පාර කාණුව ඉදිකිරීම (RHS) සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

සිරිනිකේතාරාම පාර කාණුව ඉදිකිරීම (RHS) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.13 පල්ලෙතොට පාර කාණු පද්ධතිය ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පල්ලෙතොට පාර කාණු පද්ධතිය ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

පල්ලෙතොට පාර කාණු පද්ධතිය ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.14 වරාය භූමිය තුළ අභ්‍යන්තර කාණු පද්ධතිය ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වරාය භූමිය තුළ අභ්‍යන්තර කාණු පද්ධතිය ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

වරාය භූමිය තුළ අභ්‍යන්තර කාණු පද්ධතිය ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.15 කරිත්තකන්ද සුනිල් මහතාගේ නිවස අසල ඇති කාණුවට කොන්ක්‍රීට් ස්ලැබ් යෙදීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කරිත්තකන්ද සුනිල් මහතාගේ නිවස අසල ඇති කාණුවට කොන්ක්‍රීට් ස්ලැබ් යෙදීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

කරිත්තකන්ද සුනිල් මහතාගේ නිවස අසල ඇති කාණුවට කොන්ක්‍රීට් ස්ලැබ් යෙදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.16 මහජන ක්‍රීඩාංගනයේ ලංකා බැංකුව අසළ නැරඹුම් වේදිකාවට සකසන වහලය සඳහා කොන්ක්‍රීට් කාණු ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මහජන ක්‍රීඩාංගනයේ ලංකා බැංකුව අසළ නැරඹුම් වේදිකාවට සකසන වහලය සඳහා කොන්ක්‍රීට් කාණු ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

මහජන ක්‍රීඩාංගනයේ ලංකා බැංකුව අසළ නැරඹුම් වේදිකාවට සකසන වහලය සඳහා කොන්ක්‍රීට් කාණු ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු

නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.17 නිව්යෝර්ක් ගම්මානය පහළ මාර්ගයේ කාණු කොටසක් ඉදිකිරීම(සංශෝධිත) සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නිව්යෝර්ක් ගම්මානය පහළ මාර්ගයේ කාණු කොටසක් ඉදිකිරීම(සංශෝධිත) සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

නිව්යෝර්ක් ගම්මානය පහළ මාර්ගයේ කාණු කොටසක් ඉදිකිරීම(සංශෝධිත) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.18 ඇට්ලස් පාර හරස් කාණුව ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඇට්ලස් පාර හරස් කාණුව ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

ඇට්ලස් පාර හරස් කාණුව ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.19 අම්බලන්ගොඩ නගර සීමාවේ සේවා නියුක්ත කාන්තාවන් සඳහා සුව නාරි සායනයක් පැවැත්වීමට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සීමාවේ සේවා නියුක්ත කාන්තාවන් සඳහා සුව නාරි සායනයක් පැවැත්වීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අයිරාංගනී මන්ත්‍රීතුමිය විස්තර කරන්න. සියළුම මන්ත්‍රීවරියන්ගෙන් යුක්ත කාන්තා කමිටුවක් අපි කැඳෙව්වා. ඒ කාන්තා කමිටුවේ තින්දුව පරිදි තමයි බොහෝ දුරට කතා කළේ. මන්ත්‍රීතුමිය විස්තර කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මෙහෙමයි. නිලානි මන්ත්‍රීතුමියට ඒ කමිටුවට සහභාගි වෙන්න බැරි වෙන්නැති. සුවනාරි සේවාව ලබා දිය යුතු බවට එකා තිරණය කළා. කාන්තාවන්ට තේරුම් කර දුන්නා. එක එක ලෙඩරෝග එනවා. මේ සම්බන්ධව මහජන සෞඛ්‍ය කාර්යාලයත් එක්ක එකතු වෙලා සුවනාරි ක්‍රමයක් ඇතිකිරිම සුදුසු බව. සේවා නියුක්ති කාන්තාවන් සඳහා.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සීමාවේ සේවා නියුක්ත කාන්තාවන් සඳහා සුව නාරි සායනයක් පැවැත්වීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.20 අම්බලන්ගොඩ නගර සභාව මගින් කාන්තා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභාව මගින් කාන්තා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභාව මගින් කාන්තා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.02 ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව**

**05.02.01 අම්බලන්ගොඩ නගර සභාවට අයත් තල්ගස්ගොඩ ක්‍රීඩාංගනයට යාබද උතුරු දිශාවෙන් පිහිටි යාබද ඉඩම ක්‍රීඩාපිටිය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ පවරා ගැනීම සුදුසු යැයි කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ නගර සභාවට අයත් තල්ගස්ගොඩ ක්‍රීඩාංගනයට යාබද උතුරු දිශාවෙන් පිහිටි යාබද ඉඩම ක්‍රීඩාපිටිය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ පවරා ගැනීම සුදුසු බවට යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, තල්ගස්ගොඩ ක්‍රිඩාංගණයේ දැනට අපි සකස් කර තිබෙනවා මිටර් 1 ½ ක් මිටර් 140 පමණ දිග තිබෙනවා. දැනට අප සතුව තිබෙන පළල 90 ක් 93 වගේ තියෙන්නේ. ගරු සභාපතිතුමාත් සහභාගි වෙලා අදාල නිලධාරිනුත් සභාපතිතුමා විසින් ගෙන්වා පරික්ෂා කිරිමේදි හැගි ගියා මේ ක්‍රිඩාංගණය මිටර් 400 ධාවන පථ හිටගෙන ගහන්න පුළුවන් තත්ත්වයක පවතින ක්‍රිඩාංගණයක් නිසා යාබද ඉඩම් කොටස නගර සභාවට පවරා ගන්න කියා. එමනිසා තමයි මේ යෝජනාව සභාවට ඉදිරිපත් කළේ. ඇත්තටම අද අම්බලන්ගොඩ නගරයේ මිටර් 400 ධාවන පථ තිබෙන්නේ බද්දේගම මැතකදි එකක් හැදුවා. ඊට අමතරව මා හිතන්නේ තිබෙන්නේ මාතර. එමනිසා පාසැල් වලිනුත් දිර්ඝ කාලයක සිට ඉල්ලිමක් කරනවා. මෙම ධාවන පථයක් ළමයින්ට අවශ්‍ය නිසා හදන්න කියා. එය අපිට හදන්න නම් ක්‍රිඩාංගණයේ ඕන තරම් දිග තිබෙනවා. 135 ක විතර දිග තිබෙනවා. හැබැයි පළල තිබෙන්නේ 95

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ පුදිප් මහතා කතා කරමින්</u>

ඔබතුමාගේ යෝජනාවේ පොඩි සංශෝධනයක් සමඟ ඉදිරිපත් කළා. උතුරු දිශාවෙන් පිහිටි යාබද ඉඩම ක්‍රීඩාපිටිය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ පවරා ගත යුතු යයි යෝජනා කරනවා. ඒ විදියට ඇතුල් කරන්න.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

එමනිසා මෙම ක්‍රිඩාංගණයට යාබද ඉඩම් කොටස ඉඩම් අත්පත් කර ගැනිමේ පණතට අනුව ක්‍රිඩාංගණය පුළුල් කර නගරයේ පාසැල් 4ක් තිබෙන නිසා එය සංවර්ධනය කරන ලෙස සභාවට යෝජනා කරනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභාවට අයත් තල්ගස්ගොඩ ක්‍රීඩාංගනයට යාබද උතුරු දිශාවෙන් පිහිටි යාබද ඉඩම ක්‍රීඩාපිටිය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ පවරා ගැනීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

05.03 ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව

**05.03.01** **මී ගස පරිසරය සුපිරිසිඳු කිරීමට දිවා රාත්‍රී දෙකෙහිම ඔක්සිජන් සපයන , පොහොර සපයන, ඖෂධ සපයන, ආහාර සපයන, ඉන්ධන සපයන, සෙවණ සපයන මේ වෘක්ෂය අප බල ප්‍රදේශයේ සුදුසු හිතකර ස්ථාන 83 ක ගස් 83 ක් නගර සභාවේ ආයු කාලය සංකේතවත් කරවමින් සිටුවීම සුදුසු යැයි කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

__ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්__

මී ගස පරිසරය සුපිරිසිඳු කිරීමට දිවා රාත්‍රී දෙකෙහිම ඔක්සිජන් සපයන , පොහොර සපයන, ඖෂධ සපයන, ආහාර සපයන, ඉන්ධන සපයන, සෙවණ සපයන මේ වෘක්ෂය අප බල ප්‍රදේශයේ සුදුසු හිතකර ස්ථාන 83 ක ගස් 83 ක් නගර සභාවේ ආයු කාලය සංකේතවත් කරවමින් සිටුවීම සුදුසු යැයි යෝජනා කරනවා.

__ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්__

එම යෝජනාව ස්ථිර කරනවා.

__ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්__

මී ගස පරිසරය සුපිරිසිඳු කිරීමට දිවා රාත්‍රී දෙකෙහිම ඔක්සිජන් සපයන , පොහොර සපයන, ඖෂධ සපයන, ආහාර සපයන, ඉන්ධන සපයන, සෙවණ සපයන මේ වෘක්ෂයක් තමයි අපි මේ හඳුන්වා දෙන්නේ. මී ගස් 7ක් තිබෙනවා කියා වාර්තා වෙනවා. ඉන් 4ක් ලංකාවට අවේණිකයි. දේශිය ආයුර්වේදයේ වේදනා නාශකයක් හැටියට පිළි ගන්නා මේ ඔසුවක් ඒ වවුලන් පළතුරු කෑම මඟින් ඒ වවුල් වසුරු පොහොරක් හැටියට එදා කාලයේ භාවිතා කර තිබෙනවා. මේ ගසෙන් රසායනික ද්‍රව්‍ය උරා ගැනිමේ හැකියාවක් මේ වෘක්ෂයට තිබෙනවා. අපේ පහන් පන්දම් පත්තු කළේ රජ කාලේ මේ මී තෙල් වලින්. කෑමට පොල්තෙල් වෙනුවට භාවිතා කර තිබෙනවා.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

මන්ත්‍රිතුමා කිසි ගැටළුවක් නැහැ . යෝජනාවට එකඟයි.

**තීරණය -**

මී ගස පරිසරය සුපිරිසිඳු කිරීමට දිවා රාත්‍රී දෙකෙහිම ඔක්සිජන් සපයන , පොහොර සපයන, ඖෂධ සපයන, ආහාර සපයන, ඉන්ධන සපයන, සෙවණ සපයන මේ වෘක්ෂය අප බල ප්‍රදේශයේ සුදුසු හිතකර ස්ථාන 83 ක ගස් 83 ක් නගර සභාවේ ආයු කාලය සංකේතවත් කරවමින් සිටුවීම

සුදුසු යැයි ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06** කාරක සභා වාර්තා

**06.01 2020.09.21 දින පැවති මූල්‍ය කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.08 .20 දින පැවති මුල්‍ය කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2020.09.21 දින පැවති මුල්‍යා කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

**06.02 2020.09.15 දින පැවති පුස්තකාල කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.09.15 දින පැවති පුස්තකාල කමිටුවේ කමිටු කමිටු වාර්තාව යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා. මවුබිම පුවත්පත පුස්තකාලයට වැටි නැහැ. එය පොඩ්ඩක් ලබා ගන්න කියනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරන්න. මෙහි නැහැ එය

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2020.09.15 දින පැවති පුස්තකාල කමිටුවේ කමිටු කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කළ අතර පුස්තකාලයට මවුබිම පුවත්පත ගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කළ යෝජනාව ස්ථිර කරන ලෙස ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර එම යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.03 2020.09.23 දින පැවති ටෙන්ඩර් කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.09.23 දින පැවති ටෙන්ඩර් කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2020.09.23 දින පැවති ටෙන්ඩර් කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.04 2020.09.22 දින පැවති කළමනාකරණ කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.09.22 දින පැවති කළමනාකරණ කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2020.09.22 දින පැවති කළමනාකරණ කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.05 2020.09.22 දින පැවති ක්‍රිඩා කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.09.22 දින පැවති ක්‍රිඩා කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2020.09.22 දින පැවති ක්‍රීඩා කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.06 2020.09.28 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුවේ කමිටු වාර්තාව වාර්තාව සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020.09.28 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය**

2020.09.28 දින පැවති පරිසර,සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.07 2020.09.24 දින පැවති කාන්තා කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදි**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020.09.24 දින පැවති කාන්තා කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය**

2020.09.07 දින පැවති ළමා හා කාන්තා ස්ථාවර කාරක සභා කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.08 2020.09.11 දින පැවති රථවාහන හා ත්‍රීරෝද රථ කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020.09.11 දින පැවති රථවාහන හා ත්‍රීරෝද රථ කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි රථවාහන හා ත්‍රීරෝද රථ කමිටුවේ කමිටුවේ සභාපතිත්වය දැරුවේ මා. එම කමිටුවෙන් ඉල්ලා අස්වෙනවා. මා එය සභාවට දැනුම් දෙන්න ඕන . අපි දැන් පත්වෙලා දිර්ග කාලයක් වෙනවා. තව අවුරුදු 1 ½ වගේ කාලයක් තිබෙන්නේ. මේ කාලය තුළ අපි ගත්ත ක්‍රියාමාර්ග කිසිවක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එමනිසා මේ කමිටුවේ සභාපතිත්වය දරා මා සිටිමේ තේරුමක් නැහැ කියන මතයේ මා සිටිනවා. මා අද සිට එම කමිටුවෙන් ඉවත් වෙනවා. මොකද මා පෞද්ගලිකව මේ සභාව වෙනුවෙන් කතා කරන්න ගිහින් මට මිනිසුන් සමඟ ගහගන්න වෙනවා. එහෙම ගහගන්න බැහැ. මට පවුල් ජිවිතයක් තිබෙනවා. ගිය වසරේ 2018 සැප්තැම්බර් 19දා තල්ගස්ගොඩ ක්‍රිඩාගණයේ ඉඩම පුද්ගලයෙක් විසින් නගර සභා ක්‍රිඩාංගණය කපා පාරක් හදාගෙන යාමේදි මා එතැනට මැදිහත් වුණා. මට දුරකථන ඇමතුමක් ලබා දිලා . එවිට මා යනවිට සභාවේ ඉඩම කපා පාරක් හදනවා. එතකොට අඩි 100ක් විතර පාර හදාගෙන ගිහින්. එම අවස්ථාවේදි මා ගරු සභාපතිතුමාට දුරකථනයෙන් කතා කර කිවුවා. ඒ සිද්ධිය වුණාට පසු එතුමා ආවා. ඊට පස්සේ පොලිසියෙන් ආවා. එවකට සිටි ලේකම්තුමිය ගිහින් පැමිණිල්ලක් දැම්මා. නමුත් අද මා උසාවි යනවා. මට පහර දිම සම්බන්ධව. රාජ්‍ය දේපලට වෙච්ච හානියට දැමු පැමිණිල්ලට මොනවා වුණාද දන්නේ නැහැ. එය උසාවියට මේ වෙනකම් නැහැ. එතකොට මේ සභාව විශේෂ සභාවක් තියා තින්දු තීරණ ගත්තා. මෙය රාජ්‍ය දේපලක් එයට අලාභ හානි සිදු කිරිමට ගන්න ක්‍රියා මාර්ග කියා. සභාවේ තින්දුවක් ගත්තා. මන්ත්‍රිවරු ඇවිල්ලා. ඒ සම්බන්ධව විශේෂ සභාවක් පැවැත්වුවා මේ ගරු සභාවේ. එහෙම කරලත් මේ වනකම් කිසිම ක්‍රියාමාර්ගයක් නැහැ. පෞද්ගලිකව මාගේ එකක් වගේ මා උසාවි යනවා ඒ සිද්ධියට. සභාවෙන් කිසිම ක්‍රියාමාර්ගයක් මේ වෙනකම් නැහැ. දේපල හානි කිරිම සම්බන්ධව වත් කිසිම දෙයක් නැහැ. මා යනවා පෞද්ගලිකව මා ගහා ගත්තා වගේ . මේ සභාවේ දෙයකට කතා කරන්න ගිහින්. ගරු සභාපතිතුමා දෙපාරක් තුන්පාරක් කතා කළා. මේ වෙනකම් කිසිම ක්‍රියාමාර්ගයක් නැහැ. ඒ ක්‍රිඩාංගණයේම පස් කපා කුඹුරකට දමා ඇති බව කියා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලේකම්තුමියට ලිපියක් එවා තිබෙනවා. අපිවත් දන්නේ නැහැ. ලේකම්තුමිය වත් දන්නේ නැහැ. හැබැයි මට එහි පිටපත ගෙනවිත් මට දුන්නා. එහෙම සිද්ධියක් ඇතිවෙලාම නැහැ. පිට්ටනියක් කපලවත් නැහැ මේ කාලයේ තල්ගස්ගොඩ . වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලෙකම් ලිපියක් එවා තිබෙනවා ලේකම්තුමියට මේ කුඹුරට දමන ලද පස් අයින් කරන්න කියා. එම පිටපත ඔබතුමියට ගෙනත් දුන්නාද , මෙයට පිළිතුරු අරින්න කියන්න. මොකද අපේ නිලධාරියෙක්වත් යන්නේ නැතුව වාර්තාවක් එතුමා එවලා මෙහේට. අපේ ගොවිජන සේවා එකටත් නගර සභාවටත්. පස්

අයින් කරන්න කියා. මේ වෙනකම් කිසිම ක්‍රියාමාර්ගයක් ගන්නේත් නැහැ. ඊට පස්සේ පසුගිය කාලයේ අර යකඩ බඩු වෙන්දේසියේදි යම්කිසි සිද්ධියක් ඇති වුණා. එතනට මා සභාවට වෙන පාඩුව හින්දා තමයි මා කතා කළේ. එකටත් පස්සේ පොලිසි ගිහින් නිති මාර්ගයෙන් කටයුතු කර තිබෙනවා. එහිදි මා දන්නේ නැහැ . මා හිටියේ නැහැ පොලිසියෙන් එනවිට. ඒ වේලාවේ අපේ නිලධාරින් කිසිම කටයුක්තක්වත් දුන්නේ නැහැලු මට එම පොලිස් නිලධාරි කිවුවා. හැබැයි ඒ සිද්ධය ගැන ඉතාමත් කනගාටුයි. මෙය මා කතා නෙකරන්න හිටයේ. නමුත් කතා කළ යුතුයි. ලක්ෂ ගණනක යකඩ. අපිට එම වාර්තාව දෙනවා කිවුවාට. තවම ආවේ නැහැ මෙතැන. කියක බඩු විකිණිලා තිබෙනවාද ?

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

එක අපි දෙන්නම්.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

කියක බඩු විකිණිලා තිබෙනවාද ? අපේ රාහුල මන්ත්‍රිතුමා එතැන හිටියා. එතුමා මට එතැන ඉන්න කියපු නිසා තමයි මා එහි සිටියේ. නැතිනම් මා ඉන්නේත් නැහැ ඒ වේලාවේ. මට මතක විදියට විනාඩි 20ක්වත් ගියේ නැහැ ඔච්චර ප්‍රමාණයක බඩු වෙන්දේසි කරන්න. මා දැකලා නැහැ ලංකාවේ කවදාවත් එහෙම වෙන්දේසි තිබෙනවාද කියා. තිබිලා නැහැ. මොකද මාත් ඕන තරම් වෙන්දේසිවලට සහභාගිවෙලා තිබෙනවා. මා කනගාටු වෙනවා මා එතැන නැවතුන එක සම්බන්ධව. සරත් ශ්‍රී ලාල් මන්ත්‍රිතුමාත් ඒ අවස්ථාවේ ගියා. මා එතුමාට කිවුවා පොඩ්ඩක් ඉන්න කියා. එතුමා කිවුවා මට අදාල නැහැ. හැබැයි මාත් එතුමා වගේ ගියානම් ඔය සිද්ධියට මුහුණ දෙන්න වෙන්නේ නැහැ. පාඩුව සභාවට . මා දන්නේ නැහැ. එක එක පුද්ගලයන් එක එක විදියට කියනවා. එමනිසා ඔයවගේ සිද්ධිවලට මා දෙපාරක් මුහුණ දි තිබෙනාවා. ඔහොම ගියොත් එහෙම ඉදිරියට මට ලොකු ප්‍රශ්නයට මුහුන දෙන්න සිද්ධ වෙනවා. එමනිසා මා තීරණය කළා ඒ කමිටුවෙන් ඉවත් වෙන්න. ඔකත් ඒ වගේ කමිටුවක්. එමනිසා මා මේ කමිටුවෙන් ඉවත් වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා හිතන විදියට අභියෝග හමුවේ ඉදිරියට කියා කියමනක් තිබෙනවා. එමනිසා අපේ ගරු උප සභාපතිතුමා ත්‍රිරෝද කමිටුවේ හිටපු හින්දා මමත් එහි නියෝජිතවරියක් වශයෙන් ඉන්න හින්දා එතුමා එයින් අයින් විම ගැන එතරම් කැමැත්තක් නැහැ. මොකද අභියෝගයක් එතුමාට භාර දුන්නා ගරු සභාපතිතුමා. ඒ අභියෝගය ජය ගැනීම එතුමාගේ ශක්තිය. එමනිසා එතුමා අප සමඟ එකතු වෙලා එය ක්‍රියාත්මක කරන්න ඕන කියන පදනමේ තමයි මා සිටින්නේ. එමනිසා අපි ගරු උප සභාපතිතුමාගෙන් ඉල්ලිම් කරනවා. ඒ ත්‍රිරෝද කමිටුවේ අපි අභියෝගයක් භාර ගත්තා. එම අභියෝගය භාරගෙන එය සාර්ථක අයුරින් ජනතාවට ඉටු කරන ලෙස. මොකෝ අම්බලන්ගොඩ ජනතාව බලාපොරෝත්තු වෙනවා ත්‍රි රෝද රථ සම්බන්ධයෙන් අම්බලන්ගොඩ ජනතාවට යම්කිසි වැඩපිළිවලක් සාර්ථකව ක්‍රියාත්මක වෙන්න ඕන කියා. එතුමා කිවුවා අබිලි භාණ්ඩ වෙන්දේසියේදිත් එතුමාට ප්‍රශ්නයක ඇතිවුණා කිවුවා. මා දන්නේ නැහැ. ගරු උප සභාපති වශයෙන් එතුමාට මේවැඩ කරගෙන යාමේදි සැහෙන බාධක ඇති වෙනවා . ඒ ගැන ඔබතුමා මිට වඩා කල්පනාවෙන් වැඩ කරන්න ඕන. එතුමාට සහායෝගය

ලබා දෙන්න ඕන. එතුමාට ශක්තියක් දෙන්න ඕන ඔබතුමා. එක නැති නිසාද දන්නේ නැහැ. එතුමාට බලයක් පවරන්න ඕන. එහෙම වෙන්නේ නැති නිසාද මං දන්නේ නැහැ. එතුමාගේ අසාර්ථකභාවයක් දකිනවා අපි වැඩ කිරිමේදි. මන්ත්‍රිවරයෙක් වශයෙන් අපි කනගාටු වෙනවා. එතුමාට ඒ වෙන්දෙසියේ දි කනගාටු දායක අවාසිදායක සිද්ධියකට මුහුණ දෙන්න සිද්ධ වුණා නම් මා හිතන විදියට මාගේ මේ සිටින සියළුම මන්ත්‍රිවරු ඔබතුමා ඇතුළු එතුමා සමඟ ඉන්නවා. ඒ ගැන කනගාටු වෙනවා. එතුමාට ඒ සම්බන්ධව මොනවා හරි සාර්ථක ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස කියා සිටිමින් .ත්‍රි රොද කමිටුව නියෝජනය කරන මන්ත්‍රිවරියක් වශයෙන් එතුමාට එයින් ඉවත් නොවන ලෙසත් ඔබතුමාත් එතුමාට උපදෙස් දෙන්න. ඔබතුමා එක්කෝ බලය පවරන්න. මේය සාර්ථක කර ගන්න. මා හිතන්නේ බලය නැති හින්දාදෝ එතුමා මෙයින් අයින් වෙන්න සුදානම් වෙන්නේ. එමනිසා මොනවා හරි වැඩපිළිවලක් කරන්න. ඔබතුමලා පාලක පක්ෂයේ ඉන්නේ. පාලක පක්ෂයේ එකතුවීම තුළින් එම වැඩ පිළිවල සිදු කරන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු උප සභාපතිතුමා ත්‍රිරෝද කමිටුවෙන් ඉල්ලා අස්වීම පිළිබඳ කනගාටුව ප්‍රකාශ කරනවා. සාමාන්‍යයෙන් කෙලින් වැඩ කරන චරිතයකට දේශපාලන වශයෙන් විවිධ කම්කටොළු තිබෙනවා. අපි මන්ත්‍රිවරු විදියට මේ කමිටුවලට ඇවිත් ඒ ත්‍රිවිල් කමිටුවට පැමිණ තමන්ගේ සේවය සිදු කරන කොට අම්බලන්ගොඩ නගරයට ඒ අපහසුතාවයට පත්වීම පිළිබඳ ඇත්තටම කනගාටුවට පත්වෙනවා. ඔබතුමා වුණත් මා වුණත් කවුරු වුණත් පත් වුවත් ඒ මන්ත්‍රිතුමා අපි ආරක්ෂා කර ගත යුතුයි. එයට නිත්‍යානුකුල කටයුත්තක් කර ගත යුතුයි. විශේෂයෙන් සම්බන්ධවෙලා. අපිට මේ ප්‍රශ්නවලට පිළිතුරු සොයන්න බැහැ. හරිම ආමාරු කමිටුවක්. මෙයට කවුරුවත් සම්බන්ධ වෙන්නේ නැහැ. මාත් කාලයක් හිටියා ඔය කමිටුවේ. ලොකු අපහසුතාවයකට පත්වෙනවා. උපරිම තරහාකාරයන් බිහිවෙනවා. ඇත්ත කතන්දරය. ස්ටිකරය සම්බන්ධව ත්‍රිවිල් කමිටුවේ. එමනිසා එක්කෙනෙකුට කියා මෙහි බරපැන පවරලා අපි මෙයින් අයින් වෙලා මේ නගරයට සේවයක් වෙන්නේ නැහැ. එමනිසා මේ කමිටුවලට සම්බන්ධ නොවන අය මේ කමිටුවට සම්බන්ධ කරලා මෙය ටිකක් විනිවිදභාවයෙන් කරන්න. ඔබතුමා මෙයින් අයින් වෙන්න එපා. මා මේ එතුමාගේ මුහුණට කියනවා නෙමේ. ගරු උප සභාපතිතුමා කියන්නේ කොන්දක් තියාගෙන වැඩ කරන චරිතයක්. දේශපලාන වුණත් ඒ හයිය ඔබතුමා ගන්න. අපි මේ කමිටු වලින් ඉවත් වි මෙයට කරන විසඳුමක් නෙමෙ කියමින් ගරු සභාපතිතුමා ඔබතුමාගෙන් ඉල්ලිමක් කරනවා . ඔබතුමාත් මෙයට සම්බන්ධ වෙන්න. දැන් නැතිනම් වැඩ කරගෙන යන්න බැරි වෙනවා. මේ වැඩකටයුතු සාර්ථක කරගන්න ඔබතුමා ඉදිරියටත් කටයුතු කරන්න කියා ඉල්ලිම කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපේ උප සභාපතිතුමා ත්‍රි රෝද කමිටුවෙන් ඉල්ලා අස්වෙනවා කිවුවාම අපිට ඉදිරියේදි මේ වැඩ කටයුත්ත කරගෙන යන්න බැරි වෙනවා. මා නම් ඔය කමිටුවට නැහැ. මාගේ යුතුකමක් ලෙස මා කතා කරන්න ඕන කියා හිතුවා. ඇත්තටම අපේ ගරු උප සභාපතිතුමා වැඩක්

ගත්තොත් එය බයනැතුව කරනවා කියා කියන්න පුළුවන්. එතුමාට පහර දීම සම්බන්ධ නඩුවට මා තමයි ඇත්තටම පෙනී සිටියේ. මා දන්නවා එතුමා එතනට ගියාම හරිම අසරණ වෙනවා. සභාවෙන් වත් කවුරුවත් එහෙම කෙරෙන්නේ නැහැ. පෞද්ගලික නඩුවක් එතුමාට පහර දීම. එතුමාට පහර දීම සම්බන්ධයෙන් එතුමා සාක්ෂි දෙන්න යනවිට නගර සභාවට වෙච්ච අගතිය සම්බන්ධව ලේකම්තුමිය කළානම් ඒ සම්බන්ධව විභාග කරලා එයටත් අධිකරණයෙන් නඩුවක් පැවරිය යුතු වෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමා අපේ ගරු සභාපතිතුමා හා නීතිඥවරයෙක් විදියට මේ ගැන සොයා බලා සහාකාර පොලිස් අධිකාරිතුමාට හෝ මූලස්ථාන පොලිස් පරික්ෂකතුමාට කතා කර ඒ සම්බන්ධව නඩුවක් පවරන්න. එම අවස්ථාවේ මෙම ගරු උප සභාපතිතුමා එම අවස්ථාවේ සාක්ෂිකරුවෙකු වෙයි . මොකද එතුමාටත් ආත්ම ගරුත්වයක් තිබෙනවා. දැන් සාක්ෂිකාරයෙක් විදියට යන්නේ එතුමාට පහර දීම සම්බන්ධව. ඒ සම්බන්ධව එතුමාට කනගාටුවක් ඇති. කොහොම වුණත් මා අපේ ගරු උප සභාපතිතුමණනි, මා ඔබතුමාට කියනවා එහෙම මඟ හරින්න එපා. මේක අපේ අම්බලන්ගොඩ නගරය. මේක අපේ ගම . මෙය හදන්නේ අපේ ගමේ මිනිසුන් මේ නගරයේ මිනිසුන්ට යම් දෙයක් කරාවි කියා. අනික ඔබතුමා උප සභාපති තනතුරේ සිටින කෙනෙක්. එමනිසා ඔබතුමා මෙහෙම කර අරින්න එපා. අභියෝග එනවා. ඕනවේලාවක මොනවා හරි ප්‍රශ්නයක් තිබ්බොත් මා ඔබතුමාගෙන් අහනවා. කමල් මල්ලි කොහොමද කියා අහනවා. මා කවදාවත් මඟ හරින්නේ නැහැ. එමනිසා මී කියන්න කැමතියි මා ඔබතුමා සමඟ අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන් කරන ඕනෑම සාධාරණ දෙයකදි ඉන්නවා කියා. එහෙම පැහැර හරින්නේ නැතුව තව දුරටත් කරගෙන යන්න. එයට අපේ ගරු සභාපතිතුමා උදවු කරයි. ගරු සභාපතිතුමනි ඔබතුමා එයට මැදිහත්වෙලා එයට උදවු කරන්න. දැන් ඇත්තටම මෙතුමා ඉවත් වුණොත් කෙනෙකුත් නැහැ. අපේ ඩෙනට් පනියන්දුවගේ මහතා නැහැ. එතුමා බොහොම ශක්තිවන්ත පුද්ගලයෙක් විදියට පෙනී සිටියා. එමනිසා මෙය හරියට කරන්න. මා කියනවා ඔබතුමා නැවතත් සිතා බලන්න. මේ තීරණය ගන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , ඔබතුමා වැඩය කරන්න අරගෙන අයින් වෙන්න එපා. ඔබතුමලා ශක්තිමත්ව මුහුණ දෙන්න ඉන්න අය. අපි විපක්ෂයේ සිටියත් උප සභාපතිතුමලාට ආශිර්වාද කරනවා. ඔබතුමා වැඩක් කරන්න ගත්තාම මාත් කියනවා නොබියවම කරනවා කියා. අපි ඕන වේලාවක ලැහැස්තියි ඔබතුමාට ඒ හයිය දෙන්න. අම්බලන්ගොඩ නගරයේ සිටින ඕනෑම ත්‍රි රෝද රියදුරේකු සමඟ අපිටත් පුළුවන් හැපෙන්න. අපි ලැහැස්තියි ඕන දෙයකට. ගරු සභාපතිතුමා කමිටුව තිබෙන දිනයට අනිවාර්යෙන් පොලිස් නිලධාරියෙකුත් කැඳවන්න. ත්‍රි විල් කමිටුව තනියෙන් තියන්න එපා. ත්‍රි විල් කමිටුවට පොලිසියේ කෙනෙකුට සාමාජිකත්වය දෙන්න. ඔවුන්ට කියන්න සහභාගි වෙන්න කියා. අනිවාර්යෙන් සහභාගි වෙන්න කියන්න. කාගේ වුණත් එය කරන්න ඕන නම් කරන්න. නැතිනම් සභාව ගෙනියන්න බැහැනේ. උප සභාපතිතුමා විතරක් නෙමේ. උප සභාපතිතුමා කියන්නේ එක පුද්ගලයෙක් විතරයි. උප සභාපතිතුමාට අපි 20ගේම ශක්තිය දෙන්න ඕනේ ත්‍රි විල් කමිටුවේ වැඩ කරන්න. ත්‍රි විල් කමිටුවේ අසාධාරණ විදියට වැඩ කරන්නේ නැහැ කියා මා දන්නවා. අපේ උප සභාපතිතුමා ත්‍රි විල් ගැන නම් කතා කරලා වැඩක් නැහැ. අම්බලන්ගොඩ නගරයේ තිබෙන. මා ත්‍රිවිල් ගැන කතා කළහොත් එළි ඵ වෙනකම් කියන්න පුළුවන්. ත්‍රිවිල් කොහොමද සැරි සරන්නේ කොහොමද ? හැසිරෙන්නේ කොහොමද? උපයන්නේ

කොහොමද? කතා කරන්නේ කොහොමද ? බොහොම ලස්සනයි. මා කිවුවා එදා. ත්‍රිවිල් කමිටුවේ යෝජනාවක් ගෙන්න මිටර් සවි කරන්න කියා. කිසි ප්‍රශ්නයක් නැහැ. අහිංසක මිනිහෙක් මීටරය දැක්කාම ඒ ගණන දිලා බැහැලා යනවා. කතා නැහැ කොහේවත් නැහැ. දැන් ත්‍රිවිල් අයට ඕන ඕන විදියට ගාස්තු අය කරනවා. එය ලොකු අසාධාරණයක් වෙලා තිබෙනවා අම්බලන්ගොඩ නගරයේ. කෙහේ හරි ඈතකට ගියොත් රුපියල් 3000/= කිවුවත් ගෙවන්න වෙනවා ඒ මිනිසුන්ට. එමනිසා මා කියනවා මාත් මිට පස්සේ ත්‍රිවිල් කමිටුවට පත් කරන්න. අපි මේ නගරයේ හෙට මලත් කමක් නැහැ හරියට වැඩය කරලා. මොකද නැත්තේ ත්‍රිවිල් කමිටුවට තැන තිබ්බොත් මේ සභාවේ සභාව ගෙනියන්න බැරි වෙනවා. එමනිසා මේ මන්ත්‍රිවරු 21 ම හැම පක්ෂයක් නියෝජනය වන විදියට මේ ත්‍රිවිල් කමිටුව ශක්තිමත් කරන්න. එතුමාට ශක්තියක් වෙන්න. උප සභාපතිතුමා ඔබතුමා ඉන්න. ඔබතුමා පිටුපස අපි ඉන්නවා පිටුපස. උසාවිද පොලිසිද අපි ඉන්නවා මැරෙනකම්. ඔබතුමා ශක්තිමත් වෙන්න. ඔබතුමා අයින් වෙන්න එපා. ඔබතුමාලා අයින් වෙලා මේවා කරන්න බැහැනේ. දැන් ඔබතුමා අයින් වුණා කියා ත්‍රිවිල් කමිටුව කරගෙන යනවා. එතකොට ඉන්න ඉන්න ඔක්කොම ත්‍රිවිල් කමිටුවට දිලා යනවා සභාව. ඒ විදියට යටත් වෙන්න එපා. ඔබතුමා ත්‍රිවිල් කමිටුව කරගෙන යන්න. අපි ත්‍රිවිල් කමිටුව ශක්තිමත් කරන්න. අනිත් එක තමයි ගරු සභාපතිතුමනි ඔබතුමා තමයි බලවතා. ඔබතුමා කියන්න ත්‍රිවිල් කමිටුවේ මෙහෙම ප්‍රශ්න ඇතිවෙනවා. එදා අබිලි ද්‍රව්‍ය වෙන්දෙසියේදි පොලිසියේ කවුරු හරි ගෙන්වා ගත්තා නම් හරි. ඒ වගේ අපිට පුළුවන්නේ පොලිස් ආරක්ෂාව ගන්න. සභාපතිතුමාට ඒ බලය තිබෙනවා. සභාවේ. එමනිසා මේ අවස්ථාවේ කරන්න. ත්‍රිවිල් කමිටුවේ ඔය මිල ගණන් අයකිරිමේ අසාධාරණය වෙනවාමයි. මට කිහිප දෙනෙකු කිවුවා. මා මෙතනට ඇවිත් රු.80/= ගෙව්වා. බස්නැවතුමේ සිට. මා කිවුවා මා මන්ත්‍රි කියා. මට මන්ත්‍රි වුණාම මොකද ඇහුවා. ඉතිං මොනවාද කතා. මා රු.80/= දිලා උඩට ආවා. ඉතිං මට එහෙම කළානම් අනිත් අයට කොහොම කරනවා ඇත්ද ? එමනිසා ඔබතුමාට කියනවා මිටර් සවි කරන එක ඒකමතිකව සිදු කරන්න. මොකද රජයෙන් කියනවා මිටර් සවි කරන්න කියා. නගර සභාවේ බලපත්‍ර ගත් සැම කෙනෙකුම මිටර් සවි කළ යුතුයි. ඊළඟට අපි ගමේ සිටින සියළුම ජනතාව දැනුවත් කරන්න ඕනේ. නගර සභාවට අයිති ත්‍රිවිල් එකක ගමන් කළ යුතුයි ඔබේ ආරක්ෂාව සඳහා. මිටරයක් සවි කර ඇති ත්‍රිවිල් එකක ගමන් කළ යුතුයි කියා. මොකද අපි මෙය හරියට කරගෙන ගියොත් ත්‍රිවිල් අය අපි සමඟ හැපෙන්න එන්නේ නැහැ. රජයේ නිතියනේ කරන්නේ. දැන් ඔබතුමලාගේ රජය . දැන් ඔබතුමාලාට සම්පූර්ණ බලය තිබෙනවා වැඩ කරගන්න. විපක්ෂයේ නෙමේනේ. එමනිසා මෙය හොඳ ශක්තිමත්ව කරන්න. අපි සිටිනවා ඔබතුමා සමඟ . ඔබතුමා ඉල්ලා අස්වෙන්න එපා. ගැටළුවට ඔබතුමාට ශක්තිය දෙන්නේ නැහැ කියා කියනවා නම් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රිවරු සේම අපි වුණක් ඔක්කොම ඉන්නවා ඔබතුමාට ශක්තිය දෙන්න. ඔබතුමා සමඟ . වැරදි දේවල් වලට අපි උදවු කරන්නේ නැහැ. හරිදේ කරන්න. ඔබතුමා ඉල්ලා අස්විම අයින් කර ගන්න. ඔබතුමා ත්‍රිවිල් කමිටුවේ සභාපතිතුමා වශයෙන් කටයුතු කරන්න. අපි සහභාගි වෙනවා ඕනම දෙයකට. සභාව වෙනුවෙන් ගන්න ඕනම ප්‍රශ්නයකට මා සිටිනවා විපක්ෂයේ වුණාට. එමනිසා මෙය කරන්න. ගන්න තීරණ ගන්න පොලිසිය සමඟ. පොලිසියට කියනවා අපි ඒ ටික කරන්න කියා. පොලිස් නිලධාරින් කරනවා එතකොට. අනිත් එක මා එකක් කියන්නම්. සභාවේ ගන්න තිරණ පිට යන්න බැහැ. මා හොඳට බලපු දෙයක් තමයි සභාවේ ගන්න ඕනම තීරණයක් අපි කියන්නත් කලින් ඒ අය දැනගෙන ඉවරයි. මෙය බොහොම කනගාටුදායක දෙයක්. මොකද අපි කිසිම

කෙනෙක් අපේ නිලධාරින් පහත් කරන්නේ නැහැ. දැන් අපේ කවුරුහරි කෙනෙක් කාටහරි විරුද්ධව කතා කළහොත් එය කියන්න හොඳ නැහැ. මොකද එතුමියට පිටුපසින් ගිහින් පිහියෙන් අනින දෙයක් කරන්නේ. ඔක්කොම උගත් අය. අපි හිතන්නේ මේ සභාවේ ඉන්න අය ඔක්කොම උගතුන්. නූගත් කිසිම කෙනෙක් නැහැ. අපි හැමෝම අපේ මන්ත්‍රීවරුන් ආරක්ෂා කර ගැනීම, සභාව ආරක්ෂා කර ගැනිම , අම්බලන්ගොඩ කීර්තිය ඇති කර ගැනිම. අප හැමගේම වගකීමක්. එය ඉල්ලා සිටිනවා. මා එහෙම කිවුවේ එක්තරා සිද්ධියක් සම්බන්ධව. කමිටුවේ කතා කරන දේ යන්න ඉස්සරවෙලා මිනිසුන් දැනගෙන ඉවරයි. මෙය හරි පුදුම දෙයක්. එහෙම වෙන්න දෙන්න එපා. මා ඉතා ඕන කමින් ඉල්ලා සිටිනවා අපි සහෝදර මන්ත්‍රීවරුන් බොහොම සමගියෙන් වැඩ කරන්න. ඔබතුමා සභාපති වුණාට අපි ඔබතුමාට සහායෝගය දෙනවා. ඔබතුමා ත්‍රිවිල් කමිටුවෙන් අස්වෙන්න එපා. ඔබතුමා ත්‍රිවිල් කමිටුවේ ඉන්න. මෙය හරියාකාරව කරන්න කියා ඉල්ලීමක් කියනවා. ඔබතුමා තමයි මෙය සිදු කරන්න. මෙතුමාට අභියෝගයක් නම් ඔබතුමා ශක්තිය දෙන්න. අපි ඔබතුමාට ශක්තිය දෙන්න ඕන වේලාවක සූදානම්.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ත්‍රිවිල් කමිටුවේ සාමාජිකයෙක් වශයෙන් ඇත්ත වශයෙන්ම මට මේ අවස්ථාවේ කරුණු කිහිපයක් කියන්න තිබෙනවා. ත්‍රිවිල් කමිටුව දැනට වසර තුනක් තිස්සේ පවත්වා ගෙන යනවා. මා හිතන්නේ මෙය හැමදාම කතා කරනවා විතරයි. මා හිතන්නේ අපේ ගරු සභාපතිතුමා අපේ ගරු උප සභාපතිතුමාට සම්පූර්ණ බලය දි තිබෙනවා ත්‍රිවිල් කමිටුව සම්පූර්ණ එතුමාට කරගෙන යන්න. මා හිතන්නේ මා හැමදාම කමිටුවට සහභාගි වෙන කෙනෙක් නිසා මේ ත්‍රිවිල් කමිටුවට හැමදාම පොලිසිය සහභාගි වෙනවා. ගුණසේකර මහතා සිටින කාලායේ සිට සහභාගි වුණා.  නමුත් මෙතැන වැරැද්ද තිබෙන්නේ මේ ත්රිවිල් කමිටුවේ සිටින නිලධාරින්ගේ. මා දකිනවා එහෙම. මා හැමදාම කියනවා. මොකද මේ විෂය කරගෙන යනකොට මේ විෂයේ විෂය භාර නිලධාරියා මාරු කරනවා. මාරු වෙනවා හෝ මාරු කරනවා. එතකොට මෙය තව මාස දෙක තුනක් ඇදිලා යනවා. අලුතෙන් එන නිලධාරිතුමියට මෙය කරගෙන යන්න බැරි වෙනවා. මොකද අර ගොනු කියවන්න ඕනේ. මෙතැන වැරැද්ද තිබෙන්නේ ගරු සභාපතිතුමා අතර වත් ගරු උප සභාපතිතුමා අතරවත් නෙමේ. මොකද පොලිසිය කියනවා ඔගොල්ලන් නම්කර තිබෙන ඒවා ගැසට් කර නැතිනිසා අපිට මෙය කරන්න බැහැ කියන එක. එතකොට මෙහි නිලධාරින්ගේ දුර්වලකමක් තමයි තිබෙන්නේ. ත්‍රිවිල් කමිටුව මාස තුනකට සැරයක් රැස්වෙලා තිබෙනවා. මාස දෙකකට සැරයක් රැස්වෙලා තිබෙනවා. දැන් ගියවර 11 කමිටුව රැස්වෙලා  ගරු උප සභාපතිතුමා කිවුවා මේ ලබන සතියේ තව සතියකින් සම්පූර්ණ මේ වාර්තා ටික දෙන්න කියා මේ රථගාල් නම්කර පොලිසියට දෙන්න කියා. අපි පොරොන්දුවක් ඇතිව තමයි කළේ. අද වෙනතුරුත් ගැසට් කරන්න බැරි වුණා. මෙතැන නිලධාරින්ගේ තිබෙන අපහසුව තමයි තිබෙන්නේ. මෙහේ පොලිසිය කරන්නේ නැතිනම් ඇල්පිටිය පොලිසියට වත් දැනුම් දිලා මෙය කරන්න . මා ඔබතුමාට කියන කොට ඔබතුමා කිවුවා උප සභාපතිතුමාට බලය දිලා තිබෙන්නේ. මේක කරන්න. මෙතන තිබෙන්නේ නිලධාරින්ගේ අපහසුතාවය. එ ගොල්ලන් කටයුතු කරන්නේ නැහැ. මා හිතන්නේ අර වැට භාගේට ගහලා. කාලයක් තිස්සේ අපි කිවුවා ඒ වැට සම්පූර්ණම ගහන්න කියා. මොකද එතරම් අනතුරු වෙනවා. මැදින් වැට ගහලා දෙපැත්තෙන් ඉඩ තියලා. ගාලු පාරේ. එතකොට එක වහන්න කිවුවා. දැන් මාස ගණනක සිට. ඒ කටයුතු කරන්න. එතන

පාරේ ලැලි දමන්න කියා හැමදාම කියනවා. දැන් දින 21 ඒවා 21 විතර ගිහින් තිබෙනවා එම ලැලි දමන්න. මෙතැන නිලධාරින්ගේ වැරැද්දක් තමයි ත්‍රිවිල් කමිටුව අක්‍රිය කළේ. ගරු උප සභාපතිතුමා කමිටුව රැස්වෙලා මෙතැන කිවුවාට මෙතැන වැඩ කරන්නේ නැහැ. බෝඩ් ගහනවා කියා. බෝඩ් සවි කරනවා කිවුවා. භාගයක් සවි කරනවා. භාගයක් තිබෙනවා. ඔය විදියට තමයි කමිටුව යන්නේ. එතන ත්‍රිවිල් කට්ටිය කියන්නේ අපි හැමදාම මුදල් ගෙවලා බලපත්‍රය ගන්නවා . මුදල් ගෙවන්නේ නැහැ. බලෙන් ඇවිත් ගහනවා. ඔය කටයුතු ඔක්කොම පොලිසියට භාරදීලා කටයුතු කරන්න අපි ලැහැස්ති කරලා තිබුණේ. මෙතැන මෙය ගොඩක්ම අපහසුතාවයට පත් කරන්නේ නිලධාරින්. ඔබතුමා හරි මැදිහත්වෙලා මෙය කරන්න කියා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ත්‍රිවිල් කමිටුවේ මාත් කාලයක් සිටියා. ඒ කාලය තුළදී මට අදාළ වන නිසා පොල්වත්ත ත්‍රිවිල් රථගාල සම්බන්ධව වැඩ කටයුතු සිදු කළා. පැමිණිල්ලක් ඉදිරිපත් වෙලා ඒ අනුව ක්‍රියාත්මක වෙලා බෝඩ් එකකුත් ගැහුවා. ඒ සිදුවීමෙන් සිදු වුයේ එම ත්‍රිවිල් රථගාලේ සිටින අය මා සමඟ තරහා වුණා. ඉතිං එත් කමක් නැහැ. අවසානයේ මට යන්න ත්‍රිවිල් එකක් ගෙන්න ගන්න බැරි තරමට මා පත්වුණා. මා එහි සාමාජිකයෙක් නිසා. අවුලක් නැහැ මා කොහොම හරි යනවා. අනිත් එක තමයි එම ගසන ලද බෝඩ් එකේ වාහනයක් හැපි ගැලවිලා. එය ඊට පස්සේ නැවත සවි කිරිමක් නැහැ. එය මා නම් දකින්නේ වාහනයක් හැපිලා ගලවලා නෙමේ. ගලවා දමලා. ඒ වගේම පාලනයකින් තොර නගර සභාවක් තමයි තිබෙන්නේ. මේ ළඟදි අම්බලන්ගොඩ බස්නැවතුම්පොල ඉදිරිපිට මාගේ යතුරු පැදිය ගැසුවා පොඩ්ඩකට. රාත්‍රි 9.00 ට 10.00 විතර . එතකොට ත්‍රිවිල් එකක් පැමිණ මට කිවුවා යතුරු පැදිය අයින් කරන්න කියා. ඉතිං මා කියන්න ගියේ නැහැ මා නගර සභා මන්ත්‍රි කෙනෙක් කියා. අර අයිරාංගනි මන්ත්‍රීතුමියට අහන්න වෙන එක මට අහන්න වෙනවා. මා එය කිවුවේ නැහැ. මා කිවුවා මා අයින් කරන්නේ  නැහැ. ඔයා ඕන තැනක ගසා ගන්න කියා. මමත් එච්චර හොඳ නැහැනේ. එක නිසා. එහෙම නම් එහෙම තමයි කරන්න ඕන. මොකද පවතින්න බැහැනේ මේ සමාජ ක්‍රමය තුළ. මා කිවුවා ඔයාට ඕන නම් බයිසිකලය වෙන තැනකට දමන්න කියා. අර එහායින් ඕන තරම් ඉඩ තිබෙනවා. එහෙම ගහන්නේ නැහැ. ඒ වෙන්කරපු තැන් තිබෙනවා. බස්නැවතුම්පොළ ඉදිරිපිට එහෙම වෙන්කර තියන්න බැහැ. ඕනම පුරවැසියෙකුට ඇවිත් වාහනයක් නතර කරන්න පුළුවන් වෙන්න ඕනේ. ඒ කියන්නේ පාලනයකින් තොරයි. මා ඔබතුමාට කලිනුත් කිවුවා . ඔබතුමා කිවුවා ආරක්ෂක අංශය ඉන්නවා. ඒ අය මෙයට වග කියන්න ඕන කියා. එහෙම වගකියන්න ඒ අයට පනක් කෙන්දක් නැහැ. පැත්තකට අල්ලා දෙකක් ඇණලා දාවි. එහෙම ත්‍රිවිල් කාරයින්. සමාවෙන්න ත්රිවිල් කාරයෝ කිවුවාට. මොකද මේ වචන පනිනවා. ඔන්න ඕක තමයි අද තත්ත්වය. නගර සභා මන්ත්‍රිවරයෙකුට යතුරු පැදිය ගහන්න බැරි නම් ඒ වාහන රථ ගාලේ අනිත් මිනිසුන්ට මොන කතාද ? ඉතිං ඔන්න ඔහොම තත්ත්වයක් තමයි තිබෙන්නේ. මේ අපේ ගරු උපසභාපති කමල් මහතා ටිකක් දඩබ්බර වුණත් එතුමා භාර ගත්ත ඒවා කරනවා. එතුමාට පුද්ගලිකව හානිකර තත්ත්වයක් මේ සිද්ධින් තුළ ඇතිවෙලා තිබෙනවා. එමනිසා මා  කියනවා එතුමාගේ නිදහස එතුමාට දෙන්න. තව මන්ත්‍රිවරු ඉන්නවා. ඒ අයට මෙහි වගකිම භාර දෙන්න. ඒ ගොල්ලනුත් එහි බර දකිවි.

## ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ නගර සභාව තුළ තිබෙන වැඩිම ප්‍රශ්න ගත කමිටුව තමයි මේ ත්‍රිවිල් කමිටුව. පසුගිය උප සභාපතිතුමාගේ සභාපතිත්වය තුළ මමත් පැමිණියා කමිටුවට සහභාගි වෙන්න. හැබැයි අපි දකිනවා මේ නීතිය ක්‍රියාත්මක විමේදි ඒවා නිලධාරින්ටත් නිත්‍යානුකුල විය යුතුයි. පොලිසියේ සහභාගිත්වය ටිකක් අදිමදි ගතිය තිබෙනවා. ඒ වේලාවේ ගරු සෝභිත මන්ත්‍රීතුමා කතා කරලා තමයි රථ වාහන අංශයෙන් ගෙන්වා ගත්තේ. ෙමහි ගරු උප සභාපතිතුමාගේ කාර්ය භාර්ය ඉටු කරනවා වගේම අර කියන්න වගේ නිලධාරින්ගේත් කාර්ය භාර්යයක් තිබෙනවා. මෙහිදි නිත්‍යානුකුලව කටයුතු කිරිමේදි පොලිසිය මැදිහත් වෙන්න ඕන.මට උප සභාපතිතුමා අයින් වෙන්නේ මොකද කියන එක ගැටළුවක් තිබෙනවා. ඔබතුමා පාලන තන්ත්‍රයේ උප සභාපති. සභාපතිතුමාත් ඔබතුමාගේ පාලන තන්ත්‍රයෙන් ඉන්නේ. ඇයි මෙය අපිට හරි මාර්ගයකට යන්න බැරි. මෙහි ත්‍රිවිල් ගත්තාම ඒ මහත්වරුන්ටත් පොඩි ගැටළුවක් තිබෙනවා. සමහර අය නිතියට අනුගත වෙනවා. මුදල් බැඳ එම ස්ටිකර් එක ගන්නවා. අරගෙන ගිහින් ඒ අය කියන විදියට වැඩ කටයුතු කරන්න ගියාම තවත් කට්ටියක් ඉන්නවා මෙය බලෙන් ගහාගෙන අර නිතියට කටයුතු කරන කට්ටියටත් තර්ජනය කරගෙන යන්නේ. හැබැයි එහි මුලික වශයෙන්ම සභාපතිතුමා වගකිව යුතුයි සභාවට. ඔබතුමා අයින් විය යුතු නැහැ. ඒ පොලිස් නිලධාරින් සමඟ අත්සන් කරන්න. නිත්‍යානුකුලව ගැසට් කිරිමේ ගැටවවකුත් තිබෙනවා. එය යවා තිබෙන්නේ කොමසාරිස්තුමාගෙන් අනුමැතිය ලැබි නැහැ. නිලධාරිත් මහන්සි වෙලා මෙය ඇත්තටම කළා. මා හිතන්නේ බෝඩ් ගහලා ඇත්තටම මේ ටික කළා. ඒ ගොනු හදලා මෙය ලොකු කාර්ය භාර්යක්. හැබැයි මේ පොදු දේපල කියන එකට හානි කිරිම ඉතාමත්ම බරපතල වරදක්. පණත් තුළ . මෙතුමා ගත්තාම පොදු දේපල වලට හානි කිරිම කියන්න දෙයක් නැහැ. ඕන කෙනෙක් දන්නවා. අන්න ඒවා ක්‍රියාත්මක වෙන්න ඕන. ඇපත් නැහැ. ඇයි මේකට එක්කෙනෙකුට දුන්නා නම් අනිත් අය හැදෙනවා. මේක තුළ කටයුතු කර දැම්මා නම් අන්න එක ක්‍රියාත්මක කරන්න. ඒ තුළ කටයුතු කරන්න ක්‍රියාත්මක වෙන්න ඕනේ. මා හිතන්නේ ඔබතුමා දැඩි මහන්සියක් ගෙන අපි කලින් ඉදලාම පවත්වාගෙන ආව කමිටුවක්. මෙහෙම යන්න ගියොත් එහෙම කොහේටද මේ නගරය යන්නේ. නගරයේ පාලනය නගර සභාව විසින් කරන මුලික කටයුත්ත අත්හැර දැම්මොත් ඔබතුමා කවුද මේ තුළ කටයුතු කරන්නේ. මෙහේ කොහේවත් ඉන්න අය පාලනය කරන්නේ. ඒ අයට ඉඩ දෙන්න වෙනවා. ඕක කරන්න බැහැ. හැබැයි අපේ තිබෙන අඩුපාඩුකමුත් අපි සම්පුර්ණ කර ගන්න ඕන. සභාපතිතුමාත් උනාන්දු වෙලා. ඔබතුමාට කරන්න පුළුවන් යම් හයියක් තිබෙනවා. නගරය තුළ ඔබතුමා නිතිඥ මහත්මයෙක් විදියට. සභාපති හැටියට. පොලිසියෙන් කෙරෙන්න ඕන කාර්ය භාර්ය. රථවාහන අංශයේ වෙනම රැස්විමක් තියන්න. මුලස්ථාන පොලිස් පරික්ෂක මහතාගේ මුලිකත්වයෙන්. සාකච්ඡා කරනවා මාර්ග අවහිරතා ඒ සියළු දේ. කතා කරනවා.

## ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

දැන් එක නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් එය කොහොත්ම පවත්වන්නේ නැද්ද? අන්න එක වැදගත් . මොකද දැන් මෙතනට රථවාහන අංශයේ පොලිස් මහතෙකු පැමිණියාට එයා ගන්න තීන්දු තීරණ ගැන ඉහළින් දුරකථන ඇමතුමක් ආවොත් එය පැත්තකින් තිබ්බා. මොකද දේශපාලන යම් බලපෑමක් ආවොත් එහෙම. ඒක නිසා ඉහළින්ම සම්බන්ධ කරලා කාටවත් පහර ගන්න නෙමේ. පොඩි ගණනක්. මේ දැන් ගාස්තුව මාසයකට වෙන්නේ රුපියල් 100/= ක් කොහේ. අවුරුද්දට රු.1200/= යි. මේක එච්චර ලොකු වැඩක් නෙමේ. හැබැයි මෙහෙමයි මේ ක්‍රමවේදය තුළ ක්‍රියාත්මක කරන්න. ඔබතුමා සභාපතිතුමා වගේම අනිකුත් හයිය ගන්නවා වගේම අපි සහායෝගය දෙනවා. හැබැයි මෙහි අඩුපාඩුවක් තිබෙනවා. එය නිවැරදි කර ගන්න. ඒ නිවැරදි කර ගැනීම කර ගන්න. එක හරියන්නේ නැහැ. මහජන නියෝජිතයන් වගේම මෙතනට ඇවිත් වැඩකුත් නැහැ. ඔබතුමා අයින් වෙන්න එපා. ඔන දෙයක් කිරීමේ හැකියාවක් තිබෙනවා. අපි දන්නවා එතුමා ගැන. එමනිසා ඔබතුමා සාකච්ඡා කරන්න. සභාපතිතුමත් එක්ක. මේ කමිටුව ගත් තීන්දු තීරණත් එක්ක. ඔබතුමාට කර ගන්න බැරි යම් දෙයක් තිබෙනවා නම් එතුමාට කිවුවා නම් එතුමා අතිගරු ජනාධිපතිතුමා එක්ක හරි කතා කරලා එය කරාවි. එමනිසා අන්න ඒ හයිය තියාගෙන තමුන්නාසේලාට අන්න ඒ හයිය දි තිබෙන්නේ ඔය කමිටු වලින් අයින් වෙන්න නෙමේ. වැඩ කරන්නේ. කවුරු මොන ප්‍රශ්න ආවත්. ප්‍රශ්න තිබෙන්නේ දේශපාලනඥයන්ට. හැම දේම වෙන්නේ. ඔබතුමා ඒ සම්බන්ධව අයින් නොවී කටයුතු කරන්න. ගරු සභාපතිතුමාගෙනුත් අපි ඉල්ලා සිටිනවා එතුමාට යම් ප්‍රශ්නයක් තිබෙනවා නම් එතුමාට සාකච්ඡා කරලා විසඳා ගන්න . අපි අපේ දෙන්න පුළුවන් සහායෝගය අපි දෙන්නම්. තවත් එකක් . අබිලි ද්‍රව්‍ය වෙන්දෙසිය සම්බන්ධව පොඩි කතාවක් එතුමා කිවුවා. මා හිතන්නේ එය නගර සභාවට පොඩි පාඩුවක් වෙනවා කියන කතාවකුත් කිවුවා. මේ විෂයට අදාල නොවුණත් කමිටුවක වාර්තාවක් නිසා . මෙය ඇත්තටම අපිට තිබුණේ අධීක්ෂණය කරන්න. නිලධාරීන් එම රාජකාරිය කළා. මොකද නිලධාරීන් නෙමේ පොලිසිය ආවත් මේ තිබෙන තත්ත්වය අනුව කවුරු ආවත් පාලනය කරන්න බැහැ. අද මිනිසුන් ඒ තත්ත්වයට හැඩ ගැහෙන්නේ. මෙතැන මේවා කරන කොට ඒ ගොල්ලන්ම ඡායාරූප ගෙන දමනවා මාධ්‍යයට. ඒ නිලධාරීන්ටත් කරන්න දෙයක් නැහැ. මොකද ඒ ගොල්ලන් එන්නේ යකඩ ටික ගත්තා . ඒ ගොල්ලන්ට කියක් හරි වැඩිපුර ගන්න පුළුවන් නම් ඒක ගන්න. අපිට එකට නිලධාරීන්ටත් දොස් කියලා වැඩක් නැහැ. ඒ කටයුත්ත කරන කොට. එතනට එනකොට ඔක්කොම ගනුදෙණු කතා කරගෙන එන්නේ. එක්කෙනයි ලංසුව තියන්නේ. 35 ද තිබ්බේ . උන් හදන්නේ 35ටම ගන්න. ආදායම් පරීක්ෂක මහත්වරු තක්සේරුව තිබ්බාම. එක අපිට දොස් කියන්න බැහැ. ඒ ගොල්ලන් ඒවා කතා කරගෙන එන්නේ. එකතුල ක්‍රියාත්මක වෙන්නේ. අපි කියන්නේ වැඩියෙන් දෙන්න කියලා තමයි. නිලධාරීන්ට කරන්න දෙයකුත් නැහැ. උන් ඉල්ලන්නෙත් නැහැ. එතකොට යම් ප්‍රශ්න ගැටළු ඇති වුණේ මෙතුමාත් වැඩි ආදායමක් ලබා ගන්න තමයි කටයුතු කළේ. නමුත් අපේ නිත්‍යානුකුල තත්ත්වයත් එක්ක තමයි අපි යන්න ඕනේ. එකනිසා 40 ට තක්සේරුව තිබ්බා එකක්. 40 ය 50 ය ඉල්ලුවා. 41 ට ඉල්ලුවා එක්කෙනෙක්. එතනින් නැවතිලා මේවා කරනකොට මෙතුමා කිවුවා මේක 45කටවත් යන්න ඕන කියන මතය. එකහරි. නමුත් එගොල්ලන්ට ඒ නිත්‍යානුකුල තත්ත්වය වැඩක් නැහැ. ඒ අය ගණුදෙණුව කළා.

එක එක අතර මැදියන් එක්ක එනවා. ඒ අය ඉල්ලන්නේ නැහැ. මේ නිලධාරින් දන්නේ නැහැ. මේ නිලධාරින් ඊළඟ වෙන්දෙසියේදි නැහැ. අපි ඉතිං දන්නවා. එවා එනවිට ගණුදෙණු කරගෙන එන්නේ. බලෙන් වැඩි කරන්නත් බැහැ.ඒ තුළ මෙය අවසන් කර ගන්නත් ඕනේ. යකඩ බඩු මෙතැන පිරිලා ඉවර කරන්නත් බැහැ. සභාපතිතුමා එයට දොස් කියන්නත් බැහැ. එගොල්ලන් අවිත් ඒ අයම ඇති කරගත් කර්තව්‍යයක් ඒක. ඉතිං අපිට ඒ මිනිසුන්ගේ තත්ත්වයට අපිට වැටෙන්නත් බැහැ. යම් අපහසුතාවයකට පත් වුණා. ඒ සම්බන්ධව. නිලධාරියා තමයි තියන්නේ. අපේ නිලධාරියෙක් පත් කරලා ඉන්නවානේ. නිලධාරින් ඒ තක්සේරුව තුළ තමයි කටයුතු කරන්නේ. අපි තක්සේරුවක් එහි වැඩි කරනවා නම් කලින් කතා කරලා කර ගන්න ඕන. එක රැස්වුණේ නැහැනේ. එදාම තමයි සිදු වුණේ. එක වෙනම කතන්දරයක්. දැන් වෙච්ච දේ වුණා. නමුත් ඉදිරියේදි එහි පාඩම් ඉගෙන ගෙන වැඩ කටයුතු සිදු කරන්න. නමුත් එයට කෙසේ හෝ අපහසුතාවයකට පත්වුණා. මමත් හැබැයි හිටියා මෙතුමාට ඇතිවූ අපහසුතාවයත් එක්ක. අවසාන මොහොත දක්වාම. එහි නිතිය සම්බන්ධව ක්‍රියාත්මක වීම කෙරලා තිබෙනවා. ලේකම්තුමිය ඊට අදාල කටයුතු කළා. පොලිසියේත් ගත්තාම මෙතැන මේ විඩියෝ එක යවා තිබෙන්නේ මේගොල්ලන්. මාධ්‍යවේදින්ට කතා කරලා මෙතනට එනකොට ඒ ගොල්ලන් ඒ කර්තව්‍ය කොලඹින් කරලා ඉවරයි. කාටවත් කරන්න දෙයක් නැහැ. මා හිතන්නේ ඇහෙන්නත් ඇති ඒ යනකොට කිව ප්‍රකාශ. ඕක තුල තමයි. ප්‍රශ්න ගැටළු ඇති. මේක කරගෙන යන්න ඕන. මොනවා කරන්න ගියත් අපි නිතියට අනුව තමයි කරන්න ඕන. ඒ කටයුතු කිරිමේදි නිලධාරින්ගේ ඒ කටයුතු ඒ අවස්ථානුකුලව කර තිබෙනවා. අපහසුතාවයට පත් වුණානම් අපිත් වගකියන්න ඕන.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, එතුමා ත්‍රිවිල් කමිටුවෙන් ඉවත් වෙනවා කියන්නේ අම්බලන්ගොඩ නගරය ත්‍රිවිල් කට්ටියටම දෙන්න වෙයි. පාලනය වෙයි. පසුගිය දිනවල පොදුවෙළඳ සංකිර්ණයේ ගසනු ලැබූ ත්‍රිරෝද රථ අයින් කර තිබුණා. දැන් එහෙම නැහැ. දැන් ගහලා එතැනින් වාහනයක් යන්නත් බැහැ. පාර මැදම ගහගහන්නේ මේ ත්‍රි රෝද . පසුගිය දිනවල පොලිසියේ මහතෙක් සිට අයින් කළා. එම නිලධාරියා නැති වුණාට පසු දැන් නැවත ඒ විදියටම ත්‍රි රෝද රථ ගහනවා. උප සභාපතිතුමා එඩිතරව කරගෙන යනවා. මා ඔය ගැන මුලස්ථාන පොලිස් පරික්ෂක මහතා සමඟ කතා කළා. මගේ ව්‍යාපාරයේ සිටින අවස්ථාවේ. මා කිවුවාම ඇහුවා අයියේ මොකක්ද තියෙන්නේ මෙහේ. මා කිවුවා අපේ උප සභාපතිතුමා මෙයින් අයින් වෙන්න ඉන්නේ. ඒ පාර කිවුවා අයින් වෙන්න එපා මා එනවා. මා එයාට ශක්තිය දෙන්නම් කියා. එවිට මා දුරකථනයෙන් ගරු උප සභාපතිතුමා සම්බන්ධ කළා. එතුමා ඒ අවස්ථාවේ නිවසේ සිටියේ. එවිට මුලස්ථාන පොලිස් පරික්ෂකතුමා පැය භාගයක් විතර කතා කළා. විස්තර ඇහුවා. එතුමාත් කිවුවා අයින් වෙන්න එපා. මා එන්නම් කිවුවා කමිටුව නැවත පටන් ගන්න. එතුමා එන්නම් කියන එක ඒ අවස්ථාවේත් කිවුවා ගරු උප සභාපතිතුමාට. උප සභාපතිතුමා කමිටුවෙන් අයින් වෙන්න එපා. හරියට මෙය කරගෙන යන්න අපි හැමෝගේම ශක්තිය ගරු උප සභාපතිතුමාට දෙන්න ඕන. ගරු සභාපතිතුමා බලය දෙන්න මේ තින්දු තීරණ ගත් පසු ඒවා ක්‍රියාත්මක වෙන්න බලය ලබා දෙන්න. නිලධාරි මහත්වරු කරන්නේ නැහැ කියා මාත් සමහත් කිවුවා. මේ කමිටුව ගන්න තීරණ ඉෂ්ඨ කරගෙන යන්න එතුමාට බලය දෙන්න. නැතිනම් මේ නගරයේ තවත් ත්‍රිරෝද රථ රියදුරන් මේ නගරය පාලනය කරන්න ගනිවි. එකතමයි එන්න එන්න සිද්ධ වෙන්නේ. රාත්‍රි 7.00 වන බස්නැවතුම්පොළේ

දොරටුව අවහිර කර ත්‍රිවිල් ටික ගසනවා. එක මගියෙකුටවත් බස්නැවතුම ඇතුළට එන්න බැහැ. කෙලින්ම ඇතුල් වන ස්ථානයේ තමයි ත්‍රිවිල් ටික ගහන්නේ. මේ අපේ මන්ත්‍රීතුමා කිවූ කතාව සම්පූර්ණ ඇත්ත. මොකද තියෙන යතුරු පැදිය අයින් කරලා තමයි ත්‍රි රෝද රථය ගසන්නේ. ඒ තත්ත්වයට තමයි පත්වෙලා තිබෙන්නේ. මොකද දැන් බස්නැවතුමපොළ ඉදිරිපිට වැටක් ගසා තිබුණා ත්‍රිරෝද රථ ගාලු පාරට දමන්න බැරි වෙන්න. වැටෙන් භාගයක් කපලා තිබෙන්නේ. දැන් ගහපු ප්‍රමාණය නැහැ. දැන් වැටේ භාගයක් කපලා තිබෙන්නේ. ගිහිල්ලා බලන්න කියන්න ගහපු නිලධාරින්ට. සම්පූර්ණ ගහන්න කිවුවාම තමයි භාගයක් ගසා තිබෙන්නේ. වැඩේ කියන්නේ භාගයෙනුත් දැන් කැල්ලක් කපලා තිබෙන්නේ. ඕවි අයින් කර තිබෙන්නේ. ඒ විදියට ඒ මිනිසුන් හදාගෙන තිබෙන්නේ පාලනය. නගරයම පාලනය කරයි මේ ත්‍රි රෝද රථ රියදුරන් මේ කමිටුව නැති වුණොත් එහෙම. මොකද මෙයට ඉදිරිපත් වෙන කවුරුවත් ඉන්නේත් නැහැ. ඉදිරිපත් වෙන්නේ නැහැනේ මේ ත්‍රි රෝද කමිටුවේ සභාපතිකමට. අපේ ගරු උප සභාපතිතුමා බය නැතුව එඩිතරව එය අරගෙන තිබෙනවා. එතුමාට මෙය කරගෙන යන්න හැමෝම අපි ශක්තිය දෙන්න ඕන. ගරු සභාපතිතුමනි මා ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. එතුමාට එ බලය ලබා දෙන්න. කමිටුව ක්‍රියාත්මක කරගෙන යන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , මා හිතන්නේ මේ ගරු උප සභාපතිතුමාගේ ඉල්ලා අස්විමට ප්‍රධානම හේතුව නීතියේ අක්‍රමවත්භාවය. ගරු උප සභාපතිතුමා නෙමේ ඔබතුමා හිටියත් මේ කමිටුව මේ ආකාරයෙන් කරගෙන යන්න බැහැ. නගරයේ අවිධිමත්ම හසුරුවන ජනතාව තමයි ත්‍රි රෝද රථ හසුරුවනු ලබන අය. මා එක වැඩසටහනක අසාගෙන හිටියා. කොළඹ ප්‍රදේශයේ රථවාහන අංශයේ ප්‍රධාන පරික්ෂක මහතා ඒ අයට දේශනයක් දෙනවා. ඔගොල්ලන් දන්නවා ද ? ඔගොල්ලන් පාරට ත්‍රිරෝද රථයක් පාරට දැම්මා ම වැරදි කියක් කරනවා ද කියා. එතුමා පෙන්වා දෙනවා වැරදි 60ක් . පාරට ත්‍රි රෝද රථයක් දැම්මාම වැරදි 60ක් සිදු වෙන බව .එතුමා ප්‍රකාශ කළා. ඉතිං මේ වගේ අය සමඟ තමයි මෙතුමාට මේ නායකත්වය දී තිබෙන්නේ. ඔබතුමා කරනවාද මෙ ඕනෑම මන්ත්‍රීවරයෙක් කළත් මේ පවතින අර්ධ නිති යටතේ පොලිසිය සහභාගි වෙන්නේ නැහැ. පොලිසිය පොලිසියට අවශ්‍ය දේවල් අපි ලවා කරවා ගන්නවා. පාරේ ගමන් කළ යුතු හා වාහන පැමිණිමට පමණයි කියන බෝඩ් ඔක්කොම ගසා ගන්නවා. මේ සියළු දේම අසා නිති ක්‍රියාත්මක කරන්න ගියාම අහනවා කෝ ගැසට් එක කියා. ඔය ටික නැහැනේ. එතකොට මුලස්ථාන පරික්ෂක මහතාගෙන් මහතාට රථවාහන නිති වෙනස් වෙනවා. අපි අම්බලන්ගොඩ නගර සභාව නිත්‍යානු කුල ආයතනය. සම්පූර්ණ නිති කඩලා තිබෙන්නේ. අම්බලන්ගොඩ නගර සභාවේ ඔබතුමා නිතිඥ මහත්මයෙක්. වාහන ගමන් කිරිමට පමණක් කියා පාරවල් කියක් තිබෙනවාද අපි ගැසට් කරලා. අපි පොලිසියේ අවශ්‍යතාවයට ඇහේ හයියෙන් මේවා කියක් වෙනස් කර තිබෙනවද? මෙය විශාල ප්‍රශ්නයක්. ඊළඟට මේ ත්‍රිරෝද කමිටුවේ සංයුතියත් වෙනස් . මෙහි නිත්‍යානුකුලව ඒ සංයුතිය කැඳවා නිත්‍යානුකුලව මේ ත්‍රි රෝද කමිටුව කැඳවා නිලධාරින්ට මෙහි වගකීම භාර දෙන්න. නිලධාරින් විසින් කළ යුතු දේ අපි මන්ත්‍රිවරුන් විසින් කළ යුතුව නැහැ. මන්ත්‍රිවරු මේ සභාවේදි නිලධාරින්ගෙන් අහන්න විතරයි තිබෙන්නේ. මෙකට හේතු ඉදිරිපත් කරන්න. එතකොට නිලධාරින් මේ කියන හේතු ඉදිරිපත් කරයි. ඒ අයට තිබෙන අපහසුතා. මා එම නිලධාරින්ට තිබෙන අපහසුතා මග හරවා ගතහැකි. ඇයි අපි නිලධාරින්ගේ

රැකියාව කරන්න යන්නේ. අපි මන්ත්‍රීවරු. අපි ඉන්නේ එතැන නෙමෙයි. අපිට අයිති රාජකාරියක් නෙමේ එය. නගර සභාවේ ඔබතුමාගේ බලය ලත් නිලධාරියෙක් සිටිනවා හැම කටයුක්තකටම. ඒ අදාල නිලධාරියා එයට වගකිව යුතුයි. එක වෙන්නේ නැති එකයි මේ ප්‍රශ්නය. නිලධාරින්ට කර අරින්න බැහැ. මේක නැහැ මෙක නැහැ කියා. එමනිසා සභාවට ඉදිරිපත් කරන්න ඕන. මෙහි නිත්‍යානුකූල තත්ත්වයක නැහැ. එහෙම නැතිනම් මෙය ක්‍රියාත්මක කරන්න. හෙට දවසේ කවුරු මේ කමිටුවේ සිටියත් සභාපතිත්වය දැරුවත් ඉතාම දුෂ්කර කාර්යක්. ඉතිං කිවුවා වගේ මෙය අයාලේ යන්න දෙන්නත් එපා. කමිටුවේත් වැදගත් කමක් තිබෙනවා. මොකද මෙහෙමවත් පාලනයක් නැතිනම් මේ නගරයේ පාලනය කිරිම තවත් දුෂ්කර වෙනවා. එමනිසා මේ සියළු කටයුතු සොයා බලා මෙකට නිලධාරිනුත් දැනුවත් කරලා ඔබතුමා නිලධාරින්ගෙන් සම්පූර්ණ වාර්තාවක් අරගෙන ඒ අයට තිබෙන බාධක මොනවාද ? මේ ත්‍රි රෝද රථ පාලනය කිරිමේදි මේ අයට තිබෙන බාධක මොනවාද? අපිට සභාවේ අනුමැතියෙන් දෙන්න පුළුවන්නම් එය මේ සභාවේ අවර්ණ අනුමැතියට යටත්ව දෙන්න පුළුවන්. මේ ඉල්ලන්නත් කලින් මේ සියළු දේවල් ලබා දෙන්න නිත්‍යානුකූලව. එහෙමයි මෙය විය යුත්තේ කියා මා විශ්වාස කරන්නේ. ඒ අනුව මා ඉල්ලා සිටිනවා ගරු උප සභාපතිතුමාට මෙය මේ කරගෙන ආ ආකාරයෙන් කරගෙන යන්න කියා. පුළුවන්තරම් නිත්‍යානුකූල කර දෙන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මා අපේ ගරු උප සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා ත්‍රි රෝද කමිටුවේ සභිපතිත්වය මෙය ආරම්භක දිනයේම පවසා එතුමා ඒ වගකීම භාර ගෙන මේ කටයුතු අද දක්වා සිදු කිරිම. මා ඉල්ලා සිටිනවා ඔබතුමා මේ කටයුක්ත කරගෙන යන්න කියා. ඔබතුමාට මා මෙය භාර දෙන දිනයේ ඇයි මා මෙය භාර දෙන්නේ කියා ඔබතුමාට මා පෞද්ගලිකව කිවුවා. ඉතිං ඒ අතහැරිම තුළ සිද්ධ වෙන්නේ නැවතත් මෙයට ගොදුරු වීම. අපි එතුමාට ඒ බලතල ලබා දි තිබෙන්නේ. එහෙම යම්කිසි ආකාරයකින් අඩපණ වුවහොත් අපේ විරොධාර එඩිතර කාන්තාවක් විදියට නිලානි මන්ත්‍රිතුමිය සභාපතිත්වයට පත් කිරිම සුදුසුයි කියා මා යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රි දිනයාදූර මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.එම් නිලානි මෙනවිය කතා කරමින්**</u>

මට එපා . ආණ්ඩු පක්ෂයම ගන්න.

**තීරණය**

2020.09.11 දින පැවති රථවාහන හා ත්‍රිරෝද රථ කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත වූ අතර රථවාහන හා ත්‍රිරෝද රථ කමිටුවෙන් ගරු උප සභාපති කමල් වැල්ලගේ මහත ඉවත් වන බව දැන්විය.

## 07

**07.01 ටෙන්ඩර්**

**07.02 මිළ ගණන්**

**07.02.01 252-0730 අංක දරණ කැබ් රථයට ඔයිල් කූලර් එකක් මිලදී ගැනීම සඳහා , මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | SR Motor Colombo | Dahanayaka Motors Colombo | Resent Motors Colombo |
|---|---|---|---|---|---|
| 01 | Oil Cooler | 01 | 89900/= | 87500/= | 90700/= |

**තීරණය:-**

252-0730 අංක දරණ කැබ් රථයට ඔයිල් කූලර් එකක් මිලදී ගැනීම සඳහා , මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති කොළඹ 10, දහනායක මෝටර්ස් හි මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.02 ලිපි ද්‍රව්‍ය මුද්‍රණය කිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සුමුදු ප්‍රින්ටර්ස් අම්බලන්ගොඩ | සක්වා ප්‍රින්ටර්ස් අම්බලන්ගොඩ | ඩී.ආර්. ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | මුදල් භාර ගැනීමේ කුවිතාන්සිය( (ස.ස. 03) | 75 | 338/= | 323/= | 345/= |

**තීරණය:-**

ලිපි ද්‍රව්‍ය මුද්‍රණය කිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අම්බලන්ගොඩ, සක්වා ප්‍රින්ටර්ස් ආයතනයේ මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.03 මහජන ක්‍රීඩාංගනයට අවශ්‍ය ක්ලේ මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිළ ගණන්**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ලක්මාලි ට්‍රාස්ස්පේට් සර්විස් |
|---|---|---|---|
| 01 | ක්ලේ කවර | 50 | 800/= |

**තීරණය:-**

මහජන ක්‍රීඩාංගනයට අවශ්‍ය ක්ලේ මිලදී ගැනීම සඳහා ලංකාවේ එකම නියෝජිත ආයතනය වන මාලබේ ලක්මාලි ට්‍රාන්ස්පෝට් සර්විස් ආයතනයේ මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.04 සෞඛ්‍ය අංශයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් ඉදිරිපත්**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | සි/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නිතිගත සංස්ථාව - මාතර |
|---|---|---|
| 01 | බූට්ස් | 2900/= |
| 02 | ඔක්සිපියුරා මාක්ස් | 2000/= |
| 03 | සවල් | 620/= |
| 04 | රබර් ග්ලවුස් | 365/= |
| 05 | විල් බැරෝ | 3795/= |
| 06 | හෙල්මට් ( හිස් ආවරණ ) | 550/= |

**තීරණය:-**

සෞඛ්‍ය අංශයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇත්තේ සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව පමණක් බැවින් එම ආයතනයේ මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**08** ගෙවීම්

**08:01 කා.නි.අංක 0534 යටතේ හල්වතුර කසල අංගනයට පස් කියුබ් 98 ක් සැපයීම වෙනුවෙන් අම්බලන්ගොඩ, එපිටමුල්ල පාර, පී.එච්.සී. ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෝ හි පී.එච්.සී.සී.ද සිල්වා මහතා හට රු.284200/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි සභා අනුමැතියට යටත්ව ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**08:02 කා.නි.අංක 0535 යටතේ හල්වතුර කසල අංගනයේ පස් තුනීකිරීම වෙනුවෙන් අම්බලන්ගොඩ, එපිටමුල්ල පාර, පී.එච්.සී. ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෝ හි පී.එච්.සී.සී.ද සිල්වා මහතා හට රු.264000/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි සභා අනුමැතියට යටත්ව ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**08:03 සෞඛ්‍ය අංශයට සනීපාරක්ෂක ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ලබාගත් රු.20,000/- ක අත්තිකාරම් මුදල ලේකම්ගේ නිර්දේශය පරිදි පියවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**08:04 ඇණවුම් අංක 2499 යටතේ ඇණවුම් කරන ලද එන්ජින් ඔයිල් බැරල් 01 ක් ලබාගැනීම සඳහා සී/ස.අම්බලන්ගොඩ විවිධ සේවා සමූපකාර සමිතිය වෙත රු.78200/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**08.05 රෙදි යොදා නගර සභා ලාංජනය මුද්‍රණය කර සුදු කොඩි 60 ක් මැසීම වෙනුවෙන් රු.31800/- ක් ගාල්ල, විරංග ටෙක්ස් ඇන්ඩ් ටේලර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු**

නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**08.06** අංක **2506** යටතේ ඇණවුම් කරන ලද විදුලි උපකරණ වෙනුවෙන් රු.**126750/-** ක් වානක එන්ටර්ප්‍රයිසස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**08:07** ඇණවුම් අංක **2497** යටතේ ඇණවුම් කරන ලද මුහුදු වැලි කියුබ් **10** ක් වෙනුවෙන් රු.**52000/-** ක් විජේසිංහ ලංකා හෝල්ඩින් ප්‍රයිවට් ලිමිටඩ් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**08.08** ඇණවුම් අංක **2508** හා **2509** යටතේ ඇණවුම් කරන ලද ගර්භණී මාතාවන්ට අවශ්‍ය භාණ්ඩ වෙනුවෙන් රු.**310575/-** ක් අම්බලන්ගොඩ සිහිති සළු ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**08.09** මහ අම්බලන්ගොඩ, තුඩුවමුල්ල නාන තොටුපල ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු.**161614.99** ක් පෝරඹ ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**08.10** පනියන්දූව අතුරු මාර්ගයේ කාණු පද්ධතිය හා බෝක්කුව(සංශෝධිත) ඉදිකිරීම වෙනුවෙන් රු.**170215.90** ක් කළුවඩුමුල්ල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට **2020.08.11** දින මාසික සභා රැස්වීමේදී තීරණ අංක **08.25** යටතේ තීරණය වුවද එම ගෙවීමෙහි වෙනසක් ඇති බැවින් එය රු.**170437.80** ක් ලෙස සංශෝධනය කර ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**08.11** අම්බලන්ගොඩ නගර සභාවෙ ගරු නාගරික මන්ත්‍රීවරුන්ගේ **2020** සැප්තැම්බර් මස ගමන් වියදම් ලෙස රු.**162,000/-** ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.12** ගලි ලෝඩ් **25** ක් සඳහා සේවාදායකයින්ගෙන් ලබාගත් රු.**24300/-** ක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු

**බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**08.13** **අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ නැරඹුම් ආසන ඉදිකිරීමේ (අදියර 01) කර්මාන්තයේ රඳවුම් මුදල වන රු.104,919.48 ක් පටබැඳිමුල්ල ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**08.14** **අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ නැරඹුම් වේදිකාව ඉදිකිරීමේ කර්මාන්තයේ රඳවුම් මුදල වන රු.139,433.37 ක් ඕකන්ද ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

## 09 ගිණුම්

**09.01 2020 අගෝස්තු මසට අදාළ පොදු වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය හා ලැබීම් විග්‍රහය සභාගත කරන ලදී.**

**තීරණය**

2020 අගෝස්තු මසට අදාළ පොදු වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය හා ලැබීම් විග්‍රහය පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

## 10 ඇස්තමේන්තු

**10.01 පැරණි පටබැඳිමුල්ල ආයුර්වේද ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සඳහා රු.2,000,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පැරණි පටබැදිමුල්ල ආයුර්වේද ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සඳහා රු.2,000,000/- ක ඇස්තමේන්තුව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.ජී.ආර්. පේෂලා කුමාරි මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය-**

පැරණි පටබැදිමුල්ල ආයුර්වේද ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සඳහා රු.2,000,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ජී.ජී.ආර්.පේෂලා කුමාරි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.02 මෝනක මහතාගේ නිවස අසල අසල පාර අග කොටස කොන්ක්‍රීට් කිරීම සඳහා රු.250,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෝනක මහතාගේ නිවස අසල අසල පාර අග කොටස කොන්ක්‍රීට් කිරීම සඳහා රු.250,000/- ක ඇස්තමේන්තුව යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය-**

මෝනක මහතාගේ නිවස අසල අසල පාර අග කොටස කොන්ක්‍රීට් කිරීම සඳහා රු.250,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.03 කුලරත්න පාර අසළ මාර්ගය ගල් අතුරා සංවර්ධනය කිරීම (අදියර 01) සඳහා රු.1,500,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කුලරත්න පාර අසළ මාර්ගය ගල් අතුරා සංවර්ධනය කිරීම (අදියර 01) සඳහා රු.1,500,000/- ක ඇස්තමේන්තුව යෝජනා කරනවා.

ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය-**

කුලරත්න පාර අසළ මාර්ගය ගල් අතුරා සංවර්ධනය කිරීම (අදියර 01) සඳහා රු.1,500,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.04 තල්ගස්ගොඩ අශෝක උයන පාරට ඇතුල්වන මාර්ගයේ හරස් කාණුව ඉදිකිරීම සඳහා රු.250,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

තල්ගස්ගොඩ අශෝක උයන පාරට ඇතුල්වන මාර්ගයේ හරස් කාණුව ඉදිකිරීම සඳහා රු.250,000/- ක ඇස්තමේන්තුව යෝජනා කරනවා.

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය-**

තල්ගස්ගොඩ අශෝක උයන පාරට ඇතුල්වන මාර්ගයේ හරස් කාණුව ඉදිකිරීම සඳහා රු.250,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.05 නගර සභා පැරණි බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය අසල පොළොව කොටසක් කොන්ක්‍රීට් යොදා සැකසීම සඳහා රු.20,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

නගර සභා පැරණි බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය අසල පොළොව කොටසක් කොන්ක්‍රීට් යොදා සැකසීම සඳහා රු.20,000/- ක ඇස්තමේන්තුව යෝජනා කරනවා.

ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය-**

නගර සභා පැරණි බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය අසල පොළොව කොටසක් කොන්ක්‍රීට් යොදා සැකසීම සඳහා රු.20,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 10.06 සංසරාජ පාර කාණුව සංවර්ධනය කිරීම සඳහා රු.650,000/- ක ඇස්තමේන්තුව ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

සංසරාජ පාර කාණුව සංවර්ධනය කිරීම සඳහා රු.650,000/- ක ඇස්තමේන්තුව ඇස්තමේන්තුව යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය-**

සංසරාජ පාර කාණුව සංවර්ධනය කිරීම සඳහා රු.650,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 10.07 දෙවට පළමු හරස් පාර කාණුව ඉදිකිරීම සඳහා රු.300,000/- ක ඇස්තමේන්තුව ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

දෙවට පළමු හරස් පාර කාණුව ඉදිකිරීම සඳහා රු.300,000/- ක ඇස්තමේන්තුව යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය-**

දෙවට පළමු හරස් පාර කාණුව ඉදිකිරීම සඳහා රු.300,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.08 සිරිනිකේතාරාම පාර කාණුව ඉදිකිරීම (RHS) සඳහා රු.220,000/- ක ඇස්තමේන්තුව ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සිරිනිකේතාරාම පාර කාණුව ඉදිකිරීම (RHS) සඳහා රු.220,000/- ක ඇස්තමේන්තුව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය-**

සිරිනිකේතාරාම පාර කාණුව ඉදිකිරීම (RHS) සඳහා රු.220,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.09 පල්ලෙතොට පාර කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා රු.,1,400,000/- ක ඇස්තමේන්තුව ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පල්ලෙතොට පාර කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා රු.,1,400,000/- ක ඇස්තමේන්තුව යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය-**

පල්ලෙතොට පාර කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා රු.,1,400,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.10 වරාය භූමිය තුළ අභ්‍යන්තර කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා රු.900,000/- ක ඇස්තමේන්තුව ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වරාය භූමිය තුළ අභ්‍යන්තර කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා රු.900,000/- ක ඇස්තමේන්තුව යෝජනා කරනවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය-**

වරාය භූමිය තුළ අභ්‍යන්තර කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා රු.900,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 10.11 කරිත්තකන්ද සුනිල් මහතාගේ නිවස අසල ඇති කාණුවට කොන්ක්‍රීට් ස්ලැබ් යෙදීම සඳහා රු.100,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

කරිත්තකන්ද සුනිල් මහතාගේ නිවස අසල ඇති කාණුවට කොන්ක්‍රීට් ස්ලැබ් යෙදීම සඳහා රු.100,000/- ක ඇස්තමේන්තුව යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය-**

කරිත්තකන්ද සුනිල් මහතාගේ නිවස අසල ඇති කාණුවට කොන්ක්‍රීට් ස්ලැබ් යෙදීම සඳහා රු.100,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 10.12 මහජන ක්‍රීඩාංගනයේ ලංකා බැංකුව අසළ නැරඹුම් වේදිකාවට සකසන වහලය සඳහා කොන්ක්‍රීට් කාණු ඉදිකිරීම සඳහා රු.750,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මහජන ක්‍රීඩාංගනයේ ලංකා බැංකුව අසළ නැරඹුම් වේදිකාවට සකසන වහලය සඳහා කොන්ක්‍රීට් කාණු ඉදිකිරීම සඳහා රු.750,000/- ක ඇස්තමේන්තුව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය-**

මහජන ක්‍රීඩාංගනයේ ලංකා බැංකුව අසළ නැරඹුම් වේදිකාවට සකසන වහලය සඳහා කොන්ක්‍රීට් කාණු ඉදිකිරීම සඳහා රු.750,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 10.13 නිව්යෝර්ක් ගම්මානය පහළ මාර්ගයේ කාණු කොටසක් ඉදිකිරීම (සංශෝධිත) සඳහා රු.200,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නිව්යෝර්ක් ගම්මානය පහළ මාර්ගයේ කාණු කොටසක් ඉදිකිරීම (සංශෝධිත) සඳහා රු.200,000/- ක ඇස්තමේන්තුව යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය-**

නිව්යෝර්ක් ගම්මානය පහළ මාර්ගයේ කාණු කොටසක් ඉදිකිරීම (සංශෝධිත) සඳහා රු.200,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 10.14 ඇට්ලස් පාර හරස් කාණුව ඉදිකිරීම සඳහා රු.80,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඇට්ලස් පාර හරස් කාණුව ඉදිකිරීම සඳහා රු.80,000/- ක ඇස්තමේන්තුව රු.200,000/- ක ඇස්තමේන්තුව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය-**

ඇට්ලස් පාර හරස් කාණුව ඉදිකිරීම සඳහා රු.80,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.15 අම්බලන්ගොඩ නගර සභාව මගින් කාන්තා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.53,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභාව මගින් කාන්තා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.53,000/- ක ඇස්තමේන්තුව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභාව මගින් කාන්තා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.53,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.16** අම්බලන්ගොඩ නගර සීමාවේ සේවා නියුක්ත කාන්තාවන් සඳහා සුව නාරි සායනයක් පැවැත්වීම සඳහා රු.20,000/- ක **ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සීමාවේ සේවා නියුක්ත කාන්තාවන් සඳහා සුව නාරි සායනයක් පැවැත්වීම සඳහා රු.20,000/- ක ඇස්තමේන්තුව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සීමාවේ සේවා නියුක්ත කාන්තාවන් සඳහා සුව නාරි සායනයක් පැවැත්වීම සඳහා රු.20,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

11 වෙනත් කරුණු

12 න්‍යාය පත්‍රයට ඇතුළත් නොවූ කරුණු

**12.01 2020 ජූලි මස පැවති මාසික සභාවේ තීරණ අංක 12.03 අනුව 2020 නව ජීවන ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020 ජූලි මස පැවති මාසික සභාවේ තීරණ අංක 12.03 අනුව 2020 නව ජීවන ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීම. මේ යටතේ ප්‍රජා මණ්ඩල ගිණුම් වලින් මුදල් නිදහස් කිරීම. කරිත්තකන්ද ප්‍රජා මණ්ඩලය රු.6400.00, හෙප්පුමුල්ල ප්‍රජා මණ්ඩලය රු.2000.00 , පනියන්දූව ප්‍රජා මණ්ඩලය රු.1000, කෙරමිණිය ප්‍රජා මණ්ඩලය රු.10720.00, මහ අම්බලන්ගොඩ ප්‍රජා මණ්ඩලය 10000.00 ක් වශයෙන් ගෙවීමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේවාට යොදවන්න කවුරු හරි

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒවාට යොදවලා තිබෙන්නේ. ඒවාට ඉන්නවා අපේ නිලධාරින්

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

තල්ගස්ගොඩට නැද්ද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ ඉල්ලපු හැටියට.

**තීරණය-**

2020 ජූලි මස පැවති මාසික සභාවේ තීරණ අංක 12.03 අනුව 2020 නව ජීවන ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් පරිදි ප්‍රජා මණ්ඩල ගිණුම්වලින් මුදල් නිදහස් කිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ

යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**12.02 2020 ජූලි මස පැවති මාසික සභාවේ තීරණ අංක 12.03 අනුව 2020 නව ජීවන ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පොල්වත්ත ප්‍රජා මණ්ඩලයෙන් රු.10,000/- ක මුදලක් නිදහස් කිරීමට අනුමැතිය ලබාදීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

2020 ජූලි මස පැවති මාසික සභාවේ තීරණ අංක 12.03 අනුව 2020 නව ජීවන ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පොල්වත්ත ප්‍රජා මණ්ඩලයෙන් රු.10,000/- ක මුදලක් නිදහස් කිරීමට අනුමැතිය ඉල්ලා තිබෙනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය-**

2020 ජූලි මස පැවති මාසික සභාවේ තීරණ අංක 12.03 අනුව 2020 නව ජීවන ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පොල්වත්ත ප්‍රජා මණ්ඩලයෙන් රු.10,000/- ක මුදලක් නිදහස් කිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**12.03 කඩකාමර ගිවිසුම් අත්සන් කිරීමේදී මාස 03ක කඩ කුලිය ආරක්ෂිත ඇප තැන්පතුව සම්බන්ධ ලිපි ගොණුව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කඩ කාමර ගිවිසුම් අත්සන් කිරීමේදී මාස 03 ක කඩ කුලිය ආරක්ෂිත ඇප තැන්පතුව ලෙස ලබාගත යුතු වුවත් කොරෝනා වසංගත තත්ත්වය යටතේ මතුව ඇති ගැටලු හේතුවෙන් ගිවිසුම් යාවත්කාලීන කිරීමේදී ආරක්ෂිත ඇප තැන්පතුව ලෙස ලබාගත යුතු මුදලින් තුනෙන් එකක ප්‍රමාණයක් අයකර ගැනීමටත් ඉතිරි මුදල අයකර ගැනීම සඳහා මාස 06 ක සහන කාලයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මෙහි කලිනුත් තක්සේරු වැඩි කරන්න ගිහිල්ලා ගරු සභාපතිතුමා ගරු ආණ්ඩුකාරතුමා ළඟට එන්න කියා කැඳවා තක්සේරුව අඩු කරලා ප්‍රශ්නයක් ඇති වුණා. ආපහු මෙය පළාත් පාලන කොමසාරිස්තුමානේ ඉදිරිපත් කර තිබෙන්නේ. මට කියන්න කලින් තක්සේරුවට වඩා අඩුවෙලා ද ? වැඩිවෙලාද ? කියා. තක්සේරුවක් අපි දුන්නානේ. ඒගොල්ලන් විරෝධතාවය ප්‍රකාශ කරලා අපි ආණ්ඩුකාරතුමා ළඟට ගියා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පොඩි ප්‍රමාණයක් අඩුවෙලා තිබුණා. දැන් සභාවට දමා තිබෙන්නේ එක. ගියපාර සභාවේ අනුමැතියට දැම්මා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එක තමයි එය හරියටම කියන්න බැරිද ? කලින් තිබුණ ගණනට වඩා වැඩි වුණාද අඩු වුණාද කියා. ඊට අමතරව තමයි ඔය ආරක්ෂිත තැන්පතුව ගන්න කියන්නේ. මා හිතන්නේ නැහැ දිගින් දිගටම මේ තිබෙන වතාවරණයත් එක්ක ව්‍යාපාරිකයන්ගෙන් මේවා අයකර ගන්න කියන එක. එහෙම යන්න යනන් අපිට තමයි දොස් අහන්න වෙන්නේ මිනිසුන්ගෙන්. බැණුම් අහන්න වෙන්නේ. ඒ අනුව ඔබතුමලාගේ රාජ කාරිය අනුව නිතිය ක්‍රියාත්මක කරන්න. ගන්න පුළුවන් නම් මාසයකට . එතකොට පොඩි ගණනක් නේ ද එන්නේ. එහෙමනම් ඔබතුමිලා යෝජනා කළ ආකාරයට මාසේ ගණනේ ගන්න. දිගින් දිගටම ආයෙත් ප්‍රශ්නයක් ඇතිවෙයි. ගරු ආණ්ඩුකාරතුමා ළඟට ගිහින් ගැටළුවකට එනවාට වඩා . ඊට අමතරව මා පොඩි දෙයකට කතා කරන්න හිටියේ. විශේෂයෙන්ම දැන් දුරකථන විකුණන කඩවලට විදුලි සංදේශ කොමිෂන් සභාවේ අවසරය නැතුව කිසිම දුරකථනයක් වත් බැටරියක්වත් විකුණන්න බැරි තත්ත්වයක් අද උදා වෙලා තිබෙන්නේ. එය මා හිතන්නේ හොඳ වැඩක් . හොඳ ක්‍රියා මාර්ගයක් රජය ගත්ත. හැබැයි එහෙම වුණාම මේ ව්‍යාපාරික අයට ගන්න බැරි තත්ත්වයක් උදාවෙලා තිබෙනවා. ඒ අය මේ කඩවල බද්දට ඉන්නේ. දැන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ලිඛිතව ඉල්ලනවා ව්‍යාපාරයක් කරනවා ද කියා. ඒ ලිපිය දෙන්න බැහැ කියන මතයේ තමයි සභාව ඉන්නවා කියන්නේ. එතකොට අර ලියා පදිංචිය අර පුද්ගලයාට ලබා ගන්න බැරි වෙනවා. එයට අපිට ගන්න පුළුවන් ක්‍රියා මාර්ගය මොකක් ද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මට නම් තවම ආවේ නැහැ ඔහොම ප්‍රශ්නයක්.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මා හිතන්නේ ලේකම්තුමිය ආවො නේද එහෙම ප්‍රශ්නයක්. දැන් අපි දැනටත් බස්නැවතුම්පොළ ගත්තොත් එහෙම දැනටත් තිබෙනවා දූරකථන විකුණනු ලබන කඩ පහක් විතර. ඒ වගේම ව්‍යාපාර ලියා පදිංචිය නැති අය ඉන්නවා. ප්‍රාදේශිය ලේකම් එකෙන් එය ගන්න ගියාම නගර සභාවෙන් ලිපියක් ගෙන්න කියනවාලු. මේ ව්‍යාපාරය කරනවාද කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි බලන්නම් එය එන හැටියට.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මෙහෙන් ව්‍යාපාර ලියා පදිංචිය දෙන්න බැහැ කිවුවාම අරහෙන් එක ගන්න එක ඒ අයට ගැටළුවක්. ගරු මන්ත්‍රිතුමා මොකක් හරි සහනයක් ලබා දෙන්න වෙනවා. ඒ අය නගරයේ ව්‍යාපාරිකයන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙහෙම දෙයක් තිබෙනවා. ඒ අය අපේ ලියාපදිංචි කඩ සාප්පු හිමියන් නොවේද දන්නේ නැහැ. එහෙම නොවුණොත් ප්‍රශ්නයක්. එතකොට අපිට දෙන්න බැහැ. එහෙම දෙයකට දෙන්න බැහැ. එතකොට කරන්න පුළුවන් බද්ද අහෝසි කිරිම. එකට අපි විසඳුමක් ලබන පාර ගෙනෙනවා. මා සාකච්ඡා කර තිබෙනවා. මා විස්තර කරන්නම් මන්ත්‍රිවරුන්ට. එම ඉල්ලිම ලබා දිමට අපි එකඟයි.

**තීරණය-**

කඩ කාමර ගිවිසුම් අත්සන් කිරීමේදී මාස 03 ක කඩ කුලිය ආරක්ෂිත ඇප තැන්පතුව ලෙස ලබාගත යුතු වුවත් කොරෝනා වසංගත තත්ත්වය යටතේ මතුව ඇති ගැටලු හේතුවෙන් ගිවිසුම් යාවත්කාලීන කිරීමේදී ආරක්ෂිත ඇප තැන්පතුව ලෙස ලබාගත යුතු මුදලින් තුනෙන් එකක ප්‍රමාණයක් අයකර ගැනීමටත් ඉතිරි මුදල අයකර ගැනීම සඳහා මාස 06 ක සහන කාලයක් ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**12.04 අම්බලන්ගොඩ කළුවඩුමුල්ල ග්‍රාමීය විද්‍යාල ක්‍රීඩාංගනය තුල කණු සිටුවා ක්‍රීඩාංගනය විදුලි ආලෝකනය කිරීම සහ හල්වතුර ළමා ක්‍රීඩාංගනය විදුලි ආලෝකනය කිරීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ කළුවඩුමුල්ල ග්‍රාමීය විද්‍යාල ක්‍රීඩාංගනය තුල කණු සිටුවා ක්‍රීඩාංගනය විදුලි ආලෝකනය කිරීම අනුමැතිය ඉල්ලා සිටිනවා. ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙකට අදාල නිසා මා මේ කතා කරන්නේ. අපිට විදුලි කණු 4ක් උවමනා වෙනවා. මා අර ඔබතුමාටත් කිවුවේ. එය ඇණවුම් කරන කොට මේ විදුලි කණු 4ක් එක්ක ඇණවුම් කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එතැන විදුලිය ගැනිමත් එක්කම කරන්න වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

නැහැ එයට විදුලිය තිබෙනවා. කණු 4 විතරක් ගන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

විදුලිය ගන්න වෙනවා. කණු 4 ගත්තාත් .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ඉස්සෙල්ලා කණු ඉන්දන එකනේ. මෙයට කණු 4ක් ගෙන්වන්න කියන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙයට විවෘත කරන ලද හල්වතුර ළමා ක්‍රීඩාංගණයත් ඇතුළත් කරන්න.

**තීරණය-**

අම්බලන්ගොඩ කළුවඩුමුල්ල ග්‍රාමීය විද්‍යාල ක්‍රීඩාංගනය තුල කණු සිටුවා ක්‍රීඩාංගනය විදුලි ආලෝකනය කිරීම සහ හල්වතුර ළමා ක්‍රීඩාංගනය විදුලි ආලෝකනය කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**12.05 අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ පොලිස් මුරපොළ පැවති කොටසේ යාබද කාමරය සභාවේ අනුග්‍රහය මත ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ වෙළඳ හා කර්මාන්ත මණ්ඩලය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ පොලිස් මුරපොළ පැවති කොටසේ යාබද කාමරය සභාවේ අනුග්‍රහය මත ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ වෙළඳ හා කර්මාන්ත මණ්ඩලය විසින් ඉල්ලීමක් කර තිබෙනවා. ඒ අය බස්නැවතුම්පොළේ ඉහළ මාලයේ තිබෙන පොලිස් මුර පොළේ කාමරයක් ඉල්ලනවා. පොලිස් මුර පොළට දුන්නොත් ප්‍රශ්නයක් වෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, ඒ අය ඉල්ලන්නේ එක කොටසක්. පොලිස් මුර පොළත් පවත්වාගෙන යන්න පුළුවන්.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙය බලා අපිට ආදායම් පරික්ෂක වාර්තාවක් ලබා දෙන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව කළේ වෙළඳ සංගමයේදි . ඇත්තටම අම්බලන්ගොඩ වෙළඳ හා කර්මාන්ත මණ්ඩලය කියා පිහිටුවා ගෙන මෙය මුලින් සාර්ථකව කරගෙන යනවා. මේ වෙළඳ සංගම් තිබෙනවා. එහෙම විසිරලා යනවා. එහෙම බැලුවොත් එහෙම මේ අයට දෙන්න තිබෙන අවස්ථාවක් ලබා දි තිබෙන්නේ. වෙන නගර හා බැලුවාම මේ වෙළඳ හා කර්මාන්ත මණ්ඩල ඉතා හොඳින් තිබෙනවා. ඔවුන් ස්ව උත්සාහයෙන් නැගී සිටින්නේ. නගර සභා ඔවුන්ට අවශ්‍ය කඩ එහෙම ලබා දි තිබෙන්නේ. ඔබතුමලාට දැන ගන්න පුළුවන් ඒ නගර සභා ප්‍රා දේශිය සභා ඒ වෙළඳ සහ කර්මාන්ත මණ්ඩල සඳහා වෙන්කරලා. මෙය එයට මූලික දෙයක් විතරයි. ඔනම දෙයක් පවතින්න එයට ස්ථානයක් තිබෙන්න ඕන. මෙතනදි අපි දැන් වසර ගණනාවක් තිස්සේ

මේ පොලිස් මුර පොළ වසා දමා තිබෙන්නේ. එය වල් බිහිවෙලා තිබෙන්නේ. පොලිස් මුරපොළ නමට විතරයි. දැන් මෙය අවුරුදු 10කට වැඩි කාලයක් වසා දමා තිබෙන්නේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අපි මෙය දෙන්න එකඟයි. ආදායම් පරීක්ෂක මහතා මෙයට වාර්තාවක් දෙන්න. මොකක්ද කියා මට වාර්තාවක් දෙන්න. ඊළඟ සභාවට දමන්න.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, දැන් කොහොමද කැමරා සවි කරන එක.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙතුමා කියපු විදියට බොහොම උජාරු වෙළඳ සංගමයක් නෙමේ. මෙකේ ලියලා තිබෙන විදියට හැමෝගෙන්ම මුදල් එකතු කරලා මේ වැඩය කරන්න යන්නේ. අපි ලක්ෂ 7ක් දෙන්නම් කිවුවාම එගොල්ලන් තමන්ගේ සාක්කුවෙන් රුපියල් 500ක් වියදම් කරන්නේ නැති වෙළඳ සංගමයක් ඉන්නේ. ඔය කියන වෙළඳුන්. සාක්කුවෙන් වියදම් කරන්නේ නැහැ. අනිත් පැත්තෙන් යන්නේ.

**තීරණය-**

අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ පොලිස් මුරපොළ පැවති කොටසේ යාබද කාමරය සභාවේ අනුග්‍රහය මත ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ වෙළඳ හා කර්මාන්ත මණ්ඩලය විසින් එවා ඇති ලිපිය අනුව ඒ සම්බන්ධව ආදායම් පරීක්ෂක වාර්තාවක් ලබාදෙන ලෙස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් දන්වන ලදී.

## 12.06 අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ ඉදිරිපිට භූමියේ ඇති ඩිජිටල් දැන්වීම් පුවරු සම්බන්ධ බදු ගිවිසුම් පත්‍රයේ කෙටුම්පත සභාගත කරන ලදී.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ ඉදිරිපිට භූමියේ ඇති ඩිජිටල් දැන්වීම් පුවරු සම්බන්ධ බදු ගිවිසුම් පත්‍රයේ කෙටුම්පත අනුමත කිරීම. මෙහි පිටපතක් සම්පූර්ණ මන්ත්‍රිවරුන්ට දෙන්න. මෙය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, දැන් මේ දැන්වීම් පුවරු කිවුවාම ඩිජිටල් ඒවා විතරට ද ගාස්තු අය කරන්නේ. හැම විදුලි කණුවකම ගසා තිබෙනවා. අපේ ගේ ඉදිරිපිටත් ගසා තිබෙනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අපි කපාගෙන එනවා. ගෙවලා නැති ඒවා කපාගෙන එනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

එහෙම මා නම් දැකලා නැහැ කවදාවත් කපාගෙන එනවා. අනිත් කාරණය තමයි අපිට දැන්වීමක් අලවන්න බෝඩ් එකක් හදා ඉල්ලුවා. ලක්ෂ කෝටි ගණන් ව්‍යාපෘති කරන්න යෝජනා කරනවා. මේ බෝඩ් ටික ගසා දෙන්නේ නැහැ. ඇයි ඒ. අපි පෝස්ටර් ටිකක් ගහයි කියලාද ? එහෙම කරන්න එපා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් ගහනවා පෝස්ටර්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ඔගොල්ලන් චිත්‍ර ඇන්දා තිබෙන තාප්ප ටිකේ. අපිට පොස්ටරයක් ගහන්න විදියක් නැහැ. අපේ හඩ නගන්න විදියක් නැහැ. තාප්පය ලස්සනයි. අපේ අයිතිය නැති වෙලා තිබෙනවා. කරුණාකරලා අපේ මේ දැන්වීම් පුවරුව සවි කර දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හා අපි සවිකර දෙන්නම්.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මේ දැන්වීම් පුවරු සම්බන්ධව කතා කරන්නේ. මෙය ඉතාමත් හොඳයි කතා කරන අවස්ථාව. මෙය සවිකරන්න ගියාම ඊට පස්සේ තමයි ගැටළුව ඇති වෙන්නේ. මේක සවි කරන්න ගියාම. මොකද මටත් ලසන්ත මන්ත්‍රීතුමාටත් දුරකථනයෙන් කතා කර කිවුවා. ප්‍රශ්න ඇති වෙන්නේ මොකක්ද කියා. ඒ වේලාවේත් ආවේ ඔබතුමා මේ කොටම්බා ගස කපන්න හදනවා කියා. වීඩියෝ කරලා මාධ්‍යයකට දමනවා කියන තත්ත්වයකට උදාවෙලා තිබෙන්නේ. දැන් මේ අද සභාවට ආවේ. මෙයට සුමාන දෙකකට කලින් තමයි මෙයට විරුද්ධව ක්‍රියාමාර්ග ගත්තේ. ත්‍රිවිල් රථ ගාලේ කට්ටිය. ඉතිං මා කියන්නේ මෙතැන රු.30000/= ක් හරි මාසයකට එනවා. මාසයට රු.30000/= නෙමේ දවසට රු.15000/= ගිය තැනක් ඕතන. මා කියන්නේ මේ ත්‍රිවිල් රථ ගාල ඔතනින් අයින් කරන්න කියා.

**තීරණය-**

අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ ඉදිරිපිට භූමියේ ඇති ඩිජිටල් දැන්වීම් පුවරු සම්බන්ධ බදු ගිවිසුම් පත්‍රයේ කෙටුම්පත අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**12.07 අම්බලන්ගොඩ නගර සභාවේ සේවයේ නියුතු තාක්ෂණ සේවා නිලධාරී මහතුන්ට , මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන්ට සහ වැඩ පරීක්ෂක මහතුන්ට SMART ජංගම දුරකථන ලබාදීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ක්ෂේත්‍ර නිලධාරින් සඳහා SMART ජංගම දූරකථන ලබාදීම සම්බන්ධව. උක්ත කරුණ පිළිබඳව අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමාගේ මෙහෙයවීම යටතේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා SMART ජංගම දූරකථන ලබාදීම පිළිබඳව අවධානය යොමුව ඇත. දියුණු වන වර්තමාන සමාජයේ අවශ්‍යතාවයන්ට අනුගත වෙමින් අප ආයතනයේ නිලධාරින් ද නවින තාක්ෂණික ක්‍රමෝපායයන්ට අනුගත කරවීම මෙහි අරමුණයි. වර්ථමාන සමාජයේ අවශ්‍යතාවයන් අනුව රාජ්‍ය ආයතන වලින් සේවා ලබා ගැනිමට පැමිණෙන සේවාලාභින්ට සිදුවන අපහසුතාවයන් මගහරවා ගනිමින් කඩිනම් සේවාවක් සැපයීම මෙහි අරමුණ වේ. මෙය ටිකක් දිග ලිපියක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

එය ලබා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එය ලබා දෙන්න තින්දු කරන්නේ වැඩ පරික්ෂකවරුන්ටයි, තාක්ෂණසේවා නිලධාරින් සහ මහජන සෞඛ පරික්ෂක මහත්වරුන්ට ලබා දෙන්න කටයුතු කරන්න. එතකොට අපේ තිබෙන ජංගම දූරකථනයෙන් ජායාරූපය ගත්තා. වැඩය කරන්න යැව්වා. මෙය අපේ තිබෙන ඉන්වෙන්ට්‍රියට දමන්න ඕන. භාණ්ඩ ගත කරලා දෙන්නේ. මා යෝජනා කරනවා එම නිලධාරින්ට ලබා දෙන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

එය ලබා දෙන්න කියා ස්ථිර කරනවා

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභාවේ සේවයේ නියුතු තාක්ෂණ සේවා නිලධාරී මහතුන්ට , මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන්ට සහ වැඩ පරීක්ෂක මහතුන්ට SMART ජංගම දූරකථන ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**12.08 අම්බලන්ගොඩ, ශ්‍රී විජයාරාම පාර, අංක 17/2 හි පදිංචි ජී.ඩබ්.චමරි තරංගා මහත්මියට නගර සභාවෙන් බදු කුලී පදනම මත ලබාදුන් පොදු වෙළඳපොලෙහි අංක 01 සහ 02 යන කඩකාමර සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පොදු වෙළඳපොලෙහි අංක 01 සහ 02 යන කඩකාමර දෙක අපි ලබා දි තිබෙනවා ගුස්තිඤ්ඤාවඩු චමරි තරංගා යන අයට . මේ අය කඩ කාමරය හිග තියා තිබෙනවා රු600799.28ක මුදලක්. මෙය සිල්කරන්න යනවිට මෙහි ඉන්නේ ඇත්තටම බි. ශ්‍රියානි කියන එක්කෙනෙක්. පටබැඳිමුල්ලේ. එයා තමයි ඉන්නේ. මා මේ සම්බන්ධව කතා කරන්න කාරක සභා බවට සභාව පත්කරනවා.

- **පස්වරු 12.30ට සභාව කාරක සභා අවස්ථාවට පත්කරන ලදී.**
- **පස්වරු 12.45 ට නැව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව ගන්න තින්දුව කුමක්ද?

**තීරණය-**

අම්බලන්ගොඩ, ශ්‍රී විජයාරාම පාර, අංක 17/2 හි පදිංචි ජී.ඩබ්.චමරි තරංගා මහත්මියට නගර සභාවෙන් බදු කුලී පදනම මත ලබාදුන් පොදු වෙළඳපොලෙහි අංක 01 සහ 02 යන කඩකාමර සම්බන්ධව අම්බලන්ගොඩ, පටබැදිමුල්ල පදිංචි බී.ශ්‍රියානි මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා සභාව කාරක සභා අවස්ථාවකට පත් කළ අතර එම ඉල්ලීම සම්බන්ධව තීරණයක් නොවූ බව ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් විසින් දන්වන ලදී .

**12.09 අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ මේස සෑදීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාදීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ අලුතින් මේස ඉදිකිරිම සම්බන්ධයෙන් ලී අවශ්‍ය වෙච්ච ලැයිස්තුව ඉදිරිපත් කර තිබෙනවා. එම ලැයිස්තුව ලබා ගැනීමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ මේස සෑදීම සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

01. 4Z-6˜«9˜«1 1$8˜ → 03«38 → 114 ලී පළ
02. 21/2Z«9˜«1 1$8˜ → 12«38 → 456 ලී පළ
03. 2Z «9˜«1 1$8˜ → 03«38 → 114 ලී පළ
04. 4Z-6˜«9˜«1˜ → 04«38 → 152 ලී පළ
05. 2Z «6˜«1˜ → 02«38 → 76 ලී පළ
06. 18˜«6˜«1˜ → 02«38 → 76 ලී පළ
07. 2Z«10˜« 4$8˜ → 02«38 → 76 ලී පළ
08. 24˜«10˜«1˜ → 02«38 → 76 ලී පළ
09. යකඩ ඇණ 2˜ → 750g
10. යකඩ ඇණ 1 1$2˜ → 250g

11.ඉපිපික්ස් ගම් → 4kg

12. වැලි කොල No 80 = 03 Nos

13. වැලි කොල No 20 = 02 Nos

14. වීදුරු → 3$8˜ ඝනකම/2Z උස ප්‍රමාණය → 03 Nos පළල 2 1$2˜

**12.10 අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් පැවැත්වීමට නියමිත මළල ක්‍රීඩා උළෙලට අදාල ක්‍රිකට් කණ්ඩායම් තරඟ 2020.10.03 දිනත් ක්‍රීඩා උළෙල 2020.10.18 දිනත් පැවැත්වීමට නියමිතව ඇති අතර එම දිනයන් සඳහා ඉල්ලීම පරිදි පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය නොමිලේ ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ යෞවන ක්‍රිඩා සමාජයේ ක්‍රිකට් තරඟ පැවැත්විමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් පවත්වනවා. එය ලබා දෙන්න.

**තීරණය-**

අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් පැවැත්වීමට නියමිත මළල ක්‍රීඩා උළෙලට අදාල ක්‍රිකට් කණ්ඩායම් තරඟ 2020.10.03 දිනත් ක්‍රීඩා උළෙල 2020.10.18 දිනත් පැවැත්වීමට නියමිතව ඇති අතර එම දිනයන් සඳහා ඉල්ලීම පරිදි පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය නොමිලේ ලබාදීමටත් කැනපි 03 ක් හා කොඩි කණු 15 ක් ද සභා අනුමැතියට යටත්ව නොමිලේ ලබාදීමටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් තීරණය කරන ලදි.

**12.11 අම්බලන්ගොඩ නගරය විෂබීජහරණය කිරීමට සහ ගිනි නිවීමේ කටයුත්තක් සඳහා ජාතික ජල සම්පාසන හා ජලාපවහන මණ්ඩලය මගින් 2020 මාර්තු, මැයි සහ ජුනි යන මාසයන්හිදී ලබාගත් ජල බවුසර් සඳහා කිසිඳු අයකිරීමක් නොකරන බවට දන්වා එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ජල බවුසරය ලබා ගැනීම සම්බන්ධව. 2020 මාර්තු , මැයි සහ ජුනි මාසයන් සඳහා විෂබිජහරණය සඳහා සහ ගිනි නිවීම ජල බවුසරය ලබා ගැනිමට ජල ස.මි. 103 ක් සඳහා කිසිඳු අයකිරිමක් නොකරන බව දන්වා ඇත. එයට ස්තුති කර ලිපියක් යවන්න.

**තීරණය-**

අම්බලන්ගොඩ නගරය විෂබීජහරණය කිරීමට සහ ගිනි නිවීමේ කටයුත්තක් සඳහා ජාතික ජල සම්පාසන හා ජලාපවහන මණ්ඩලය මගින් 2020 මාර්තු, මැයි සහ ජුනි යන මාසයන්හිදී ලබාගත් ජල බවුසර් සඳහා කිසිඳු අයකිරීමක් නොකරන බවට දන්වා එවා ඇති ලිපිය අනුව ඒ සම්බන්ධව ස්තූති කර ලිපියක් යවන ලෙස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් විසින් දන්වන ලදී.

**12.12 අම්බලන්ගොඩ නගර සභාව සතු ශබ්ද විකාශන යන්ත්‍රවල පවතින දෝෂයන් හේතුවෙන් ශබ්ද විකාශන උපාංග ලබාගැනීමට අනුමැතිය ලබාදීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නලින් චන්ද්‍රජිත් , පණිවුඩකරු , නගර සභාව , අම්බලන්ගොඩ සභාවට අවශ්‍ය ශබ්ද විකාශන යන්ත්‍ර ලබා ගැනීම. අප ආයතනය සතු අම්බලන්ගොඩ නගර සභාව සතු ශබ්ද විකාශන යන්ත්‍ර සහ බපල් ප්‍රමාණවත් නොවන නිසා ඒ සඳහා Double Top Speakers- 02, Multi Media Speaker-02, Amplifier 1500 w- 01.ලබා දෙන ලෙස ඉල්ලීමක් කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභාව සතු ශබ්ද විකාශන යන්ත්‍රවල පවතින දෝෂයන් හේතුවෙන් පහත සඳහන් ශබ්ද විකාශන උපාංග ලබාගැනීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

01. Double Top Speakers - 02
02. Multi Media Speaker - 02
03. Amplifier 1500 w - 01

**12.13 අම්බලන්ගොඩ නගර සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලෙහි වහල සඳහා සෙවිලි කර ඇති උළු කැට වෙනුවට අවම වසර 10 ක වගකීම් කාලයක් සහිත සෙවිලි තහඩු (Roofing Sheets) සවිකර වහල ප්‍රතිසංස්කරණය කිරීමට අනුමැතිය ලබාදීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

උඩ වහල වෙනස් කිරිම සඳහා තාක්ෂණසේවා නිලධාරි මහතා වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. මෙම ගොඩනැඟිල්ලේ අලුත්වැඩියා කටයුතු මේ වන විට සිදුකරමින් පවතී . එම ගොඩනැඟිල්ලෙහි අලුත්වැඩියා කටයුතු සිදු කිරිමේදි ගොඩනැඟිල්ලේ පාදම මත යොමුවන සාරය උපරිම ලෙස අවම කර ගැනීමට කටයුතු කිරිම සුදුසු බව ගොඩනැගිල්ලේ පෞරාණික භාවය හේතුවෙන් සුදුසු බව නිරීක්ෂණය වේ. ඒ බව ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය මඟින් මෙම ගොඩනැඟිල්ලට අදාලව ලබා දී ඇති වාර්තාවෙහිද දැක්වේ. ඒ අනුව එම ගොඩනැගිල්ලට වහලයෙහි දැනට පවතින සෙවිලි කර ඇති උළු කැට වෙනුවට බර අවම වන නව තාක්ෂණික ක්‍රමවේද යටතේ නිෂ්පාදිත සැහැල්ලු බරින් යුක්ත ශක්තිමත් බවින් යුක්ත බව පරික්ෂණ මගින් තහවුරු කර ඇති අවම වසර 10ක වගකීම් කාලයක් සහිත නවීන පන්නයේ සෙවිලි තහඩු ( Roofing Sheet ) සුදුසු ක්‍රමවේද යටතේ මිල ගණන් කැඳවා නගර සභා සේවකයින් මගින් සවි කිරිම සුදුසු බව යෝජනා කරමි. මෙම සැහැල්ලු ප්‍රමිතියානුකුල සෙවිලි තහඩු භාවිතා කර වහලය ප්‍රතිසංස්කරණය කිරිම සඳහා අනුමැතිය ලබා ගැනීම සුදුසු වේ. මේ අනුමැතිය ලබා දෙන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එය ලබා දෙන්න. සභාවේ සේවකයන් දැම්මොත් එහෙම තව මාස ගණනක් යාවි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
අපි බලන්නම්.
**තීරණය-**
අම්බලන්ගොඩ නගර සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලෙහි වහල සඳහා සෙවිලි කර ඇති උළු කැට වෙනුවට අවම වසර 10 ක වගකීම් කාලයක් සහිත සෙවිලි තහඩු (Roofing Sheets) සවිකර වහල ප්‍රතිසංස්කරණය කිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**12.14 අම්බලන්ගොඩ නගර සභා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා අසනීපයෙන් පසුවන බැවින් 2020.10.06 දින මාසික සභා රැස්වීමට පැමිණිය නොහැකි බව දන්වා නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලා එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා අසනීපයෙන් පසුවන බැවින් 2020.10.06 දින මාසික සභා රැස්වීමට පැමිණිය නොහැකි බව දන්වා නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලා ඇත. එය අනුමත කරනවා.

**තීරණය-**
අම්බලන්ගොඩ නගර සභා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා අසනීපයෙන් පසුවන බැවින් 2020.10.06 දින මාසික සභා රැස්වීමට පැමිණිය නොහැකි බව දන්වා නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලා එවා ඇති ලිපිය අනුව නිවාඩු අනුමත කිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් තීරණය කරන ලදී.

**12.15 අම්බලන්ගොඩ තානායම් භූමියේ තිබූ කපා ඉවත් කර ඇති අවුරුදු 150 ක් පමණ පැරණි ගස් දෙකෙහි වටිනාකම තීරණය කිරීමට පවත්වන ලද කමිටුවේ වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ තානායම් භූමියේ තිබූ කපා ඉවත් කර ඇති අවුරුදු 150 ක් පමණ පැරණි ගස් දෙකෙහි වටිනාකම තීරණය කිරීමට පවත්වන ලද කමිටු වාර්තවා. එම කමිටු වාර්තාව දී තිබෙනවා. එය මා යෝජනා කරනවා. නිගමනයක් නැහැ. ඒ අනුව කටයුතු කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්</u>**
ගරු සභාපතිතුමනි, මේ කමිටුවේ කිසිම තීරණයකට එලඹිලා නැහැ. එහෙම වාර්තා කරන්න කියන්න.

**තීරණය-**
අම්බලන්ගොඩ තානායම් භූමියේ තිබූ කපා ඉවත් කර ඇති අවුරුදු 150 ක් පමණ පැරණි ගස් දෙකෙහි වටිනාකම තීරණය කිරීමට පවත්වන ලද කමිටුවේ වාර්තාව ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරනවා.

පස්වරු 1.55 ට රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරනවා.

ඩබ්.ඩී.ආර්.ජේ.රුද්‍රිගු මිය
ලේකම්
අම්බලන්ගොඩ - නගර සභාව

අරුණ ප්‍රදිප් මණිමෙල්වඩු
සභාපති
අම්බලන්ගොඩ - නගර සභාව

2020.10.26

වන දින
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදි.